# අ.පො.ස (සා.පෙළ) විභාගය - 2013

# ඇගයීම් වාර්තාව

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

Curriculum
Assessment & Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

# අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2013

## ඇගයීම් වාර්තාව

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

සියලු ම හිමිකම් ඇවිරිණි.

**සිංහල භාෂාව හා සාහිත්‍යය**

ඇගයීම් වාර්තාව - අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2013

**මූල්‍ය අනුග්‍රහය**

අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB) මගිනි.

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ විභාග අතුරින් වැඩි ම අයදුම්කරුවන් සංඛ්‍යාවක් පෙනී සිටින්නේ අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා ය. ජාතික මට්ටමින් පැවැත්වෙන මෙම විභාගයේ ප්‍රතිඵල මත නිකුත් කෙරෙන සහතිකය, උසස් අධ්‍යාපනය සඳහා සුදුස්සන් තෝරා ගැනීමට පමණක් නොව මධ්‍යම මට්ටමේ රැකියා අවස්ථා ලබාගැනීමට ද ජාතික හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල සමහර පාඨමාලා හැදෑරීමට මූලික සුදුසුකමක් ලෙස සැලකෙන මිනුම් දණ්ඩක් වශයෙන් ද පිළිගැනේ. මෙලෙස පිළිගැනෙන්නේ මෙම විභාගයේ ඇති වලංගුතාව හා විශ්වසනීයතාව මෙන් ම ඉහළ ගුණාත්මක බව ද හේතුවෙනි.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. මේ නිසා මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා පුස්තකාලයට යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව කොටස් තුනකින් යුක්ත වන අතර විෂය අභිමතාර්ථ සහ විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද මෙම විෂයයෙහි ප්‍රශ්න පත්‍ර ඇසුරෙන් අයදුම්කරුවන්ගේ සාධනය, එක් එක් ප්‍රශ්නය සඳහා වෙන් වෙන්ව ද මෙහි I කොටසෙහි ඇතුළත් වේ. ඇගයීම් හා පරීක්ෂණ ක්ෂේත්‍රයේ භාවිත වන සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) සහ අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) පදනම් කරගෙන, විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මඟින් මෙම විශ්ලේෂණ සිදුකර ඇත.

සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයයෙහි I, II හා III ප්‍රශ්න පත්‍ර සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටි, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා ප්‍රතිපෝෂණය සඳහා වූ යෝජනාවලින් මෙම වාර්තාවෙහි II කොටස සමන්විත වේ.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

මෙම වාර්තාවේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස ඉල්ලමි. මෙම වාර්තාව සකස් කිරීම සඳහා කැප වූ පාලක පරීක්ෂකවරුන් ඇතුළු සම්පත් දායකයින්ටත් RD ආකෘති මඟින් තොරතුරු සැපයූ ප්‍රධාන/අතිරේක ප්‍රධාන/සහකාර පරීක්ෂකවරුන්ටත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු ම දෙනාටත් මාගේ හෘදයංගම ස්තූතිය පළ කරමි.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
විභාග කොමසාරිස් ජනරාල්

2015 පෙබරවාරි 24
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

| | | |
|---|---|---|
| **උපදේශනය** | : | ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| **සම්බන්ධීකරණය** | : | ඊ. කුලසේකර<br>නියෝජ්‍ය විභාග කොමසාරිස් |
| **සංස්කරණය** | : | මහාචාර්ය රත්න විජේතුංග<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය<br><br>ආචාර්ය ස්වර්ණා ඉහළගම<br>සිංහල අධ්‍යයනාංශය,<br>කැලණිය විශ්ව විද්‍යාලය |
| **සැකසුම් කමිටුව** | : | කුමාර සේනාරත්න<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සිංහල)<br>පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>අනුරාධපුරය<br><br>එම්.පී.පී.එන්. වීරරත්න<br>ගුරු සේවය<br>මහ/කිංස්වුඩ් විද්‍යාලය<br>මහනුවර<br><br>එස්.කේ. පද්මා ඕපාත<br>ගුරු සේවය I<br>කු/ශ්‍රී නිශ්ශංක මහා විද්‍යාලය<br>කුරුණෑගල<br><br>ඊ.ජී. ශ්‍රියානි වසන්තා<br>ගුරු සේවය I<br>ගලගෙදර මධ්‍ය මහා විද්‍යාලය<br>ගලගෙදර |
| **පරිගණක පිටපත සැකසුම** | : | කේ. ඒ. අයි. බණ්ඩාර<br>පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු |

# ඇතුළත පිටු

පිටු අංකය

## I කොටස


1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ 1

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු
1.2.1 විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2
1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2
1.2.3 ප්‍රථම වරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
1.2.4 ප්‍රථම වරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව 4
1.2.5 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 7

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය
1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 8
1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 9
1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 9
1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 10
1.3.5 III ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 11
1.3.6 III ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 11
1.3.7 III ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 12


## II කොටස


2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු
2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 13
2.1.2 I ප්‍රශ්න පත්‍රය 14
2.1.3 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 18
2.1.4 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ (තේමා අනුව) 19
2.1.5 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරාගෙන ඇති ආකාරය (ප්‍රතිශත ලෙස) 20
2.1.6 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 21

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු
2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 24
2.2.2 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය, එම ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, 25
පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන

2.3 III ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු
2.3.1 III ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 39
2.3.2 III ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය, එම ප්‍රශ්නය සඳහා අපේක්ෂිත 39
පිළිතුර, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන


## III කොටස


3. පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා
3.1 පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 54
3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සංවර්ධනය සඳහා අදහස් හා යෝජනා 55

# I කොටස

## 1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.1 විෂය අභිමතාර්ථ

* අවබෝධයෙන් යුතුව ශ්‍රවණය, කථනය, කියවීම, ලිවීම යන චතුර්විධ භාෂා කුසලතා සංවර්ධනය කිරීම
* නිරවුල් ලිඛිත ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා නිවැරදි භාෂා කුසලතා වර්ධනය කිරීම
* විවිධ සාහිත්‍ය කෘති පරිශීලනය කිරීමෙන් ජීවිත පරිඥානය ලබාදීම
* ජීවන වෘත්තීන්ට අදාළ ව භාෂාව ප්‍රායෝගිකව උපයෝගී කර ගැනීමේ කුසලතා වර්ධනය කිරීම
* සිංහල භාෂා සාහිත්‍ය පරිචය මගින් සංස්කෘතික දායාද, ආචාර ධර්ම හා ජීවන දෘෂ්ටි, ආකල්ප හා ඇගයුම පිළිබඳ කුසලතා වර්ධනය කිරීම
* විවිධ සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කිරීමෙන් ලබාගත් අත්දැකීම් ආශ්‍රයෙන් සාහිත්‍ය රසඥතා වර්ධනය හා නිර්මාණකරණය සඳහා යොමු කිරීම

## 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

### 1.2.1 විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

| මාධ්‍යය | පාසල් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 226838 | 9374 | 236212 |

වගුව 1

### 1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පාසල් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 44218 | 19.49 | 482 | 5.14 | 44700 | 18.92 |
| B | 39785 | 17.54 | 887 | 9.46 | 40672 | 17.22 |
| C | 61785 | 27.24 | 2811 | 29.99 | 64596 | 27.35 |
| S | 48887 | 21.55 | 3186 | 33.99 | 52073 | 22.05 |
| W | 32163 | 14.18 | 2008 | 21.42 | 34171 | 14.47 |
| එකතුව | **226838** | **100.00** | **9374** | **100.00** | **236212** | **100.00** |

වගුව 2

### 1.2.3 ප්‍රථම වරට පෙනීසිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 20337 | 6631 | 32.61 | 3347 | 16.46 | 4469 | 21.97 | 3614 | 17.77 | 18061 | 88.81 | 2276 | 11.19 |
| 2. ගම්පහ | 12719 | 3136 | 24.66 | 2047 | 16.09 | 3025 | 23.78 | 2713 | 21.33 | 10921 | 85.86 | 1798 | 14.14 |
| 3. කළුතර | 5831 | 1446 | 24.80 | 925 | 15.86 | 1395 | 23.92 | 1258 | 21.57 | 5024 | 86.16 | 807 | 13.84 |
| 4. මහනුවර | 5167 | 1097 | 21.23 | 818 | 15.83 | 1269 | 24.56 | 1221 | 23.63 | 4405 | 85.25 | 762 | 14.75 |
| 5. මාතලේ | 902 | 98 | 10.86 | 136 | 15.08 | 236 | 26.16 | 306 | 33.92 | 776 | 86.03 | 126 | 13.97 |
| 6. නුවරඑළිය | 1977 | 219 | 11.08 | 215 | 10.88 | 467 | 23.62 | 669 | 33.84 | 1570 | 79.41 | 407 | 20.59 |
| 7. ගාල්ල | 5950 | 1622 | 27.26 | 1036 | 17.41 | 1489 | 25.03 | 1151 | 19.34 | 5298 | 89.04 | 652 | 10.96 |
| 8. මාතර | 3253 | 1102 | 33.88 | 531 | 16.32 | 754 | 23.18 | 608 | 18.69 | 2995 | 92.07 | 258 | 7.93 |
| 9. හම්බන්තොට | 1681 | 413 | 24.57 | 295 | 17.55 | 451 | 26.83 | 389 | 23.14 | 1548 | 92.09 | 133 | 7.91 |
| 10. යාපනය | 2909 | 720 | 24.75 | 498 | 17.12 | 741 | 25.47 | 634 | 21.79 | 2593 | 89.14 | 316 | 10.86 |
| 11. කිලිනොච්චි | 357 | 38 | 10.64 | 50 | 14.01 | 80 | 22.41 | 112 | 31.37 | 280 | 78.43 | 77 | 21.57 |
| 12. මන්නාරම | 311 | 50 | 16.08 | 34 | 10.93 | 73 | 23.47 | 95 | 30.55 | 252 | 81.03 | 59 | 18.97 |
| 13. වව්නියාව | 703 | 159 | 22.62 | 123 | 17.50 | 175 | 24.89 | 169 | 24.04 | 626 | 89.05 | 77 | 10.95 |
| 14. මුලතිව් | 220 | 22 | 10.00 | 31 | 14.09 | 68 | 30.91 | 60 | 27.27 | 181 | 82.27 | 39 | 17.73 |
| 15. මඩකලපුව | 1499 | 373 | 24.88 | 253 | 16.88 | 416 | 27.75 | 353 | 23.55 | 1395 | 93.06 | 104 | 6.94 |
| 16. අම්පාර | 1620 | 287 | 17.72 | 258 | 15.93 | 398 | 24.57 | 463 | 28.58 | 1406 | 86.79 | 214 | 13.21 |
| 17. ත්‍රිකුණාමලය | 1205 | 225 | 18.67 | 189 | 15.68 | 349 | 28.96 | 265 | 21.99 | 1028 | 85.31 | 177 | 14.69 |
| 18. කුරුණෑගල | 3700 | 894 | 24.16 | 708 | 19.14 | 974 | 26.32 | 819 | 22.14 | 3395 | 91.76 | 305 | 8.24 |
| 19. පුත්තලම | 3071 | 664 | 21.62 | 498 | 16.22 | 739 | 24.06 | 794 | 25.85 | 2695 | 87.76 | 376 | 12.24 |
| 20. අනුරාධපුරය | 2376 | 480 | 20.20 | 357 | 15.03 | 629 | 26.47 | 597 | 25.13 | 2063 | 86.83 | 313 | 13.17 |
| 21. පොළොන්නරුව | 1158 | 202 | 17.44 | 186 | 16.06 | 335 | 28.93 | 287 | 24.78 | 1010 | 87.22 | 148 | 12.78 |
| 22. බදුල්ල | 9598 | 1702 | 17.73 | 1816 | 18.92 | 2859 | 29.79 | 1969 | 20.51 | 8346 | 86.96 | 1252 | 13.04 |
| 23. මොනරාගල | 5907 | 868 | 14.69 | 1007 | 17.05 | 1681 | 28.46 | 1263 | 21.38 | 4819 | 81.58 | 1088 | 18.42 |
| 24. රත්නපුරය | 12396 | 2420 | 19.52 | 2359 | 19.03 | 3378 | 27.25 | 2404 | 19.39 | 10561 | 85.20 | 1835 | 14.80 |
| 25. කෑගල්ල | 9059 | 1963 | 21.67 | 1801 | 19.88 | 2548 | 28.13 | 1682 | 18.57 | 7994 | 88.24 | 1065 | 11.76 |
| **සමස්ත දිවයින** | **110682** | **21718** | **19.62** | **20069** | **18.13** | **30491** | **27.55** | **23647** | **21.36** | **95925** | **86.67** | **14757** | **13.33** |

වගුව 3

1.2.4 ප්‍රථම වරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 11593 | 4498 | 38.8 | 2157 | 18.61 | 2300 | 19.84 | 1477 | 12.74 | 10432 | 89.99 | 1161 | 10.01 |
| 2. හෝමාගම | 3598 | 619 | 17.2 | 646 | 17.95 | 911 | 25.32 | 737 | 20.48 | 2913 | 80.96 | 685 | 19.04 |
| 3. ශ්‍රී ජයවර්ධනපුර | 7088 | 1984 | 27.99 | 1487 | 20.98 | 1683 | 23.74 | 1133 | 15.98 | 6287 | 88.70 | 801 | 11.30 |
| 4. පිළියන්දල | 5489 | 1283 | 23.37 | 1158 | 21.1 | 1376 | 25.07 | 949 | 17.29 | 4766 | 86.83 | 723 | 13.17 |
| 5. ගම්පහ | 7029 | 2146 | 30.53 | 1359 | 19.33 | 1636 | 23.28 | 988 | 14.06 | 6129 | 87.20 | 900 | 12.80 |
| 6 මිනුවන්ගොඩ | 4457 | 882 | 19.79 | 832 | 18.67 | 1166 | 26.16 | 901 | 20.22 | 3781 | 84.83 | 676 | 15.17 |
| 7. මීගමුව | 6553 | 1173 | 17.9 | 1176 | 17.95 | 1730 | 26.4 | 1380 | 21.06 | 5459 | 83.31 | 1094 | 16.69 |
| 8. කැලණිය | 6560 | 1323 | 20.17 | 1270 | 19.36 | 1725 | 26.3 | 1205 | 18.37 | 5523 | 84.19 | 1037 | 15.81 |
| 9. කළුතර | 6264 | 1345 | 21.47 | 1078 | 17.21 | 1476 | 23.56 | 1204 | 19.22 | 5103 | 81.47 | 1161 | 18.53 |
| 10. මතුගම | 2901 | 744 | 25.65 | 534 | 18.41 | 731 | 25.2 | 534 | 18.41 | 2543 | 87.66 | 358 | 12.34 |
| 11. හොරණ | 4100 | 1013 | 24.71 | 745 | 18.17 | 1045 | 25.49 | 747 | 18.22 | 3550 | 86.59 | 550 | 13.41 |
| 12. නුවර | 6065 | 2365 | 38.99 | 1189 | 19.6 | 1308 | 21.57 | 739 | 12.18 | 5601 | 92.35 | 464 | 7.65 |
| 13. දෙනුවර | 1381 | 125 | 9.05 | 195 | 14.12 | 422 | 30.56 | 341 | 24.69 | 1083 | 78.42 | 298 | 21.58 |
| 14. ගම්පොළ | 2111 | 261 | 12.36 | 300 | 14.21 | 582 | 27.57 | 532 | 25.2 | 1675 | 79.35 | 436 | 20.65 |
| 15. තෙල්දෙනිය | 1509 | 71 | 4.71 | 207 | 13.72 | 398 | 26.38 | 430 | 28.5 | 1106 | 73.29 | 403 | 26.71 |
| 16. වත්තේගම | 1661 | 231 | 13.91 | 361 | 21.73 | 492 | 29.62 | 350 | 21.07 | 1434 | 86.33 | 227 | 13.67 |
| 17. කටුගස්තොට | 2055 | 297 | 14.45 | 433 | 21.07 | 666 | 32.41 | 397 | 19.32 | 1793 | 87.25 | 262 | 12.75 |
| 18. මාතලේ | 2389 | 608 | 25.45 | 462 | 19.34 | 605 | 25.32 | 439 | 18.38 | 2114 | 88.49 | 275 | 11.51 |
| 19. ගලේවෙල | 1810 | 149 | 8.23 | 282 | 15.58 | 531 | 29.34 | 447 | 24.7 | 1409 | 77.85 | 401 | 22.15 |
| 20. නාඋල | 419 | 43 | 10.26 | 72 | 17.18 | 117 | 27.92 | 97 | 23.15 | 329 | 78.52 | 90 | 21.48 |
| 21. විල්ගමුව | 511 | 39 | 7.63 | 76 | 14.87 | 161 | 31.51 | 112 | 21.92 | 388 | 75.93 | 123 | 24.07 |
| 22. නුවරඑළිය | 684 | 88 | 12.87 | 93 | 13.6 | 197 | 28.8 | 180 | 26.32 | 558 | 81.58 | 126 | 18.42 |
| 23. කොත්මලේ | 728 | 133 | 18.27 | 157 | 21.57 | 210 | 28.85 | 140 | 19.23 | 640 | 87.91 | 88 | 12.09 |
| 24. හැටන් | 745 | 97 | 13.02 | 130 | 17.45 | 249 | 33.42 | 163 | 21.88 | 639 | 85.77 | 106 | 14.23 |
| 25. වලපනේ | 837 | 89 | 10.63 | 138 | 16.49 | 258 | 30.82 | 194 | 23.18 | 679 | 81.12 | 158 | 18.88 |
| 26. හඟුරන්කෙත | 1523 | 261 | 17.14 | 255 | 16.74 | 393 | 25.8 | 383 | 25.15 | 1292 | 84.83 | 231 | 15.17 |
| 27. ගාල්ල | 6719 | 1864 | 27.74 | 1358 | 20.21 | 1611 | 23.98 | 1081 | 16.09 | 5914 | 88.02 | 805 | 11.98 |
| 28. ඇල්පිටිය | 2907 | 392 | 13.48 | 525 | 18.06 | 864 | 29.72 | 654 | 22.5 | 2435 | 83.76 | 472 | 16.24 |
| 29. අම්බලන්ගොඩ | 3346 | 645 | 19.28 | 590 | 17.63 | 835 | 24.96 | 636 | 19.01 | 2706 | 80.87 | 640 | 19.13 |
| 30. උඩුගම | 1689 | 196 | 11.6 | 299 | 17.7 | 512 | 30.31 | 394 | 23.33 | 1401 | 82.95 | 288 | 17.05 |
| 31. මාතර | 4695 | 1469 | 31.3 | 895 | 19.07 | 1096 | 23.35 | 744 | 15.83 | 4204 | 89.54 | 491 | 10.46 |
| 32. අකුරැස්ස | 1741 | 304 | 17.46 | 346 | 19.87 | 500 | 28.72 | 376 | 21.6 | 1526 | 87.65 | 215 | 12.35 |
| 33. මුලටියන-හක්මන | 1843 | 225 | 12.21 | 381 | 20.67 | 572 | 31.04 | 384 | 20.84 | 1562 | 84.75 | 281 | 15.25 |
| 34. මොරවක-දෙනියාය | 2081 | 338 | 16.24 | 366 | 17.59 | 631 | 30.32 | 457 | 21.96 | 1792 | 86.11 | 289 | 13.89 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 35. තංගල්ල | 2195 | 452 | 20.59 | 430 | 19.59 | 563 | 25.65 | 414 | 18.86 | 1859 | 84.69 | 336 | 15.31 |
| 36. හම්බන්තොට | 3326 | 461 | 13.86 | 521 | 15.66 | 937 | 28.17 | 757 | 22.76 | 2676 | 80.46 | 650 | 19.54 |
| 37. වලස්මුල්ල | 2331 | 527 | 22.61 | 473 | 20.29 | 654 | 28.06 | 406 | 17.42 | 2060 | 88.37 | 271 | 11.63 |
| 38. යාපනය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 39. දූපත් | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 40. තෙන්මාරච්චි | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 41. වලිකාමම් | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 42. වඩමරච්චි | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 43. කිලිනොච්චි | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 44. මන්නාරම | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 45. මඩු | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 46. වව්නියාව | 182 | 20 | 10.99 | 37 | 20.33 | 42 | 23.08 | 42 | 23.08 | 141 | 77.47 | 41 | 22.53 |
| 47. වව්නියාව උතුර | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 48. මුලතිව් | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 49. තුනුක්කායි | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 50. මඩකලපුව | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 51. කල්කුඩා | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 52. පදිරිප්පු | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 53. මඩකලපුව මධ්‍යම | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 54. අම්පාර | 2242 | 356 | 15.88 | 416 | 18.55 | 618 | 27.56 | 491 | 21.9 | 1881 | 83.90 | 361 | 16.10 |
| 55. කල්මුනේ | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0.00 | 1 | 100.00 |
| 56. සමන්තුරෙයි | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 57. මහඔය | 510 | 49 | 9.61 | 70 | 13.73 | 147 | 28.82 | 136 | 26.67 | 402 | 78.82 | 108 | 21.18 |
| 58. දෙහිඅත්තකණ්ඩිය | 1010 | 64 | 6.34 | 146 | 14.46 | 316 | 31.29 | 264 | 26.14 | 790 | 78.22 | 220 | 21.78 |
| 59. තිරුක්කෝවිල් | 3 | 0 | 0 | 0 | 0 | 1 | 33.33 | 0 | 0 | 1 | 33.33 | 2 | 66.67 |
| 60. අක්කරෙයිපත්තුව | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 61. ත්‍රිකුණාමලය | 332 | 59 | 17.77 | 63 | 18.98 | 107 | 32.23 | 57 | 17.17 | 286 | 86.14 | 46 | 13.86 |
| 62. මුතූර් | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 50 | 1 | 50.00 | 1 | 50.00 |
| 63. කන්තලේ | 743 | 82 | 11.04 | 109 | 14.67 | 218 | 29.34 | 179 | 24.09 | 588 | 79.14 | 155 | 20.86 |
| 64. ත්‍රිකුණාමලය (උතුර) | 342 | 18 | 5.26 | 33 | 9.65 | 86 | 25.15 | 111 | 32.46 | 248 | 72.51 | 94 | 27.49 |
| 65. කින්නියා | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 66. කුරුණෑගල | 4934 | 1337 | 27.1 | 1035 | 20.98 | 1318 | 26.71 | 793 | 16.07 | 4483 | 90.86 | 451 | 9.14 |
| 67. කුලියාපිටිය | 3405 | 736 | 21.62 | 710 | 20.85 | 1072 | 31.48 | 601 | 17.65 | 3119 | 91.60 | 286 | 8.40 |
| 68. නිකවැරටිය | 2438 | 473 | 19.4 | 515 | 21.12 | 791 | 32.44 | 464 | 19.03 | 2243 | 92.00 | 195 | 8.00 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 69. මහව | 3199 | 384 | 12 | 572 | 17.88 | 1039 | 32.48 | 764 | 23.88 | 2759 | 86.25 | 440 | 13.75 |
| 70. ගිරිඋල්ල | 3033 | 469 | 15.46 | 642 | 21.17 | 915 | 30.17 | 598 | 19.72 | 2624 | 86.52 | 409 | 13.48 |
| 71. ඉබ්බාගමුව | 2328 | 450 | 19.33 | 456 | 19.59 | 614 | 26.37 | 517 | 22.21 | 2037 | 87.50 | 291 | 12.50 |
| 72. පුත්තලම | 2553 | 299 | 11.71 | 412 | 16.14 | 756 | 29.61 | 614 | 24.05 | 2081 | 81.51 | 472 | 18.49 |
| 73. හලාවත | 4819 | 1014 | 21.04 | 987 | 20.48 | 1349 | 27.99 | 969 | 20.11 | 4319 | 89.62 | 500 | 10.38 |
| 74. අනුරාධපුරය | 3862 | 974 | 25.22 | 745 | 19.29 | 936 | 24.24 | 660 | 17.09 | 3315 | 85.84 | 547 | 14.16 |
| 75. තඹුත්තේගම | 2028 | 283 | 13.95 | 420 | 20.71 | 663 | 32.69 | 401 | 19.77 | 1767 | 87.13 | 261 | 12.87 |
| 74. කැකිරාව | 1917 | 289 | 15.08 | 350 | 18.26 | 520 | 27.13 | 414 | 21.6 | 1573 | 82.06 | 344 | 17.94 |
| 75. ගලෙන්බිඳුණුවැව | 1345 | 177 | 13.16 | 218 | 16.21 | 393 | 29.22 | 316 | 23.49 | 1104 | 82.08 | 241 | 17.92 |
| 76. කැබිතිගොල්ලෑව | 1506 | 192 | 12.75 | 297 | 19.72 | 419 | 27.82 | 354 | 23.51 | 1262 | 83.80 | 244 | 16.20 |
| 77. පොළොන්නරුව | 1355 | 265 | 19.56 | 259 | 19.11 | 355 | 26.2 | 262 | 19.34 | 1141 | 84.21 | 214 | 15.79 |
| 78. හිඟුරක්ගොඩ | 2061 | 298 | 14.46 | 370 | 17.95 | 604 | 29.31 | 432 | 20.96 | 1704 | 82.68 | 357 | 17.32 |
| 79. දිඹුලාගල | 1319 | 112 | 8.49 | 215 | 16.3 | 403 | 30.55 | 312 | 23.65 | 1042 | 79.00 | 277 | 21.00 |
| 80. බදුල්ල | 2656 | 476 | 17.92 | 548 | 20.63 | 798 | 30.05 | 519 | 19.54 | 2341 | 88.14 | 315 | 11.86 |
| 81. බණ්ඩාරවෙල | 2335 | 626 | 26.81 | 450 | 19.27 | 661 | 28.31 | 414 | 17.73 | 2151 | 92.12 | 184 | 7.88 |
| 82. මහියංගනය | 1891 | 232 | 12.27 | 315 | 16.66 | 526 | 27.82 | 437 | 23.11 | 1510 | 79.85 | 381 | 20.15 |
| 83. වැලිමඩ | 2134 | 297 | 13.92 | 414 | 19.4 | 661 | 30.97 | 471 | 22.07 | 1843 | 86.36 | 291 | 13.64 |
| 84. පස්සර | 582 | 71 | 12.2 | 89 | 15.29 | 213 | 36.6 | 128 | 21.99 | 501 | 86.08 | 81 | 13.92 |
| 85. මොනරාගල | 1885 | 259 | 13.74 | 340 | 18.04 | 550 | 29.18 | 401 | 21.27 | 1550 | 82.23 | 335 | 17.77 |
| 86. වැල්ලවාය | 2665 | 377 | 14.15 | 420 | 15.76 | 780 | 29.27 | 580 | 21.76 | 2157 | 80.94 | 508 | 19.06 |
| 87. බිබිල | 1357 | 232 | 17.1 | 247 | 18.2 | 351 | 25.87 | 282 | 20.78 | 1112 | 81.95 | 245 | 18.05 |
| 88. රත්නපුර | 5141 | 1365 | 26.55 | 972 | 18.91 | 1290 | 25.09 | 880 | 17.12 | 4507 | 87.67 | 634 | 12.33 |
| 89. බලන්ගොඩ | 2254 | 350 | 15.53 | 437 | 19.39 | 630 | 27.95 | 467 | 20.72 | 1884 | 83.58 | 370 | 16.42 |
| 90. නිවිතිගල | 2021 | 295 | 14.6 | 444 | 21.97 | 599 | 29.64 | 384 | 19 | 1722 | 85.21 | 299 | 14.79 |
| 91. ඇඹිලිපිටිය | 2980 | 410 | 13.76 | 506 | 16.98 | 859 | 28.83 | 673 | 22.58 | 2448 | 82.15 | 532 | 17.85 |
| 92. කෑගල්ල | 3892 | 1205 | 30.96 | 787 | 20.22 | 941 | 24.18 | 604 | 15.52 | 3537 | 90.88 | 355 | 9.12 |
| 93. මාවනැල්ල | 2629 | 401 | 15.25 | 503 | 19.13 | 799 | 30.39 | 532 | 20.24 | 2235 | 85.01 | 394 | 14.99 |
| 94. දෙහිඕවිට | 2538 | 357 | 14.07 | 511 | 20.13 | 808 | 31.84 | 546 | 21.51 | 2222 | 87.55 | 316 | 12.45 |
| **සමස්ත දිවයින** | **207362** | **44093** | **21.26** | **39036** | **18.83** | **55291** | **26.66** | **39572** | **19.08** | **177992** | **85.84** | **29370** | **14.16** |

වගුව 4

### 1.2.5 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව


| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 216 | 0.09 | 236055 | 100.00 |
| 81 - 90 | 12909 | 5.47 | 235839 | 99.91 |
| 71 - 80 | 35299 | 14.95 | 222930 | 94.44 |
| 61 - 70 | 42307 | 17.92 | 187631 | 79.49 |
| 51 - 60 | 44668 | 18.92 | 145324 | 61.56 |
| 41 - 50 | 39141 | 16.58 | 100656 | 42.64 |
| 31 - 40 | 29964 | 12.69 | 61515 | 26.06 |
| 21 - 30 | 17978 | 7.62 | 31551 | 13.37 |
| 11 - 20 | 9745 | 4.13 | 13573 | 5.75 |
| 01 - 10 | 3827 | 1.62 | 3828 | 1.62 |
| 00 - 00 | 1 | 0.00 | 1 | 0.00 |

වගුව 5

ඉහත වගුවට අනුව සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් 241124 අතුරෙන් 31 - 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබාගත් සංඛ්‍යාව 27770 කි. එය ප්‍රතිශතයක් වශයෙන් 11.52% කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 62124 ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 25.76% කි.

### 1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය


#### 1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 1 (RD/16/05/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයට අනුව අයදුම්කරුවන් වැඩිම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ අංක 3 ප්‍රශ්නයටයි. එම ප්‍රතිශතය 88% කි. එමෙන්ම අයදුම්කරුවන් අඩුම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ අංක 6 ප්‍රශ්නයටයි. එම ප්‍රතිශතය 16% කි


### 1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය




මෙම ප්‍රශ්න පත්‍රයෙහි සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. එහෙත් මෙම ප්‍රස්තාරයට අනුව, වැඩිම සංඛ්‍යාවක් පිළිතුරු සපයනු ලැබූ අංක 1 ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් 98%ක් පිළිතුරු සපයා තිබූ අතර අඩුම සංඛ්‍යාවක් පිළිතුරු සපයනු ලැබූ අංක 5 ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා තිබුණේ අයදුම්කරුවන්ගෙන් 92%ක් පමණි.

ප්‍රස්තාරය 2 (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

### 1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය





අංක 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු 20න්, මෙම ප්‍රස්තාරයට අනුව, 76% - 100% ප්‍රාන්තරයේ එනම් ලකුණු 16 සිට 20 තෙක් ලබා ගත් ප්‍රතිශතය 9% කි. එමෙන්ම වෙන් කර ඇති ලකුණු 20න් 0% - 25% ප්‍රාන්තරයෙහි එනම් ලකුණු 0 සිට 5 තෙක් ලබාගත් ප්‍රතිශතය 31% කි.

ප්‍රස්තාරය 3 (RD/16/04/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

වඩාත් කැපී පෙනෙන ලෙස ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබාගැනීමට අයදුම්කරුවන්ට හැකිවී ඇත්තේ 4 වන ප්‍රශ්නය සඳහායි. එම ප්‍රශ්නය සඳහා හිමි මුළු ලකුණු 10න් ලකුණු 8ක් හෝ ඊට වැඩියෙන් හෝ ලබා ඇති අයදුම්කරුවන් ප්‍රතිශතය 77%ක් පමණ වේ. එනම් මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයූ අයදුම්කරුවන්ගෙන් හතරෙන් තුනකටත් වැඩි ප්‍රමාණයක්ම, ලකුණු 8ක් හෝ ඊට වැඩියෙන් හෝ ලබාගෙන ඇත.


1.3.4 **II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය**




ප්‍රස්තාරය 4 (RD/16/04/OL පෝර්මයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයට අනුව, අංක 1 ප්‍රශ්නයෙහි i කොටසෙහි පහසුතාව 71%කි. වැඩිම පහසුතාව ඇත්තේ අංක 4 ප්‍රශ්නයේ (v) කොටසටයි. එහි පහසුතාව 97%කි. එමෙන්ම අඩුම පහසුතාව ඇත්තේ අංක 1 ප්‍රශ්නයේ (iv) (ආ) අනුකොටසටයි. එහි පහසුතා 5%ක් පමණි.

### 1.3.5 III ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය





මෙහි මුල් ප්‍රශ්න හතරට පිළිතුරු සැපයීම අනිවාර්ය වුව ද මෙම ප්‍රස්තාරයට අනුව, අංක 1 ප්‍රශ්නය සඳහා 98%ක් ද අංක 4 ප්‍රශ්නය සඳහා 79%ක් ද පමණක් පිළිතුරු සපයා ඇත. අංක 5, 6, 7 ප්‍රශ්න අතුරෙන් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතු අතර අංක 5 ප්‍රශ්නය සඳහා 29% ක් ද අංක 6 ප්‍රශ්නය සඳහා 40%ක් ද අංක 7 ප්‍රශ්නය සඳහා 23%ක් ද පිළිතුරු සපයා ඇත.

එම ප්‍රශ්න තුන අතුරෙන් අංක 6 ප්‍රශ්නය තෝරා ගනු ලැබීම සඳහා සෑම වර්ෂයකම පාහේ වැඩි නැඹුරුවක් දක්නට ලැබෙන අතර එම ප්‍රශ්නයට පදනම් වන විෂය ක්ෂේත්‍රය අපේක්ෂකයන්ට වඩාත් සමීපවීම ඊට හේතුව විය හැකිය.

ප්‍රස්තාරය 5 (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

### 1.3.6 III ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය





ප්‍රස්තාරය 6 (RD/16/04/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

අංක 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු 20න්, මෙම ප්‍රස්තාරයට අනුව, 76% - 100% ප්‍රාන්තරයේ එනම් ලකුණු 16 සිට 20 තෙක් ලබා ගත් ප්‍රතිශතය 20% කි. එමෙන්ම වෙන් කර ඇති ලකුණු 20න් 0% - 25% ප්‍රාන්තරයෙහි එනම් ලකුණු 0 සිට 5 තෙක් ලබාගත් ප්‍රතිශතය 23% කි.

අයදුම්කරුවන්ට කැපී පෙනෙන ලෙස ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබාගැනීමට හැකිවී ඇත්තේ 6 වන ප්‍රශ්නය සඳහා ය. එම ප්‍රශ්නය සඳහා හිමි මුළු ලකුණු 20න්, ලකුණු 15 හෝ ඊට වැඩියෙන් ලබා ඇති ප්‍රතිශතය 50%ක් පමණ වේ. එනම් 6 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයූ අයදුම්කරුවන්ගෙන් හරි අඩක්ම ලකුණු 15 හෝ ඊට වැඩියෙන් ලබා ඇත.

1.3.6 III ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 7 (RD/16/04/OL පෝර්මයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

ඉහත ප්‍රස්තාරයට අනුව, අංක 1 ප්‍රශ්නයෙහි 1 (අ) කොටසෙහි පහසුතාව 91%කි. වැඩිම පහසුතාව ඇත්තේ අංක 4 ප්‍රශ්නයේ (i) කොටසටයි. පහසුතාව 95%ක් වේ. එමෙන්ම අඩුම පහසුතාව ඇත්තේ අංක 1 ප්‍රශ්නයේ (iii)(ආ) අනුකොටසටයි. එහි පහසුතාව 7%ක් පමණි.

## II කොටස

## 2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### ප්‍රශ්න පත්‍රවල ස්වභාවය

අ. පො. ස. (සා. පෙළ) විභාගයෙහි (21) සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයයෙහි ශිෂ්‍ය සාධනය ඇගයීම සඳහා ප්‍රශ්න පත්‍ර තුනක් ඉදිරිපත් කෙරේ. ඒවා අතුරින් I පත්‍රය සහ II පත්‍රය යන ප්‍රශ්න පත්‍ර දෙකම අපේක්ෂකයින්ට එක වර දෙනු ලබන අතර එම පත්‍ර දෙකම සඳහා නියමිත කාලය පැය තුනකි. සිංහල සාහිත්‍යය ආශ්‍රිත කුසලතා මැනීම සඳහා වෙනම දෙනු ලබන III පත්‍රය සඳහා නියමිත කාලය පැය දෙකකි.

**අවසාන ලකුණු ගණනය කිරීම**

| | | | | |
|---|---|---|---|---|
| I | පත්‍රය සඳහා | - | ලකුණු | 40 |
| II | පත්‍රය සඳහා | - | ලකුණු | 80 |
| III | පත්‍රය සඳහා | - | ලකුණු | 80 |
| | එකතුව | - | ලකුණු | 200 |

අවසාන ලකුණ - 200 ÷ 2 = 100

## 2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

* මුළු ලකුණු 40 කි.
* වරණ හතර බැගින් ඇති බහුවරණ ප්‍රශ්න 40 කින් සමන්විත වේ. එම එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3) හා (4) වරණවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ වරණය තේරීම අපේක්‍ෂා කෙරේ.
* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයීම අපේක්ෂිත ය.
* සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයය යටතේ,
  භාෂා කුසලතා,
  ව්‍යාකරණ භාවිතය පිළිබඳ කුසලතා,
  භාෂා සාහිත්‍යය පිළිබඳ කුසලතා සහ
  විශ්ලේෂණය හා අවබෝධය පිළිබඳ කුසලතා මැන බැලීමේ අරමුණින් මෙම බහුවරණ ප්‍රශ්න 40 සකස් කර ඇත.

2.1.2 **I ප්‍රශ්න පත්‍රය**

- අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තදකළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට **වඩාත් සමීප අර්ථය** දෙන වචනය තෝරන්න.

1. **අත හයිය නම් බත නොවරදින බව** පැවසුවෝ පුරාණ පඬිවරු ය.
   (1) සිහමන් ඉල්ලීමෙන් ආහාර ලැබෙන බව (2) කුඹුරු කෙටූ කල බත් ලැබෙන බව
   (3) වැඩ කිරීමෙන් ලාභ උපයාගත හැකි බව (4) උත්සාහය ඇත්නම් ජයගත හැකි බව

2. තම මිතුරාගේ **බත්පතට වැලි දැමීම** නොකළ යුතුව තිබුණු දෙයක් බව ඔහුට අවබෝධ වන විට බොහෝ කල් ඉකුත්ව තිබුණේ ය.
   (1) ආහාරය අනුභව කළ නොහැකි තත්ත්වයට පත් කිරීම
   (2) ලැබෙන්නට ගිය ලාභයට හානි කිරීම
   (3) අපහසුතාවට පත් කිරීම
   (4) කළ උපකාර අමතක කර දැමීම

3. අකලංකට **සෙනසුරා ලබා** ඇතැයි ඔහුගේ මිතුරෝ පවසති.
   (1) යහපත් කාලයක් උදා වී (2) මංගල යෝජනාවක් ලැබී
   (3) අයහපත් කාලයක් උදා වී (4) මානසික කම්පනයට පත් වී

- අංක **4** සිට **6** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට **වඩාත් සුදුසු** පදය තෝරන්න.

4. අන් අයගේ අදහස්වලට සවන් නොදී ..................... ක්‍රියා කිරීම යහපත් ගුණාංගයක් නො වේ.
   (1) අත්තනෝමතික ව (2) පරාර්ථකාමී ව
   (3) නිද්‍රාශීලී ව (4) ඊර්ෂ්‍යාපරවශ ව

5. ගරු මර්සිලින් ජයකොඩි පියතුමා සියලු දෙනාගේ ගෞරවාදරයට පාත්‍ර වූ ..................... කිතුනු පියතුමෙකි.
   (1) අනභිභවනීය (2) සම්මානනීය
   (3) ප්‍රහර්ෂණීය (4) අතිරමණීය

6. සාහිත්‍ය පොතපතට ..................... වුණු පුද්ගලයා දැනුම් කෝෂ්ඨාගාරයකි.
   (1) ආසක්ත (2) විනිර්මුක්ත
   (3) වියුක්ත (4) සංයුක්ත

7. අකාරාදී පිළිවෙළ **නිවැරදි ව** යෙදී ඇති පද පේළිය තෝරන්න.
   (1) නිලය, නිවටයා, නිවස, නිර්මල (2) කැලල, කැවුම්, කැපීම, කැලය
   (3) පදය, පදිංචිය, පහන, පරතරය (4) විධානය, විනය, විනීත, විපරම

8. අර්ථ හීන කොටසක් සහිත යුගල පදයක් යෙදී ඇති වාක්‍යය තෝරන්න.
   (1) වට්ටිපෙට්ටි රැගෙන සියල්ලෝ ම වාහනයට නැඟ ගත්හ.
   (2) වැඩිපුර මුදල්හදල් ඇති අයට කරදර ද වැඩි ය.
   (3) හොඳ සිරිත්විරිත් පුරුදු කිරීම යහපත් දරුවන්ගේ ලක්ෂණයකි.
   (4) පොතපත කියවීමෙන් ඥානය වැඩි වේ.

9. ඉස්පිල්ල, පාපිල්ල, ඇදය සහ ඇලපිල්ල යන **පිල්ලම්** පිළිවෙළින් **නිවැරදි ව** යෙදී ඇති වචන පේළිය තෝරන්න.
   (1) චින්තනය, සරුංගලය, කාලය, නැව (2) කිරි, තුලා, පැහැපත්, සාරවත්
   (3) සිසිල, රුවල, කාලය, භාවනාව (4) විස්තෘත, නුවණ, තරුව, සැපවත්

- අංක **10** සහ **11** ප්‍රශ්නවල සෑම පදයක ම අක්ෂර වින්‍යාසය **නිවැරදි ව** යෙදී ඇති වරණය තෝරන්න.

10. (1) ත්‍යාග ප්‍රධානය, දිළිඳු, පිළියෙල, ඥාණය
    (2) ජනගහණය, ස්ථිරසාර, අධිගෘහීත, නිළඹර
    (3) අබිෂේක, පිළිසකර, වැඩමුලුව, ළෙන්ගතු
    (4) ප්‍රාර්ථනාර්ථය, නිශ්චල, කනිෂ්ඨ, ජ්‍යොතිශ්ශාස්ත්‍රය

11. (1) අභිවෘද්ධිය, මාධූර්‍යය, ළැදියාව, පිළිබිඹුව (2) පසළොස්වක, ප්‍රත්‍යක්ෂ, ශාස්ත්‍රධරත්වය, අභිලාෂය
    (3) දෘෂ්ටිගෝචර, ධර්මිෂ්ට, ඓක්‍යය, ව්‍යවස්තාව (4) පරිකථා, අත්‍යුත්කර්ෂවත්, භක්ත්‍යාධරය, ව්‍යංගාර්ථය

12. විරාම ලකුණු **නිවැරදි ව** යෙදුණු වාක්‍යය තෝරන්න.
(1) කුඩා ව්‍යාපාර සඳහා, බැංකු පහසුකම් ලබා දෙමු!
(2) ප:ව: 3.00 ට රැස්වීම, පැවැත්වෙන බව, සභාපතිතුමා දැන්වී ය.
(3) අහෝ ? ඔහුට යන්න; කියන්න!
(4) 'පුලතිසිපුර' යනු පොළොන්නරුවට අතීතයේ යෙදුණු නාමය යි.

13. **සමානාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) අශ්ව - තුරඟ, ගජ, හය, සෛන්ධව
(2) ස්වර්ණ - හේම, කාංචන, රන්, කනක
(3) ලෝකය - ජගත්, දිය, ලෝ, ලෙව්
(4) සඳ - සිසි, කලාපති, සොම්, හිමකර

14. **විරුද්ධාර්ථයක් දෙන** පදයක් සහිත පද පේළිය තෝරන්න.
(1) ප්‍රවීණ - ඡේක, දක්ෂ, නිපුණ, විචක්ෂණ
(2) තිර - අචල, නිසල, නිශ්චල, නොසැලෙන
(3) අඥාන - දද, මුග්ධ, විදග්ධ, මූඪ
(4) දිශාව - පාර්ශ්වය, දිග, පස, දෙස

- අංක **15** සිට **18** තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

15. ජනතාවක් සතු ගීත කලාවක් තිබීමෙන් **ගම්‍යමාන වන්නේ** ඔවුන් සතුව ශ්‍රේෂ්ඨ සාහිත්‍යයක් තිබූ බවයි.
(1) හැඟෙන්නේ (2) උත්පාදනය වන්නේ (3) දෘශ්‍යමාන වන්නේ (4) ඉස්මතු වන්නේ

16. ඉකුත් දශක දෙක තුළ සිංහල ගීතය **භාවපූර්ණ** සුනිශිත සාහිත්‍ය නිර්මාණයක් බවට පත් විය.
(1) අර්ථ සපිරුණු (2) හැඟීම්වලින් සපිරුණු (3) රසයෙන් සපිරුණු (4) ශබ්ද හා අර්ථවලින් සපිරුණු

17. ඔහු ඉදිරිපත් කළේ **ප්‍රතිෂ්ඨා විරහිත** කරුණු සමුදායකි.
(1) හේතු සාධක නොමැති
(2) විශ්වාස කළ නොහැකි
(3) අදාළ නැති
(4) ප්‍රත්‍යක්ෂ නැති

18. ලංකාවේ **පුරාකෘත** නිර්මාණ අභිමානවත් ඉතිහාසයකට සාක්ෂි සපයයි.
(1) කෘතිවලින් පිරුණ (2) ඓතිහාසික (3) පෙර කරන ලද (4) පුරා විද්‍යාත්මක

- අංක **19** ප්‍රශ්නයේ **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටස වෙනුවට යෙදිය හැකි වඩාත් ගැළපෙන තනි පදය තෝරන්න.

19. ශ්‍රමදානය සඳහා ගම්වැසියන් එකතු වූයේ **කිසිවකුගේ බල කිරීමකින් තොරව** ය.
(1) ස්වෝත්සාහයෙන් (2) ස්වේච්ඡාවෙන් (3) පරාර්ථකාමිත්වයෙන් (4) නිරායාසයෙන්

20. 'අතීතයේ සිට ම බොහෝ පිරිස් දේශගවේෂණයේ යෙදී ඇති බවට ඓතිහාසික මූලාශ්‍රය සාක්ෂි දරයි' යන වාක්‍යයේ ඇතුළත් තද්ධිත පදය වන්නේ
(1) අතීතයේ (2) දේශගවේෂණයේ (3) ඓතිහාසික (4) සාක්ෂි

21. වැරදි අදහස දෙන වරණය තෝරන්න.
(1) 'දුශ්චරිත' යන වචනයේ 'දුශ්' යනු උපසර්ගයකි.
(2) 'යළි' යනු අවධාරණාර්ථයේ නිපාත පදයකි.
(3) පංකජ යනු නෙළුම්මලට පර්යාය පදයකි.
(4) ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය කොළඹ දී විවෘත කෙරෙයි යනු කර්ම කාරක වාක්‍යයකි.

22. 'නටයි' යන ක්‍රියා පදයේ **උත්තම පුරුෂ, අතීත කාල, බහු වචන** රූපය ඇතුළත් වරණය තෝරන්න.
(1) නැටීය (2) නැටූහ (3) නැටූහු (4) නැටුමු

23. 'වහා එන්න' යන වාක්‍යයේ '**වහා**' යනු
(1) ක්‍රියා විශේෂණ නිපාතයකි.
(2) සීමාව හැඟවීමේ නිපාතයකි.
(3) ආමන්ත්‍රණය හඟවන නිපාතයකි.
(4) පද සම්බන්ධ කිරීමේ නිපාතයකි.

24. 'සුමිහිරි' යන පදයේ '**සු**' යන උපසර්ගය
(1) පදයේ අර්ථය වෙනස් කරයි.
(2) පදයට විරුද්ධ අර්ථයක් ගෙන දෙයි.
(3) පදයේ අර්ථය අනුව ම පවතී.
(4) පදයේ අර්ථය වැඩි කරයි.

25. මුලින් දැක්වෙන පදය නිවැරදි ලෙස **විසන්ධි** කර ඇති වරණය තෝරන්න.

(1) අත්‍යන්ත - අති + අන්ත
(2) බුදුකුරු - බුදු + කුරු
(3) මිහින්තල - මිහින් + තල
(4) අත්‍යවශ්‍යතාව - අත්‍ය + අවශ්‍යතාව

- අංක **26** සිට **28** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශනයෙහි අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

26. නිෂ්ඵල උත්සාහයක් දැරීම

(1) කතාව දෝලාවෙන් ගමන පයින්
(2) බීරි අලින්ට වීණා ගායනා කිරීම
(3) විද්දේ හාවට වැදුණේ පඳුරට
(4) වත්ත බද්දට දී ඇස්සට දත නියවීම

27. යම් කාර්යයක් ඕනෑවට එපාවට කිරීම

(1) මෝල්ගස් ගිලපු පිඹුරා වගේ
(2) උගුඩුවා ඇට් කෙහෙල් කෑවා වගේ
(3) ලෙඩ කපුටා වැල කනවා වගේ
(4) හිඟන්නගේ පාත්තරේ හෙනහුරා වැටුණා වගේ

28. අකැමැත්තෙන් යම්කිසි කාර්යයක් සිදු කිරීම

(1) ඉබ්බාගෙන් පිහාටු ඉල්ලනවා වගේ
(2) අතු කඩා මොර කන්නා වගේ
(3) හිල් කුඩෙන් වතුර අදිනවා වගේ
(4) උගුරට හොරා බේත් කනවා වගේ

- අංක **29** සිට **31** තෙක් ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූලව නිවැරදි** වාක්‍යය තෝරන්න.

29.
(1) පොත් කියවන්නෝ ලෝකය දිනන්නෝ ය.
(2) ඔහු දක්ෂ ඉංජිනේරුවකු වෙයි.
(3) දිරිය දරුවන් සැමගේ ප්‍රශංසාව ලබයි.
(4) ධාරාතිපාත වර්ෂාවත් සමඟ ජලාශයෝ පිරී ඉතිරී යයි.

30.
(1) මා මිතුරන් හෙවත් ඔවුහු මට උදව් කරති.
(2) සියලු මිනිස්සු යහපත් පුද්ගලයෝ ද?
(3) පෙදරේරුවෝ ගොඩනැගිල්ල නිමා කරාවි.
(4) පාරේ වැඩට කම්කරුවෝ පැමිණ ඇත.

31.
(1) පියා නොහොත් මම මංගල උත්සවයට සහභාගි වන්නෙමු.
(2) පාසල් ළමයින් සඳහා ලියවුණු පොත් රාශියක් ඇත.
(3) දක්ෂ ලේඛිකාවක් වන්නේ කෙසේ ද?
(4) නාවිකයෝ වෙරළට පැමිණෙනු ඇත.

32. තරුපති යන පදය අයත් වන්නේ,

(1) අව්‍යය සමාසයටයි
(2) විශේෂණ සමාසයටයි
(3) විභක්ති සමාසයටයි
(4) අන්‍යාර්ථ සමාසයටයි

33. උපමාවක් ඇතුළත් කවි පදය තෝරන්න.

(1) ලෙළ දුන් නව තඹ පලු වන් නාදේ
(2) තබමින් නිවරද මද්දල නාදේ
(3) ගයමින් පාතා ගීයෙන් කීදේ
(4) අහනන් රහ දුටුවන් සිත පෑදේ

- අංක **34** සිට **36** තෙක් ඇති ප්‍රශ්නවල මුලින් ඉදිරිපත් කර ඇති පාඨ සඳහා වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

34. නූතන ජනගහන වර්ධන වේගය අනුව පෘථිවි තලය මත ඇති ආහාර නිෂ්පාදන ශක්තිය කොතෙක් දුරට මරොත්තු දේ දැයි යන්න ලෝපුරා විශේෂඥයින්ගේ හිස අවුල් කරවන ගැටලුවක් බවට පත් වී ඇත.

(1) ජනගහන වර්ධන වේගය ගැන සලකන විට පෘථිවියේ ඇති ආහාර නිපදවීමේ හැකියාව ඊට සෑහේ ද යන්න ලෝපුරා විශේෂඥයින්ගේ හිස අවුල් කරවන ගැටලුවක් බවට පත් වී ඇත.
(2) ජනගහන වර්ධන වේගයට සාපේක්ෂව මහපොළොව සතු ආහාර නිපදවීමේ හැකියාව අඩු වීම ලෝපුරා සිටින විශේෂඥයින්ගේ සුවිශේෂ අවධානය යොමු වී ඇති කරුණකි.
(3) ජනගහන වර්ධන වේගයත් සමඟ මහපොළොවේ ආහාර නිපදවීමේ හැකියාව අඩු වීමෙන් ඇති වන ආහාර හිඟය ලෝපුරා සිටින විශේෂඥයින්ගේ අවධානය යොමු වී ඇති කරුණකි.
(4) ජනගහන වර්ධන වේගයට සමාන්තරව මහපොළොවේ ආහාර නිපදවීමේ හැකියාව අඩුවීමෙන් ඇති වන ආහාර හිඟය පිළිබඳ ව ලෝපුරා සිටින විද්‍යාඥයින්ගේ අවධානය යොමු වී ඇත.

35. ශ්‍රී ලංකාව සහලින් ස්වයංපෝෂණය කිරීම සඳහා වී වගාවට අත්‍යවශ්‍ය වන ජල සම්පාදනය උදෙසා මූලික අඩිතාලම වූ වැව් තැනවීම ලංකාවේ රාජ්‍ය පාලකයින්ගේ වැදගත් ම රාජ්‍ය ප්‍රතිපත්තියක් විය.

(1) වී වගාවෙන් රට ස්වයංපෝෂණය කිරීම සඳහා රටට ඇවැසි ජලය සැපයීමට නම් වැව් තැනවීම අත්‍යවශ්‍ය බව එකල ලංකාවේ රාජ්‍ය පාලකයින් තේරුම් ගෙන ඇත.

(2) වී වගාව දියුණු කිරීම මගින් රට සහල්වලින් ස්වයංපෝෂණය කළ හැකි බවත් ඒ සඳහා ජලය ලබා දීමට වැව් තැනවීම අත්‍යවශ්‍ය බවත් රාජ්‍ය පාලකයෝ දැන සිටියහ.

(3) රට සහලින් ස්වයංපෝෂිත තත්ත්වයට ගෙන ඒම සඳහා වී වගාව දියුණු කළ යුතු නම් ඊට අවශ්‍ය ජලය සැපයීම සඳහා වැව් තැනවිය යුතු බව ලංකාවේ රාජ්‍ය පාලකයෝ තේරුම් ගත්හ.

(4) වී වගාව දියුණු කිරීමෙන් රට ස්වයංපෝෂණය කිරීමට නම් වගාවට ඇවැසි ජලය සැපයීම සඳහා වැව් තැනවීම අත්‍යවශ්‍ය කාර්යයක් බව ලංකාවේ රාජ්‍ය පාලකයෝ වටහා ගත්හ.

36. ප්‍රස්තුත මාතෘකාව පිළිබඳ ව මධ්‍යස්ථ ලෙස සංක්ෂිප්තව හා වාස්තවික ආකාරයෙන් කරුණු ඉදිරිපත් කිරීම කතුවැකියක ස්වභාවයයි.

(1) ප්‍රශ්නයට තුඩුදුන් මාතෘකාව පිළිබඳ ව මැදහත්ව කෙටියෙන් හා අපක්ෂපාතීව කරුණු ඉදිරිපත් කිරීම කතුවැකියක ලක්ෂණයයි.

(2) ඉදිරිපත් කරන මාතෘකාව පිළිබඳ ව අපක්ෂපාතීව, කෙටියෙන් හා විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කිරීම කතුවැකියක **ලක්ෂණයයි.**

(3) කතුවැකිය ලිවීමේදී තෝරාගත් මාතෘකාව පිළිබඳ මැදහත්ව සංක්ෂිප්තව හා යථාර්ථවාදීව කරුණු ඉදිරිපත් කෙරෙයි.

(4) කතුවැකියේ දී තෝරා ගත් මාතෘකාවට අදාළ කරුණු අපක්ෂපාතීව, කෙටියෙන් හා තර්කානුකූලව ඉදිරිපත් කෙරෙයි.

37. ' විභාගය සමත් වුණායින් පස්සේ රස්සාවක් සොයාගන්නවා කියල අරවින්ද කීවා' යන වාක්‍යය ලිඛිත වහරට හැරවූ විට වඩාත් **නිවැරදි වාක්‍යය** දැක්වෙන වරණය තෝරන්න.

(1) විභාගය සමත් වීමෙන් අනතුරුව රැකියාවක් සොයා ගන්නෙමුයි අරවින්ද කීවේ ය.

(2) විභාගය සමත් වූවායින් පසු රැකියාවක් සොය ගන්නා බව අරවින්ද කීවේ ය.

(3) විභාගය සමත් වීමෙන් පසු රැකියාවක් සොයා ගන්නා බව අරවින්ද කීහ.

(4) විභාගය සමත්වීමෙන් පසු රැකියාවක් සොයා ගන්නේ යයි අරවින්ද කියයි.

38. **වැරදි** ප්‍රකාශය සහිත වරණය තෝරන්න.

(1) සාහිත්‍ය නිර්මාණයක් බිහිවන්නේ සාහිත්‍යකරුවා තුළ පවත්නා ප්‍රතිභා ශක්තිය නිසා ය.

(2) සාහිත්‍යයේ දී රසවින්දනය හා නිර්මාණය යන අංග දෙක ම එක හා සමාන වැදගත්කමක් දරයි.

(3) රසවින්දනයට අදාළ සහජ ශක්තිය වාසනාගුණය නම් වේ.

(4) සාහිත්‍යකරුවා සිය නිර්මාණ කාර්යය කෙරෙහි නිරන්තරයෙන් ලබන අභ්‍යාසය ව්‍යුත්පත්තියයි.

39. 'සාහිත්‍යාර්ණවයේ පරතෙර දුටු කෙනකු වශයෙන් වැලිවිට සෝරත හිමියෝ පැසසුම් ලබති' යන වාක්‍යයේ **සාහිත්‍යාර්ණවය** යනු,

(1) සාහිත්‍යය නම් වූ නිධානයයි.

(2) සාහිත්‍යය නම් වූ ගංගාවයි.

(3) සාහිත්‍යය නම් වූ සාගරයයි.

(4) සාහිත්‍යය නම් වූ ස්වර්ණ මංජුසාවයි.

40. ' බලා සිටු රඟන රඟ මඬල කල් බඳ' යන පද්‍ය පාදයේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

(1) සිත් ඇද ගන්නා වූ කාන්තාවන් වේදිකාවේ රඟන ආකාරය බලා සිටින්න.

(2) රංග මණ්ඩලයෙහි කාන්තාවන් නටන ආකාරය හොඳින් දැක ගන්න.

(3) කාලය නොඉක්මවා වේදිකාවේ කාන්තාවන් නටන ආකාරය බලා හිඳින්න.

(4) සිටුවරුන් වේදිකාවේ රංගනයේ යෙදෙන ආකාරය කල් නොඉක්මවා බලන්න.


## 2.1.3 I පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | ...4.... | 21. | ...2.... |
| 02. | ...2.... | 22. | ...4.... |
| 03. | ...3.... | 23. | ...1.... |
| 04. | ...1.... | 24. | ...4.... |
| 05. | ...2.... | 25. | ...1.... |
| 06. | ...1.... | 26. | ...2.... |
| 07. | ...4.... | 27. | ...3.... |
| 08. | ...2.... | 28. | ...4.... |
| 09. | ...2.... | 29. | ...1.... |
| 10. | ...4.... | 30. | ...2.... |
| 11. | ...2.... | 31. | ...2... |
| 12. | ...4.... | 32. | ...4.... |
| 13. | ...1.... | 33. | ...1.... |
| 14. | ...3.... | 34. | ...1.... |
| 15. | ...1.... | 35. | ...2.... |
| 16. | ...2.... | 36. | ...3.... |
| 17. | ...1.... | 37. | ...2.... |
| 18. | ...3.... | 38. | ...4.... |
| 19. | ...2.... | 39. | ...3.... |
| 20. | ...3.... | 40. | ...1.... |

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.


## 2.1.4 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ (තේමා අනුව)

අ. පො. ස. (සා. පෙළ) විභාගය -2013
(21) සිංහල භාෂාව සහ සාහිත්‍යය - I පත්‍රය
එක් එක් ප්‍රශ්නයෙහි පහසුතාව (තේමා අනුව)




| තේමාව | පහසුතාව වැඩිම ප්‍රශ්නය හා එහි පහසුතාව | පහසුතාව අඩුම ප්‍රශ්නය හා එහි පහසුතාව |
|---|---|---|
| භාෂා කුසලතා | 3 (88%) | 6 (16%) |
| ව්‍යාකරණ | 24 (76%) | 21 (20%) |
| භාෂා සාහිත්‍යය | – | – |
| විශ්ලේෂණය හා අවබෝධය | 34 (58%) | 35, 36, 38 (25% බැගින්) |

අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2013
(21) සිංහල භාෂාව හා සාහිත්‍යය - I පත්‍රය




I ප්‍රශ්න පත්‍රය සැකසීමේදී පදනම් කරගනු ලැබූ තේමා හතර අතුරින්, එක් එක් තේමාවට අයත් ප්‍රශ්නවල පහසුතා සලකා, එම එක් එක් තේමාවෙහි මධ්‍යක පහසුතාව මෙම ප්‍රස්තාරයෙහි නිරූපණය කර ඇත. ඒ අනුව එම තේමා අතරින් පහසුතාව වැඩිම තේමාව භාෂා කුසලතාව වන අතර එහි පහසුතාව 88% කි. පහසුතාව අඩුම තේමාව වන්නේ ද භාෂා කුසලතාවයි. එහි පහසුතාව 16% කි.

සමස්ත වශයෙන් I ප්‍රශ්න පත්‍රයෙහි මධ්‍යක පහසුතාව 49%කි.

2.1.5 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස) (සිංහල)

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරූ ශිෂ්‍ය ප්‍රතිශතය | | | |
|---|---|---|---|---|---|
| | | පළමුවන වරණය | දෙවන වරණය | තෙවන වරණය | සිවුවන වරණය |
| 1 | 4 | 2% | 9% | 8% | **81%** |
| 2 | 2 | 6% | **50%** | 24% | 20% |
| 3 | 3 | 8% | 3% | **88%** | 1% |
| 4 | 1 | **63%** | 23% | 8% | 6% |
| 5 | 2 | 38% | **42%** | 7% | 13% |
| 6 | 1 | **16%** | 11% | 24% | 49% |
| 7 | 4 | 12% | 21% | 19% | **48%** |
| 8 | 2 | 20% | **42%** | 22% | 16% |
| 9 | 2 | 6% | **74%** | 3% | 17% |
| 10 | 4 | 19% | 35% | 9% | **37%** |
| 11 | 2 | 23% | **46%** | 16% | 15% |
| 12 | 4 | 6% | 6% | 6% | **82%** |
| 13 | 1 | **51%** | 14% | 22% | 13% |
| 14 | 3 | 15% | 26% | **43%** | 16% |
| 15 | 1 | **22%** | 4% | 7% | 67% |
| 16 | 2 | 13% | **47%** | 9% | 31% |
| 17 | 1 | **33%** | 25% | 21% | 21% |
| 18 | 3 | 4% | 35% | **27%** | 34% |
| 19 | 2 | 5% | **82%** | 6% | 7% |
| 20 | 3 | 13% | 24% | **52%** | 11% |
| 21 | 2 | 17% | **20%** | 22% | 41% |
| 22 | 4 | 7% | 39% | 14% | **40%** |
| 23 | 1 | **54%** | 15% | 24% | 7% |
| 24 | 4 | 7% | 11% | 6% | **76%** |
| 25 | 1 | **40%** | 7% | 7% | 46% |
| 26 | 2 | 5% | **80%** | 11% | 4% |
| 27 | 3 | 10% | 14% | **71%** | 5% |
| 28 | 4 | 11% | 12% | 21% | **56%** |
| 29 | 1 | **39%** | 22% | 21% | 18% |
| 30 | 2 | 23% | **35%** | 14% | 28% |
| 31 | 2 | 18% | **43%** | 26% | 13% |
| 32 | 4 | 14% | 29% | 22% | **35%** |
| 33 | 1 | **74%** | 6% | 9% | 11% |
| 34 | 1 | **58%** | 16% | 14% | 12% |
| 35 | 2 | 12% | **25%** | 35% | 28% |
| 36 | 3 | 22% | 34% | **25%** | 19% |
| 37 | 2 | 7% | **56%** | 23% | 14% |
| 38 | 4 | 9% | 11% | 55% | **25%** |
| 39 | 3 | 10% | 9% | **46%** | 35% |
| 40 | 1 | **35%** | 18% | 23% | 24% |

සටහන : එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය කළු පැහැයෙන් දක්වා ඇත.

### 2.1.6 සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

බහුවරණ ප්‍රශ්න හතළිහකින් සමන්විත මෙම ප්‍රශ්න පත්‍රය මගින් සිංහල භාෂාව හා සාහිත්‍යය පිළිබඳ ව අයදුම්කරුවන් සතු නිරවුල් දැනුම, අවබෝධය, ස්මරණ හැකියාව, භාෂා පරිචය හා භාවිතය යන කුසලතා මැන බැලීම හා ඇගයීම අපේක්ෂිතය.

මෙම බහුවරණ ප්‍රශ්න හතළිහටම ඒ සඳහා විශේෂයෙන් සැකසුණු ආකෘතියක පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. සිංහල භාෂාව හා සාහිත්‍යය I හා II පත්‍ර දෙකටම හිමි පැය තුනක කාලයෙන් නිශ්චිත කොටසක් මෙම I පත්‍රයේ ප්‍රශ්න හතළිහට පිළිතුරු සැපයීම සඳහා වෙන් කර නොමැති වුවත්, සාමාන්‍යයෙන් පැය එකක කාලයක් ඒ සඳහා යෙදවීම ප්‍රමාණවත් යැයි අපේක්ෂා කෙරේ.

අංක 8 පිටුවෙහි ඇති ප්‍රස්තාරයෙහි දැක්වෙන තොරතුරුවලට අනුව එම ප්‍රශ්න 40 අතුරෙන් අංක 1, 3, 12, 19, 24, 26 යන ප්‍රශ්නවල පහසුතාව 75% ඉක්මවා ඇත. එනම් මෙම පත්‍රයට පිළිතුරු සැපයූ අයදුම්කරුවන්ගෙන් 75%කට වඩා වැඩි පිරිසකට මෙම ප්‍රශ්නවලට නිවැරදිව පිළිතුරු සැපයීමට හැකි වී තිබේ. එබැවින් එකී ප්‍රශ්න පහසුතම ප්‍රශ්න ලෙස සැලකිය හැකි වෙයි. එම ප්‍රශ්න අතරින් අංක 3 ප්‍රශ්නය වඩාත්ම පහසු ප්‍රශ්නය වී ඇති අතර එහි පහසුතාව 88%ක් වේ.

අංක 2, 4, 9, 20, 23, 27, 28, 33, 34, 37 යන ප්‍රශ්නවල පහසුතා 50%-75% අතර ප්‍රාන්තරයට අයත් වේ. අනෙකුත් ප්‍රශ්නවලට සාපේක්ෂව මෙම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සිසුනට පහසු වී ඇති බව අනාවරණය වේ.

අංක 5, 7, 10, 11, 14, 16, 17, 22, 25, 29, 30, 32, 39, 40 යන ප්‍රශ්නවල පහසුතා 30%-50% අතර ප්‍රාන්තරයට අයත් වේ.

අංක 6, 15, 18, 21, 35, 36, 38 යන ප්‍රශ්නවල පහසුතා 30%ට වඩා අඩුවන බැවින් එම ප්‍රශ්න බොහෝ අයදුම්කරුවන්ට නිවැරදිව පිළිතුරු සැපයීමට දුෂ්කර වූ ප්‍රශ්න ලෙස සැලකිය හැකිය. එයින් වඩාත්ම දුෂ්කර වී ඇති ප්‍රශ්නය වන්නේ 6 ප්‍රශ්නයයි. එහි පහසුතාව 16%ක් වේ.

සිංහල භාෂාව හා සාහිත්‍යය I ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු බහුවරණ ප්‍රශ්න හතළිහ පහත සඳහන් පරිදි ප්‍රධාන තේමා හතරක් යටතේ වර්ගීකරණය කළ හැකි වෙයි.

1. භාෂා කුසලතා - 1, 2, 3, 4, 5, 6, 12, 13, 14, 15, 16, 17, 18, 19, 26, 27, 28
2. ව්‍යාකරණ - 7, 8, 9, 10, 11, 20, 21, 22, 23, 24, 25, 29, 30, 31, 32, 37
3. භාෂා සාහිත්‍යය - 33
4. විශ්ලේෂණය හා අවබෝධය - 34, 35, 36, 38, 39, 40

**භාෂා කුසලතා**

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු බහුවරණ ප්‍රශ්න 40 අතුරෙන් ප්‍රශ්න 17ක්ම ඉදිරිපත් කර තිබුණේ භාෂා කුසලතා තේමාවෙනි. I පත්‍රයට හිමි ලකුණුවලින් 42.5%ක් මේ සඳහා වෙන් කෙරෙන සේ තේමා අතර බර තබා ඇත. බහුවරණ ප්‍රශ්න 40 අතුරෙන් පහසුතම ප්‍රශ්නය අංක 3 වන අතර එය භාෂා කුසලතා තේමාවට අයත් වේ. එහි පහසුතාව 88%කි.

මෙම තේමාවට අයත් අංක 01, 12, 19, 26 යන ප්‍රශ්නවල පහසුතා පිළිවෙළින් 81%, 82%, 82%, 80% වේ. ඒ අනුව I පත්‍රයෙහි වඩාත් පහසු ප්‍රශ්න පහම ඇතුළත් වී ඇත්තේ භාෂා කුසලතා තේමාවෙනි. ඒ සෑම ප්‍රශ්නයකම පහසුතාව 80% ඉක්මවා ඇත.

මෙම තේමාවට අයත් ප්‍රශ්න අතුරෙන් දුෂ්කර ප්‍රශ්න බවට පත්ව ඇත්තේ අංක 6, 15, 17, 18 වේ. ඒවායේ පහසුතා පිළිවෙළින් 16%, 23%, 33%, 27% වේ.

භාෂා කුසලතා තේමාව යටතේ ඇති ප්‍රශ්න අතුරෙන් අංක 6 ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ පිළිතුරු වඩාත් අසාර්ථක වී ඇත. එම ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර අයත් පළමුවන වරණය තෝරා ඇත්තේ අයදුම්කරුවන් 16%ක් පමණි. අයදුම්කරුවන් 11%ක් දෙවැනි වරණය ද, 24%ක් තෙවැනි වරණය ද, 49%ක් මෙහි සිවුවැනි වරණය ද පිළිතුරු ලෙස තෝරා ඇත.

මෙහි අංක 6 ප්‍රශ්නය යටතේ දී ඇති ප්‍රකාශයෙහි හිස්තැන සඳහා වඩාත් සුදුසු පදය දී ඇති වරණ හතර අතුරෙන් තෝරා ලිවිය යුතු වෙයි. ලේඛනයේදීත්, වහරේදීත් හා භාෂණයේදීත් "සංයුක්ත" යන පදය බොහෝ විට භාවිත වන නමුදු "ආසක්ත" යන පදය සිසුන්ට නුහුරු පදයක් වීම නිසා බොහෝ සිසුන් "ආසක්ත" යන්න හිස්තැනට වඩාත් සුදුසු පදය යැයි තෝරා ගැනීමට හේතුවන්නට ඇත. අයදුම්කරුවන්ගේ දැනුම, එකී පදය තෝරා ගැනීම සඳහා ප්‍රමාණවත් නොවූ බව මෙයින් අනාවරණය වේ.

අංක 15 ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර අයත් වන්නේ පළමු වන වරණයට වන නමුදු නිවැරදි පිළිතුර සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 23%ක් පමණි. අයදුම්කරුවන්ගෙන් 66%ක්ම සිවුවන වරණයට නිවැරදි පිළිතුර අයත් සේ සලකා ඇත. මෙම ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර තේරීමට නොහැකි වී ඇත්තේ නියමිත පෙළ පොත් පරිශීලනය නොකිරීම මෙන්ම බාහිර පොත පත පරිශීලනයෙන් ඈත්වීම ද නිසා විය යුතුය. භාෂාවක් අධ්‍යයනය කිරීමේදී නිවැරදි ව භාෂාව භාවිත කරමින් ලියන ලද පොත් පත් සඟරා ආදී ලේඛන සැලකිල්ලෙන් පරිහරණය කරමින් තම වාක් කෝෂය පුළුල් කර ගැනීමට සිසුන් යොමු විය යුතුය.

මෙම ප්‍රශ්න 17හිම පහසුතා සලකා මධ්‍යක පහසුතාව (Average Facility) ගණනය කළ විට භාෂා කුසලතා තේමාවේ සමස්ත පහසුතාව 55%කි.

**ව්‍යාකරණ**

සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයෙහි ව්‍යාකරණ තේමාව යටතේ බහුවරණ ප්‍රශ්න 16ක් අඩංගු වූ අතර, මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණුවලින් 40%ක් එම තේමාවට වෙන් වී තිබුණි.

ව්‍යාකරණ තේමාවට අයත් ප්‍රශ්න 16 අතුරෙන් වැඩිම පහසුතාව ඇත්තේ 24 වැනි ප්‍රශ්නයටයි. එහි පහසුතාව 76%කි. මෙම තේමාව යටතේ ඇති පහසු ප්‍රශ්න ලෙස සැලකිය හැකි අංක 9, 20, 23, 37 ප්‍රශ්නවල පහසුතා පිළිවෙළින් 74%, 52%, 54%, 56% වේ.

ව්‍යාකරණ තේමාව යටතේ වූ දුෂ්කරම ප්‍රශ්නය වන්නේ 21 වන ප්‍රශ්නයයි. එහි පහසුතාව 20%ක් පමණි. මෙම ප්‍රශ්නයෙහි නිවැරදි පිළිතුර අයත් වන්නේ දෙවන වරණයට වුවත් එය තෝරා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 20%ක් පමණක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 17%ක් පළමුවන වරණයද, 22%ක් තෙවන වරණයද, 41%ක් සිව්වන වරණය ද තෝරා ඇත.

සරල වියරණ රීති පිළිබඳව අයදුම්කරුවන් තුළ ඇති අනවබෝධය මෙහිදී කැපී පෙනේ. එමෙන්ම නිපාත, උපසර්ග හා පර්යාය පද පිළිබඳව නිශ්චිත ව නො දැනීම මෙන් ම විශේෂයෙන් ම කර්තෘ කාරක වාක්‍ය හා කර්ම කාරක වාක්‍ය එකිනෙකින් වෙන් කර හඳුනා ගැනීමට නො හැකිවීමත් මෙම ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තේරීමට නො හැකිවීම කෙරෙහි වැඩි බලපෑමක් කර ඇති බව පැහැදිලි ය.

25 වන ප්‍රශ්නය පෙළ ගස්වා ඇත්තේ සන්ධි කරන ලද පද යුගලයක් විසන්ධි කිරීම ඇසුරිනි. දී ඇති වරණ අතුරෙන් නිවැරදි වනුයේ පළමුවන වරණය වුවද අයදුම්කරුවන් අතරින් නිවැරදි ව පිළිතුරු සපයා ඇති ප්‍රතිශතය 41%ක් පමණි.

එහෙත් මෙම ප්‍රශ්නයට පිළිතුරු ලෙස සිවුවන වරණය තෝරා ඇති අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය 45%කි. ඔවුන් සියලු දෙනාම "අත්‍යවශ්‍යතාව" යන්නෙහි නිවැරදි විසන්ධි කිරීම නොදන්නා බව පෙනී යයි. මෙයට ප්‍රධාන හේතුව වී ඇත්තේ පද සන්ධි කිරීම හා විසන්ධි කිරීම පිළිබඳව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ප්‍රමාණවත් අවධානයක් යොමු නොවීමයි. එබැවින් මේ පිළිබඳ ව පන්ති කාමරය තුළ වැඩි අවධානයක් යොමු කළ යුතුය.

21 වන ප්‍රශ්නයට අමතරව අංක 10, 29, 30 හා 32 ප්‍රශ්න ද අයදුම්කරුවන්ට දුෂ්කර වී ඇති බව සැලකිය හැකි වෙයි. ඒවායේ පහසුතා පිළිවෙළින් 37%, 39%, 34% හා 32% වේ. 10 වන ප්‍රශ්නය සකස් කර ඇත්තේ අක්ෂර වින්‍යාසය ඇසුරෙනි. අයදුම්කරුවන්ගෙන් 37%ක් එම ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර අයත් සිවුවන වරණය තේරූ අතර, අයදුම්කරුවන්ගෙන් 35%ක්ම දෙවන වරණය තෝරා ඇත. ඔවුන්ට එහි සඳහන් සදොස් අක්ෂර වින්‍යාසය සහිත පද හඳුනා ගත නො හැකි වී ඇත. සමස්තයක් ලෙස අයදුම්කරුවන්ගෙන් 63%කට මෙම ප්‍රශ්නය යටතේ දී දෙන ලද වරණ හතර අතරින් නිවැරදි ව අක්ෂර යෙදී ඇති වරණය නිර්ණය කිරීමට නො හැකි වී ඇති බව අනාවරණය වේ.

අංක 29, 30 හා 32 ප්‍රශ්නවලට ද නිවැරදි පිළිතුරු සැපයීමට බොහෝ අයදුම්කරුවන් අපොහොසත් වී ඇත. මෙහිදී පිළිවෙළින් 61%ක් 65%ක් 66% තරම් ප්‍රමාණයක අයදුම්කරුවන් වෙනත් වරණ තෝරා ගැනීමෙන් අනාවරණය වන්නේ අයදුම්කරුවන්ගේ අනවබෝධයයි.

මේ නිසා අයදුම්කරුවන් දක්වා ඇති ප්‍රතිචාර පිළිබඳ ව අවධානය යොමු කිරීමේදී සරල ව්‍යාකරණ විදි පිළිබඳව ද සිසුන්ගේ ව්‍යාකරණ පිළිබඳ දැනුම ප්‍රමාණවත් නොවන බව අනාවරණ වන නිසා ඔවුන්ට ඒ පිළිබඳ අවබෝධයක් ලබාදීම වැදගත් බව තහවුරු වෙයි.

**භාෂා සාහිත්‍යය**

සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයේ භාෂා සාහිත්‍යය තේමාව ඇසුරෙන් සකස් වී ඇත්තේ 33 වන ප්‍රශ්නය පමණි. උපමා මූලික කරගත් ප්‍රශ්නයක් වූ එහි පහසුතාව 74%කි. ඉතිරි අයදුම්කරුවන් 26%කගේ ප්‍රතිචාර අනෙකුත් වරණ තුන අතර විසිරී ඇති බව පෙනේ.

අයදුම්කරුවන්ගෙන් 74%ක් මෙම ප්‍රශ්නයට නිවැරදි ව පිළිතුරු සැපයීමෙන් අනාවරණය වන්නේ පළමුවන වරණයෙහි අඩංගු "වන්" යන පදය මගින් උපමාව අඩංගු කවි පදය තේරීමට බොහෝ සිසුන් සමත්ව ඇති බවයි.

**විශ්ලේෂණය හා අවබෝධය**

සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයෙහි විශ්ලේෂණය හා අවබෝධය තේමාව යටතේ අංක 34, 35, 36, 38, 39, 40 යන ප්‍රශ්න හය අඩංගු වී තිබුණි. I පත්‍රයට හිමි ලකුණුවලින් මෙම තේමාව සඳහා 15%ක බර තැබීමක් සිදුකර ඇත. මෙම තේමාවට අයත් ප්‍රශ්න අතරින් වැඩිම පහසුතාව 34 වන ප්‍රශ්නයට හිමිවී ඇති අතර එහි පහසුතාව 58%කි. මෙම තේමාව යටතේ ඇති දුෂ්කරම ප්‍රශ්න ලෙස අංක 35, 36, 38 යන ප්‍රශ්න සැලකිය හැකිය. එම ප්‍රශ්න තුනේම පහසුතා 25% බැගින් වේ. මෙම ප්‍රශ්න තුනෙහිදී ම, නිවැරදි පිළිතුර අයත් වරණය තෝරන අයදුම්කරුවන් සංඛ්‍යාවට වඩා වැඩි අයදුම්කරුවන් සංඛ්‍යාවක් වෙනත් වරණයක් තෝරා ඇති බව අංක 20 පිටුවේ අඩංගු වගුවෙහි ඇති තොරතුරුවලින් අනාවරණය වේ.

35 වන ප්‍රශ්නයට නිවැරදි පිළිතුර දෙවැනි වරණයෙහි ඇතුළත් වුව ද අයදුම්කරුවන්ගෙන් 35%ක්ම නිවැරදි වරණය ලෙස තෝරා තිබුණේ තෙවැනි වරණයයි. එම වරණ දෙක යටතේ දී ඇති වාක්‍ය දෙකෙහි ම අදහස් තරමක් දුරට සමාන බවක් පෙන්නුම් කරයි. මෙහිදී අයදුම්කරුවන් "වී වගාව දියුණු කිරීම මගින්" හා "වී වගාව දියුණු කළ යුතු නම්" යන වාක්‍ය ඛණ්ඩ දෙකෙහිත් "රාජ්‍ය පාලකයෝ දැන සිටියහ" හා "රාජ්‍ය පාලකයෝ තේරුම් ගත්හ" යන වාක්‍ය ඛණ්ඩ දෙකෙහිත් අදහස් සුවිශේෂව වෙන් කර ගැනීමේ දුෂ්කරතාවට පත්ව ඇති බව නිගමනය කළ හැකිය. 36 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී ද බොහෝ අයදුම්කරුවන් එම දුෂ්කරතාවට ම මුහුණ පා ඇති බව එහි එක් එක් වරණය තෝරා ඇති අයදුම්කරුවන්ගේ ප්‍රතිශත සලකා බැලීමෙන් අනාවරණය වේ.

36 වන ප්‍රශ්නයේ සඳහන් "ප්‍රස්තුත මාතෘකාව, මධ්‍යස්ථ ලෙස, සංක්ෂිප්තව, වාස්තවික ආකාරයෙන්" යන පදවල අදහස නිරවුල්ව ගනිමින් නිවැරදි පිළිතුර අඩංගු වරණය සීමිත කාලයක් තුළ තෝරා ගැනීමේ අපහසුතාව මෙම තත්ත්වයට හේතු වී ඇති බව නොඅනුමානය. පහසුතාව 25%කට සීමාවී ඇති 38 වන ප්‍රශ්නයට පිළිතුර නිවැරදි ව තේරීම සඳහා පෙළ පොත අධ්‍යයනය කිරීමෙන් ලබන දැනුම හා අවබෝධය මහත් සේ ඵලදායි වන නමුත් එම අවබෝධය නොමැතිවීම නිසා අයදුම්කරුවන්ගෙන් 55%ක්ම වැරදි පිළිතුරක් අඩංගු තෙවැනි වරණය තෝරා ගෙන ඇත.

පෙළ පොත් හා සම්භාව්‍ය සාහිත්‍ය පත පොත පරිශීලනයට සිසු දරුවන් යොමු කිරීමේ අවශ්‍යතාව මෙම තොරතුරුවලින් අවධාරණය කෙරේ.

අංක 34, 39, 40 යන ප්‍රශ්නවල නිවැරදි පිළිතුරු අඩංගු වරණයට වඩා අන් වරණ තුන සඳහා පොදුවේ විසිරී ගිය තේරීමේ ක්‍රමයක් දැකිය හැකි වේ. 10 සහ 11 ශ්‍රේණිවල සිංහල භාෂාව පෙළ පොත් ආශ්‍රිතව මෙම ප්‍රශ්න සකස් කෙරුණ ද නිර්දේශිත සාහිත්‍ය ග්‍රන්ථ පරිශීලනය නොකිරීම නිසා නිවැරදි පිළිතුර තෝරා ගැනීමට නො හැකි වී ඇති බව පෙනේ. එබැවින් විශ්ලේෂණය හා අවබෝධය යටතේ ඇති ප්‍රශ්නවලින් ඉහළ ලකුණු ලබාගැනීම සඳහා ඉහත සඳහන් අඩුපාඩු මග හරවා ගත යුතු වේ. මේ පිළිබඳව ගුරු-සිසු අවධානය යොමුවීම අත්‍යවශ්‍ය වේ.

| තේමාව | තේමාවට ඇතුළත් වී ඇති ප්‍රශ්න සංඛ්‍යාව | බර තැබීම | තේමාවේ පහසුතාව |
|---|---|---|---|
| 1) භාෂා කුසලතා | 17 | 42.5% | 55% |
| 2) ව්‍යාකරණ | 16 | 40% | 46% |
| 3) භාෂා සාහිත්‍යය | 01 | 2.5% | 74% |
| 4) විශ්ලේෂණය හා අවබෝධය | 06 | 15% | 36% |

සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයෙහි සමස්ත පහසුතාව 49%ක් වේ. එනම් මෙම පත්‍රයට පෙනී සිටි අයදුම්කරුවන් සමස්තයක් වශයෙන් ගත් කල, ඔවුන් උපයා ගෙන ඇත්තේ එම පත්‍රයට උපයා ගත හැකිව තිබූ උපරිම ලකුණුවලින් 49%ක් පමණි. එයින් ගම්‍ය වන්නේ සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයෙන් ඉහළ ලකුණු ලබාගැනීම අයදුම්කරුවන්ට පහසු වී නොමැති බවයි.

## 2.2 II ප්‍රශ්න පත්‍රය

### 2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

1. ප්‍රශ්නය : භාෂා පරිචය ඇගයීම සඳහා සකස් කරන ලද කෙටි පිළිතුරු සැපයීමේ අනුප්‍රශ්න 10කින් සමන්විත වේ.
එක් අනුප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 20 කි.

2. ප්‍රශ්නය : නිර්දිෂ්ට ව්‍යූහගත තේමා හතරක් අතුරින් එකක් තෝරා ගෙන, දෙන ලද වචන සීමාවක් යටතේ රචනයක් ලිවිය යුතු වේ. තෝරා ගනු ලැබූ රචනා ව්‍යූහයට වඩාත් අදාළ වන සාරවත් කරුණු හඳුනා ගෙන නිර්මාණාත්මක ලෙස සංවිධානය කර ඉදිරිපත් කිරීමේ හැකියාව මැනීම අපේක්ෂා කෙරේ.
ලකුණු 25 කි.

3. ප්‍රශ්නය : දෙන ලද පාඨයක සාරාංශය, දෙන ලද වචන සීමාවක් තුළ ලිවිය යුතු වේ. භාෂාමය සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව මැන බැලීම අපේක්ෂා කෙරේ.
ලකුණු 10 කි.


4. ප්‍රශ්නය : දෙන ලද ඡේදයක් ඇසුරෙන් විමසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සැපයිය යුතු වේ. අවබෝධය මැනීම අපේක්ෂා කෙරේ.
ලකුණු 10 කි.

5. ප්‍රශ්නය : දී ඇති අවශ්‍යතාවලට ගැළපෙන සේ අදළ ඉල්ලීමක් අඩංගු ලිපියක් හෝ අදළ තොරතුරු අඩංගු අත් පත්‍රිකාවක් හෝ ලිවිය යුතු වේ. ප්‍රායෝගික ලේඛන කුසලතා මැනීම අපේක්ෂා කෙරේ.
ලකුණු 15 කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු = 80

## 2.2.2 II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන

II පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ අංක 2, 3 හා 4 ප්‍රස්තාර ඇසුරෙන් ඉදිරිපත් කර ඇත. එක් එක් ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමග දක්වා ඇත.




(RD/16/04/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

සිංහල භාෂාව හා සාහිත්‍යය II පත්‍රයෙහි ඇති ප්‍රශ්න පහටම පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. එහෙත් අයදුම්කරුවන්ගෙන් වැඩි ම ප්‍රතිශතයක් පිළිතුරු සපයා තිබුණේ පළමුවන ප්‍රශ්නයට වන අතර අඩු ම ප්‍රතිශතයක් පිළිතුරු සපයා තිබුණේ 5 වන ප්‍රශ්නයට ය. එම ප්‍රතිශත පිළිවෙළින් 98% හා 91% (ප්‍රස්තාරය 2, පිටුව 9) වේ. අයදුම්කරුවන්ගෙන් වැඩි ම ප්‍රතිශතයක් පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබූ නමුත් වැඩි ම පහසුතාවක් ඇත්තේ 4 වන ප්‍රශ්නයට ය. දී ඇති ඡේදයක් පදනම් කරගෙන අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සැලැස්වීම මගින් සිසුන්ගේ අවබෝධය පිළිබඳ හැකියාව මැනීමේ අරමුණින් එම ප්‍රශ්නය සකස් කරන ලද්දකි. එහි පහසුතාව 74%ක් පමණ වීම මගින් නිගමනය කළ හැක්කේ එම ප්‍රශ්නයට වඩාත් පහසුවෙන් හා සතුටුදායක ලෙස පිළිතුරු සැපයීමේ හැකියාව සිසුන් සතු වූ බවයි.

එසේ ම මෙම පත්‍රයේ ප්‍රශ්න පහ අතුරෙන් 2 වන ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් 96%කට ආසන්න ප්‍රතිශතයක් පිළිතුරු සපයා තිබූ නමුදු එම ප්‍රශ්නයෙහි පහසුතාව 47.3%කට සීමාවී තිබිණි. දී තිබූ රචනා ව්‍යූහ හතරෙන් එකක් ආශ්‍රයෙන් පමණක් රචනාවක් නිර්මාණය කිරීම සඳහා යොමු කෙරුණු මෙම ප්‍රශ්නය තුළ තම අභිමතය අනුව රචනා ව්‍යූහයක් තෝරා ගැනීමේ අවස්ථාවක් ද සිසුනට හිමිව තිබිණි. එසේම පූර්ව සූදානම මගින් වඩාත් සාර්ථක පිළිතුරක් නිර්මාණය කිරීමේ ඉඩ ප්‍රස්තා ද පැවතිණි. මෙම විෂයය යටතේ ප්‍රශ්න පත්‍ර තුනෙහි ම අඩංගු වන සියලු ම ප්‍රශ්න අතුරෙන් වැඩිම ලකුණු ප්‍රමාණයක් වෙන් කෙරෙන ප්‍රශ්නය ද මෙයයි. මෙවැනි වාසිදායක තත්ත්ව රැසක් ම තිබියදීත් සිසුන් විසින් මෙම ප්‍රශ්නය සඳහා සාපේක්ෂ වශයෙන් අඩුවෙන් ලකුණු ලබා තිබීම විශේෂ අවධානයට යොමු විය යුතු වේ.

01. ප්‍රශ්නය

අපේක්ෂණය : භාෂා පරිචය ඇගයීම
ව්‍යූහය : මෙම ප්‍රශ්නයට කෙටි පිළිතුරු අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ.

**1.** **(i)** සිට **(x)** තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ** නම් එහි **අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) සිංහල අක්ෂර මාලාවෙහි ඇතුළත් වන සඤ්ඤක අක්ෂර **දෙකක්** ද මූර්ධජාක්ෂර **දෙකක්** ද ලියා දක්වන්න.

(ii) පහත සඳහන් පද **දෙකෙහි** විරුද්ධාර්ථ රූප ලියන්න.
(අ) බහුශ්‍රැත (ආ) නිරාකුල

(iii) පහත සඳහන් පද්‍ය ඛණ්ඩ දෙකෙහි තදකළු අකුරෙන් දක්වෙන පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.
(අ) විමානයෙන් **බසිනු මැනවි** ස්වර්ණමාලියේ
(ආ) බෝ මළුවක ඇවිළෙන පහන් වැඹක් සේ තුන් සිත නිවී **සැදේවා.**

(iv) පහත සඳහන් පද **දෙක** විසන්ධි කොට ලියන්න.
(අ) පූජෝත්සවය (ආ) නළඟන

(v) පහත සඳහන් (අ) සහ (ආ) කොටස්වල එන වාක්‍ය දෙකෙහි පවතින සදෝෂ වචන **දෙක** නිදෝස් කොට ලියන්න.
(අ) දරුවන්ගේ පෝශණ අවශ්‍යතා පිළිබඳ ව දෙමාපියන් සැලකිලිමත් විය යුතු බව වෛද්‍යවරු පවසති.
(ආ) ගුරුමූෂ්ටී තබා නොගෙන ඉගැන්වීමෙහි යෙදෙන ගුරුවරයා සමාජයෙහි ගෞරවාදරයට පාත්‍ර වේ.

(vi) පහත සඳහන් වාක්‍ය **දෙක** නිදොස් කොට ලියන්න.
(අ) අක්කා හෝ අය්යා හෝ ශ්‍රමදානයට සහභාගී වෙති.
(ආ) විචාරකයන් බැද්දේගම චිත්‍රපටය ඇගයීමට පාත්‍ර කළහ.

(vii) පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් නිපාත පද **දෙක** තෝරා ලියන්න.
උදේ පටන් පැවැති අධික වර්ෂාපතනය නිසා ක්‍රීඩා තරගයට බාධා ඇති විය.

(viii) මෙහි (අ) සහ (ආ) කොටස්වල එන කර්මකාරක වාක්‍ය **දෙක** කර්තෘකාරකයට හරවා ලියන්න.
(අ) ප්‍රතිමා ශිල්පීන් විසින් ප්‍රදර්ශන තරගය සඳහා ප්‍රතිමා කිහිපයක් ඉදිරිපත් කෙරෙයි.
(ආ) මාර්ටින් වික්‍රමසිංහ විසින් ගම් පෙරළිය, යුගාන්තය හා කලියුගය යන තුන් ඈඳුතු නවකතා රචනා කෙරිණි.

(ix) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් කෘදන්ත පද **දෙක** තෝරා ලියන්න.
චිත්තාකර්ෂණීය නැටුම් සංදර්ශනයක් ඉදිරිපත් කළ ඇය සුප්‍රකට නිළියකි.

(x) දළදා මාලිගාවේ පුදසිරිත් ආශ්‍රිත ජන වහරට අයත් පහත සඳහන් පදවල අදහස ලියන්න.
(අ) හේමකද (ආ) අවුල්පත (ලකුණු 20 යි)

අපේක්ෂිත පිළිතුර

1. (i) ග, ජ, ඩ, ද, බ
ට, ඨ, ඩ, ඪ, ණ, ළ, ෂ, ර, ඬ, ඎ, ඐ
(එක අකුරකට ලකුණු 1/2 බැගිනි)

(ii) (අ) අල්පශ්‍රැත
(ආ) ආකුල

(iii) (අ) විධි ක්‍රියා/ විධාන ක්‍රියා/ විධි කිරිය
(ආ) ආශිර්වාද ක්‍රියා/ ආසි කිය/ ප්‍රාර්ථනා ක්‍රියා

(iv) (අ) පූජා+උත්සවය
(ආ) නළු+අඟන

(v) (අ) පෝෂණ (වැකියක මෙම වචන දෙකට පමණක් අවධානය යොමු කළ යුතුය)
(ආ) ගුරු මුෂ්ටි
(වාක්‍යය ම ලියා තිබුණත් ලකුණු දෙන්න)

(vi) (අ) අක්කා හෝ අයියා හෝ ශ්‍රමදානයට සහභාගි වෙයි.
(ආ) විචාරකයෝ බැද්දේගම චිත්‍රපටය ඇගයීමට පාත්‍ර කළහ.
(වචන දෙක පමණක් නිදොස් කොට වෙනම ලියා තිබුණත් ලකුණු දෙන්න)

(vii) පටන්, නිසා

(viii) (අ) ප්‍රතිමා ශිල්පිහු/ ශිල්පියෝ ප්‍රදර්ශන තරගය සඳහා ප්‍රතිමා කිහිපයක් ඉදිරිපත් කරති./ කෙරෙති./ කරන්නෝය.

(ආ) මාර්ටින් වික්‍රමසිංහ ගම් පෙරළිය, යුගාන්තය හා කලියුගය යන තුන් ඈඳුතු නවකතා රචනා කළේය/කෙළේ (ය)


මාර්ටින් වික්‍රමසිංහයෝ/ මාර්ටින් වික්‍රමසිංහ සූරීහු ගම් පෙරළිය, යුගාන්තය හා කලියුගය යන තුන් ඈඳුතු නවකතා රචනා කළහ/කළෝය/කළාහුය/කළෝ/කෙරූ

(ix) නැටුම්, කළ/ඉදිරිපත් කළ/චිත්තාකර්ෂණීය

(x) (අ) රන් කද/ බුද්ධ පූජා, දේව පූජා ආදියට දානය/ ආහාර ගෙන යන කද/රාජභෝජන ගෙන යන කද

(ආ) කැවිලි වර්ග/ අතුරුපස/ කැවිලි/රස කැවිලි


**1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**




මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වුවත් ඊට පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 98%ක පිරිසකි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 31%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 32%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 27%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 10%ක් ද,

ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 10%ක් වන අතර, 31%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙනි.




සිංහල භාෂාව හා සාහිත්‍යය II ප්‍රශ්න පත්‍රයෙහි පළමුවන ප්‍රශ්නය කොටස් 10ක් යටතේ අනුකොටස් 17කින් සමන්විත වූ අතර වැඩිම පහසුතාව ඇත්තේ (v) වන කොටසේ (අ) අනුකොටසට ය. එහි පහසුතාව 76%කි. "පෝෂණය" යන පදය පාසල් පද්ධතියේ පළමුවන ශ්‍රේණියේ පටන් වැඩිහිටි අවධිය දක්වාම පාසලේදීත්, සමාජයේදීත් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවලදීත් නිතර දැකිය හැකි පදයක් වීම ඊට ලැබුණු ප්‍රතිචාර ඉහළ මට්ටමක පැවතීමට හේතුවකි.

දෙවනුව වැඩි පහසුතාව වන 71% ලබාගත් පළමුවන ප්‍රශ්නයේදී සඤ්ඤක අක්ෂර හා මූර්ධජ අක්ෂර දෙක බැගින් ලිවීමට තිබීම නිසා එයද සරල වී ඇති බවත් පැහැදිලි ය.

(iii) (අ) සහ (ආ), (iv) (අ), (v) (ආ) (vi)(අ) සහ (ආ), (vii), (ix) යන කොටස්වල/අනුකොටස්වල පහසුතා 40%-60% ප්‍රාන්තරය තුළ පවතින අතර, මෙම කොටස්/අනුකොටස් 17 අතුරෙන් දුෂ්කරම ප්‍රශ්නය වී ඇත්තේ (iv) (ආ) අනුකොටසයි. "නළඟන" යන පදය විසන්ධි කර දැක්වීමේදී නළු+අඟන ලෙස විසන්ධි කිරීමට නොහැකි වී ඇත්තේ ප්‍රකෘතිය පිළිබඳ අවබෝධයක් නොමැතිවීම නිසා විය යුතුය. ඊළඟට වඩාත් දුෂ්කර වී ඇත්තේ පිළිවෙළින් (ii) (අ) සහ (ආ) අනුකොටස් වේ. ඒවායේ පහසුතා පිළිවෙළින් 15%ක් සහ 23%ක් වේ. එම ප්‍රශ්නවලට පාදක වූයේ දී ඇති පද දෙකෙහි විරුද්ධාර්ථ පද ලිවීමය. මෙම ප්‍රශ්නයේ නිවැරදි පිළිතුරු වූ "අල්පශ්‍රැත" හා "ආකුල" යන පද භාෂණය, ලේඛනය හා කථනය යන අවස්ථාවලදී බහුලව භාවිත නොවීම පහසුතාව අඩුවීමට හේතුවන්නට ඇත.

(x) වැනි කොටසේ (අ), (ආ) අනුකොටස් පෙළ පොත ඇසුරින් විමසා ඇතත් ඒවායේ පහසුතා 29% හා 34% වීමෙන් ම, අයදුම්කරුවන් නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනයෙහි දක්වන දුර්වලතාව අනාවරණය විය.

(viii) වන කොටසේ (අ) අනුකොටසෙහි පහසුතාව 35%ක් ද (ආ) කොටසෙහි පහසුතාව 39%ක් ද වන අතර අයදුම්කරුවන් වාක්‍ය රටා අනුව කර්තෘ කාරක-කර්ම කාරක භේදය නිසි ලෙස අවබෝධ කරගෙන නොමැති බවද උක්ත-අනුක්ත භේදය, සංඛ්‍යා භේදය, ආඛ්‍යාත භේදය ආදී සරල ව්‍යාකරණ රීති පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් ඔවුන්ට නොමැති බව ද මෙයින් අනාවරණය විය.

භාෂා පරිචය ඇගයීම සඳහා පෙළ ගස්වා ඇති මෙම ප්‍රශ්නවලින් කෙටි පිළිතුරු දැක්වෙන අතර අනු ප්‍රශ්න 17ක් ඇතුළත් වේ.

භාෂා පරිචය යටතේ ලේඛන කුසලතාව, භාෂණ අවබෝධය හා විශ්ලේෂණය කිරීම, භාෂා භාවිතය, ග්‍රන්ථ පරිහරණය හා වාක්‍ය අවබෝධය යන කරුණු මැනීමට මෙයින් අපේක්ෂා කළ ද අයදුම්කරුවන් තුළ ව්‍යාකරණ පිළිබඳ මූලික දැනුම හීන වීම හා අවබෝධය පිළිබඳව ඔවුන් තුළ ඇති දුර්වලතා කැපී පෙනෙයි. මේ සඳහා ව්‍යාකරණ ග්‍රන්ථ පරිශීලනය කිරීමට හා වියරණ දැනුම නිවැරදිව ඉගෙනීමට අයදුම්කරුවන් උනන්දු කළ යුතුය.

## 02 ප්‍රශ්නය

අපේක්ෂණය : සංශ්ලේෂණ හැකියාව මැන බැලෙන්නකි. දෙන ලද ව්‍යුහගත ඡේද හතරෙන් එකක් යටතේ රචනාවක් ලිවීමත්, යෝග්‍ය මාතෘකාවක් යෙදීමත් අපේක්ෂා කෙරේ. මෙහිදී අපේක්ෂකයාගේ නිර්මාණ හා චින්තන ශක්තිය, ලේඛන කුසලතාව, නිරවුල් භාෂා භාවිතය, සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව මැන බැලීම ආදි අරමුණු කෙරෙහි අවධානය යොමු වෙයි. මාර්ගෝපදේශිත රචනා මූලධර්මය මෙහිදී අනුගමනය කර ඇත.

**2.** පහත දක්වෙන **අ, ආ, ඉ, ඊ** යන විස්තර අතුරෙන් **එකක්** තෝරාගෙන **වචන 250 කට නොඅඩු** වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) නිවෙස්, කර්මාන්තශාලා, ව්‍යාපාරික ස්ථාන ආදියෙහි රැස්වන කුණුකසල අවට පරිසරයට බැහැර කිරීමේ අශෝභන ක්‍රියාවට ශ්‍රී ලංකාවේ බොහෝ දෙනෙක් නැඹුරු ව සිටිති. මෙලෙස තැන තැන ගොඩගැසෙන කුණු ගොඩවල් පරිසරයට මෙන් ම මිනිසුන්ගේ සෞඛ්‍යයට ද බලවත් තර්ජනයකි. මේ තත්ත්වයට හේතු වී ඇත්තේ කුණු කසල බැහැර කිරීමේ විධිමත් ක්‍රමවේදයක් නැතිකමටත් වඩා ඒ සම්බන්ධයෙන් ජනතාව දක්වන නොසැලකිල්ල බව පෙනේ. එබැවින් කුණුකසල බැහැර කිරීමේ විධිමත්, සෞඛ්‍යාරක්ෂක, පරිසර හිතකාමී, ක්‍රමෝපාය හඳුන්වාදීමට සමගාමී ව ජනතා ආකල්ප වර්ධනය කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම ද වැදගත් ය.

(ආ) පාසල් ගොඩනැගිලි, ලීබඩු, විද්‍යා උපකරණ, පුස්තකාල පහසුකම්, නිල ඇඳුම්, පෙළපොත් හා ශිෂ්‍යාධාර පහසුකම් ආදි විවිධාංග ඔස්සේ මෙරට නිදහස් අධ්‍යාපනය උදෙසා රජය විශාල මුදලක් වැය කරයි. මින් ප්‍රයෝජන ලබා ගෙන විවිධ ක්ෂේත්‍රවලින් බිහිවන උගතුන් වැඩි වැටුප් හා වරප්‍රසාද අපේක්ෂාවෙන් විදේශගත වීමේ ප්‍රවණතාවක් මෙකල දැකිය හැකි ය. මොවුන් අතුරෙන් බහුතරයක් ඒ රටවල ම ස්ථිර ව පදිංචි වන බව ද වාර්තා වේ. නිදහස් අධ්‍යාපනයේ ඵල ලබන සියලු දෙනාගේ යුතුකම වන්නේ තම මව්බිමෙහි අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කිරීම ය.

(ඉ) නිවාස, කර්මාන්තශාලා, මංමාවත් හා වෙනත් පොදු ස්ථාන ආලෝකකරණය සඳහාත්, විවිධ මට්ටමේ යාන්ත්‍රික කටයුතු සඳහාත්, භාවිත කෙරෙන ප්‍රධානතම බලශක්ති මූලය වන විදුලිය පරිභෝජනය ශීඝ්‍රයෙන් ඉහළ යමින් පවතී. අවධිමත් පරිභෝජන රටා හා වංචනික ක්‍රියා නිසා අපතේ යන විදුලි ඒකක ප්‍රමාණය ද සුළුපටු නො වේ. අධික විදුලි බිලක් ගෙවීමෙන් හා නිතර නිතර විදුලි කප්පාදුවට මුහුණ දීමෙන් මෙහි ප්‍රතිවිපාක විඳින්නෝ පොදු මහජනතාව ය. මේ අනුව වංචනිකයනට දැඩි දඬුවම් පැමිණවීමත්, අරපිරිමැස්මෙන් විදුලිය පරිභෝජනයට මහජනතාව පෙලඹවීමත් කඩිනමින් කළ යුතුව තිබේ.

(ඊ) ගුවන්විදුලිය මෙරට ප්‍රධානතම විද්‍යුත් මාධ්‍යය වශයෙන් පැවැති සමය ළමා ගී සාහිත්‍යයේ ස්වර්ණමය යුගය බව කියැ වේ. ඒ, එකල ළමා මනසට උචිත හා චරිත සංවර්ධනයට ඉවහල් වූ අරුත්බර ළමා ගී නිර්මාණ සම්භාරයක් දායාද වීම නිසා ය. වර්තමානයේ ගුවන්විදුලි නාළිකා විශාල ප්‍රමාණයක් හා ප්‍රබලතම විද්‍යුත් මාධ්‍යය ලෙස රූපවාහිනිය ක්‍රියාත්මක වුවත් ළමා ගී නිර්මාණය වීමට ඒවායේ දායකත්වයක් නොමැති තරම් ය. මෙකල ඇතැම් මාධ්‍ය මගින් විකාශනය කෙරෙන ළමා වැඩසටහන්වලදී ළමයින් ගායනා කරන්නේ ළමා මනසට අනුචිත හරසුන් ගීත ය. මේ නිසා ළමා චරිත සංවර්ධනයට බෙහෙවින් ම ඉවහල් වන ළමා ගීත බිහි කිරීමේ කාර්යභාරයට දායක වීම සියලු ම විද්‍යුත් මාධ්‍යවල වගකීමකි. (ලකුණු 25 යි)

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

එක් එක් විස්තරයට අදාළ වන්නේ පහත සඳහන් ප්‍රධාන අදහස් ය.

(අ) කුණු කසළ විධිමත් ව/ නිසි ලෙස බැහැර කරමු.
කුණු කසළ විධිමත් ව/ නිසි ලෙස බැහැර කිරීමේ අවශ්‍යතාව/ වැදගත්කම.

(ආ) ශ්‍රී ලංකාවේ බුද්ධිගලනය
ශ්‍රී ලංකාවේ උගතුන් රට හැර යාම
නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිඵල මව්බිමට ලබාදෙමු.

(ඉ) විදුලිය සුරකිමු/ සුරැකීමේ වැදගත්කම.
විදුලිය නාස්ති නොකරමු.
විදුලිය අරපිරිමැස්මෙන් භාවිත කරමු.

(ඊ) ළමාගීත කලාවක වැදගත්කම/ අවශ්‍යතාව
ළමාගීත හා චරිත සංවර්ධනය
විද්‍යුත් මාධ්‍යවල වගකීම හා ළමා ගීත

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25 යි රචනය හොඳින් කියවා ලකුණු දෙන්න.

| | | | |
|---|---|---|---|
| 1. | සාරවත් භාවය, මාතෘකාව ද ඇතුළු ව | - | ලකුණු 08 යි |
| 2. | සංවිධානය, නිර්මාණාත්මක භාවය හා ස්වීයත්වය | - | ලකුණු 12 යි |
| 3. | ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම | - | ලකුණු 05 යි |

01. සාරවත්භාවය - ලකුණු 07 යි
විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම - ලකුණු 01 යි

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යුහයට සමීප බව, සරුබව හා සමබව, වචන ගණන 250ට සමීපව පැවැතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ.

02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12 යි

මෙහිදී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශන, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදි අංග ගැන සලකා බැලිය යුතු ය.

03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05 යි

වියරණ, අත් අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම, පද වෙන් කොට ලිවීම යන අංග ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.


සැලකිය යුතුයි :

01. රචනයේ වචන ගණන දළ වශයෙන් 200ට වඩා අඩු වන කල්හි ඉහත දැක්වූ 1, 2, 3 යන කොටස්වලට අනුපාතික ව ලකුණක් තීරණය කෙරේ.
02. වැදගත් අදහස් හා සිත් ගන්නා ප්‍රකාශන ඇති තැන්වල (√) යොදන්න. වැරදි තැන්වල (x ) ලකුණු යොදන්න.
03. උක්තඛ්‍යාත සම්බන්ධ වැරදි තැන් යටින් ඉරක් අඳින්න. අක්ෂර වින්‍යාසය වැරදි වචන වටා රවුමක් අඳින්න.
04. 1, 2, 3 යන කොටස් සඳහා දෙන ලද ලකුණු උත්තරය අග හරස් අතට ලියා එකතු කර මුළු ලකුණු ලබාගන්න.

නිදසුන් $\frac{6}{8}$ $\frac{9}{12}$ $\frac{3}{5}$ $\frac{18}{25}$

සංලක්ෂ්‍යය : වාක්‍ය රචනා ඇගයීමට පෙර අදාළ ව්‍යුහය කියවා දළ සැලැස්මක් සකස් කරගන්න. ව්‍යුහයට කිසිසේත් අදාළ නොවන සේ ලියා ඇති රචනා ඇගයීමේදී සාරවත්භාවය සඳහා පිරිනැමිය යුත්තේ ඉතා අඩු ලකුණකි.


## 2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 96%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 25ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 06 ප්‍රාන්තරයේ 6%ක් ද,
ලකුණු 07 - 12 ප්‍රාන්තරයේ 18%ක් ද,
ලකුණු 13 - 18 ප්‍රාන්තරයේ 52%ක් ද,
ලකුණු 19 - 25 ප්‍රාන්තරයේ 24%ක් ද,

ලෙසින් ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 13ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගත් අයදුම්කරුවන් ප්‍රමාණය 76%කි. ලකුණු 06කට වඩා අඩුවෙන් ගත් අයදුම්කරුවන් ප්‍රමාණය 06%කි. සමස්තයක් වශයෙන් ගත් කල රචනා ප්‍රශ්නයට ලකුණු ලබා ගැනීම දුර්වල මට්ටමක පැවතුණි.




මෙම ප්‍රශ්නයෙහි (අ), (ආ), (ඉ) සහ (ඊ) යටතේ පිළිවෙළින් "කුණු කසළ බැහැර කිරීම", "බුද්ධි ගලනය", "විදුලිය සුරැකීම", "ළමා ගීත කලාව" යන මාතෘකා තේමා කරගනිමින් මාර්ගෝපදේශිත රචනා සඳහා විස්තරාත්මකව ව්‍යුහගත ඡේද 4ක් ඉදිරිපත් කර තිබුණි.

එක් එක් රචනා මාතෘකා අනුව (අ) කුණු කසළ බැහැර කිරීම තේමා කරගත් රචනයෙහි පහසුතාව 57%ක් ද (ආ) ශ්‍රී ලංකාවේ බුද්ධි ගලනය තේමාව කරගත් රචනයෙහි පහසුතාව 56%ක් ද (ඉ) විදුලිය සුරැකීම සහ (ඊ) ළමා ගීත කලාව යන තේමා යටතේ ඉදිරිපත්ව තිබූ රචනාවල පහසුතාව 52% බැගින් යුක්ත විණි.

සමස්තයක් ලෙස ගත් කල ප්‍රශ්නයෙහි මධ්‍යක පහසුතාව 54%ක් වන බැවින් රචනා ලිවීමේ නිපුණතාව අයදුම්කරුවන් තුළ තව තවත් වර්ධනය කළ යුතු බව පැහැදිලිය. ස්වකීය අදහස් නිදහස් ව හා නිර්මාණාත්මක ව ජනනය කරවීමටත් ඒවා විධිමත් ව, සංවිධානාත්මක ව නිරවුල් ව හා ව්‍යාකරණානුකූල ව ඉදිරිපත් කිරීමටත් සිසුන් යොමු කළ යුතුය.

රචනා මාතෘකාව හඳුනා ගැනීමට උපයෝගී කර ගැනීම සඳහා දී ඇති ඡේදයෙහි කරුණු ඉදිරිපත් කර ඇති රටාව සැලකිල්ලට ගැනීමෙන් රචනා සැකිල්ල යටතේ අයදුම්කරුවන්ගේ කරුණු සංවිධානය කර ගැනීමට පහසු වේ. වචන 250කට නො අඩු යන සීමාව 250-300 අතර ලෙස දැක්වීමෙන් අයදුම්කරුවන්ගේ නිදහස් ව ලිවීමේ හැකියාවට අවකාශයක් ලැබේ. අතිරේක වශයෙන් සම්භාව්‍ය ගද්‍ය පද්‍ය පොත පත කියවීම ද විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය පරිශීලනය කිරීම ද විශේෂයෙන්ම අන්තර්ජාලය ඇසුරෙන් නව ලෝකය පිළිබඳ ව රැස්කර ගත හැකි කරුණු ද සාර්ථක රචනා නිර්මාණය කිරීම සඳහා මහඟු අත්වැලක් කරගත හැකිය.

දී ඇති රචනා ව්‍යුහ අතරින් "ඉ" යටතේ ගෘහිත රචනා මාතෘකාව සඳහා අයදුම්කරුවන්ට මගපෙන්වීමක් ලෙස එම ව්‍යුහය පාදක කරගෙන විශ්ලේෂණාත්මකව සැකිල්ලක් සාදා ගෙන, ඒ ඒ යටතේ කරුණු සංශ්ලේෂණය කර ගනිමින් ඉදිරිපත් කිරීම තුළින් වචන 250 සීමාවට පහසුවෙන් ළඟා වීමට හැකිවන ආකාරයට පහත ආදර්ශනය උපයෝගී කරගත හැකිය.

2. (ඉ) ***විදුලිය අරපරිස්සමෙන් පරිභෝජනය කරමු***

*නූතන සමාජයට අත්‍යවශ්‍ය සම්පතක් වනුයේ විදුලියයි. මේ සඳහා ඉහළ පිරිවැයක් දැරීමට මහජනතාවට සිදුවුවත් ඔවුන්ගේ දෛනික කටයුතු සඳහා නැතුවම බැරි දෙයක් බවට විදුලිය පත් වී ඇත. දුප්පත් පෝසත් හෝ උගත් නූගත් හෝ පාලක පාලිත හෝ ගැමි නාගරික හෝ භේදයකින් තොරව හැම දෙනෙකුගේම අවශ්‍යතා සපුරා ගැනීමට විදුලිය ප්‍රයෝජනවත් වේ.*

*මෙරට  සෑම ගෘහ මූලිකයෙකුගේම අපේක්ෂාව වනුයේ විදුලිය ලබා ගැනීමයි. නිවාසවලට ආලෝකය සැපයීමටත් විවිධ ඉලෙක්ට්‍රොනික මෙවලම් ක්‍රියාත්මක කිරීමටත් විදුලිය තිබිය යුතුය. මහාමාර්ග හා අධිවේගී මාර්ගවල දිවා රාත්‍රී ආලෝකය සැපයීම, මාර්ගස්ථ සංඥා ක්‍රියාත්මක කිරීම ආදියට විදුලිය නොමැතිව බැරිය. මහල් ගණනාවක් සහිතව නිර්මිත නිවාස සංකීර්ණවල දිවා කාලයේ පවා පවත්නා අඳුර පළවා හැරීමට විදුලිය අවශ්‍ය වේ. රාජ්‍ය හා පෞද්ගලික ආයතන, වාණිජ මධ්‍යස්ථාන ආදියේ කාර්ය සාඵල්‍යය සඳහා විදුලිය බෙහෙවින්ම ඉවහල් වේ.*

*මෙසේ සමාජයට අත්‍යවශ්‍ය සම්පතක් වූ විදුලිය අරපරෙස්සමින් භාවිත කළ යුතු වේ. රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල අනවශ්‍ය හා අපරීක්ෂාකාරී ලෙස විදුලිය භාවිත කිරීම නිසා සෑහෙන මුදල් ප්‍රමාණයක් අපතේ යයි. දිවා රෑ ක්‍රියාත්මක වන විදුලිය පංකා, ශීතකරණ හා වායුසමන යන්ත්‍ර ගැන සිතීමේදී අපතේ යන විදුලිය කොතරම් දැයි සිතා ගත හැකිය. මහාමාර්ගවල දිවා කාලයේදී පවා දැල්වෙන විදුලි පහන් දකින විට අප හදවත් තුළ නැගෙන්නේ දැඩි වේදනාවකි දුකකි.*

*දිනෙන් දින ඉහළ යන විදුලිය අවශ්‍යතා අඛණ්ඩව ලබාදීමට රජය මැදිහත් වී ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපාර රාශියකි. මහාපරිමාන ජලවිදුලි බලාගාර කුඩා ගංගා ඇළ දොළ හරස් කර නිමැවූ ප්‍රාදේශීය විදුලි බල ව්‍යාපෘති, නොරොච්චෝල වැනි ගල් අඟුරු බලාගාර, හම්බන්තොට, පුත්තලම ආදී ප්‍රදේශවල සුළං බලය උපයෝගී කරගත් සුළං බලාගාර කැලණිතිස්ස වැනි තාප බලාගාර, ග්‍රාමීය මට්ටමෙන් හඳුන්වා දී ඇති ජීව වායු බලශක්තිය පමණක් නොව සූර්ය තාපය වැනි උපාය මාර්ග මගින් පාරිභෝගික අවශ්‍යතා සම්පූර්ණ කිරීමට උත්සාහ ගෙන තිබීම පාරිභෝගිකයන්ට අස්වැසිල්ලකි.*

*එමෙන් ම සමාජයට එරෙහිවන්නෝ අධිබල රැහැන් තුළින් විදුලිය සොරා ගැනීම, මද්‍යසාර නිෂ්පාදනය, සත්ත්ව ඝාතනය, දැව විනාශය, මැණික් පතල් හෑරීම් වැනි නීති විරෝධී ක්‍රියා සඳහා ද විදුලිය අයථා ක්‍රම මගින් පරිහරණයට ගැනීම අපතේ යාමකි. නගරයේත්, ගමේත් අලුතින් ඉදිවී එන මංමාවත්වලට සමීප කුඩා වෙළඳ කුටි සඳහා කුටිය පුරා අධි වෝල්ටීයතාවෙන් යුත් විදුලි ලාම්පු දැල්වීම, වර්ණගැන්වීම, දැන්වීම් පුවරු ප්‍රදර්ශනය ආදී ක්‍රියා අවම කිරීම සඳහා ජනමාධ්‍ය හා පාසල් මගින් ප්‍රජාව දැනුවත් කළ යුතුය.*

*විදුලිය යනු ජල විදුලියෙන් හෝ තාප විදුලියෙන් හෝ වෙනත් බලයකින් හෝ උපයාගත් බලශක්තියකි. එය නිසිලෙස භාවිත කරමින් ප්‍රයෝජනයට ගැනීම හා අරපරිස්සමෙන් යුතුව භාවිත කිරීම සඳහා මහජනතාව පෙලඹිය යුතු වේ.*

*මේ අනුව අවිධිමත් පරිභෝජන රටා හා වංචනික ක්‍රියා අවම කිරීමෙන් අපතේ යන විදුලි ඒකක ප්‍රමාණය ජාතික විදුලිබල පද්ධතියට ශේෂ කොට විදුලිය කප්පාදු කිරීම හා බිඳවැටීම් තුළින් සිදුවන අනර්ථ වළක්වා සංවර්ධන කාර්ය හා ගෘහස්ථ කටයුතු සඳහා උපරිම ආකාරයෙන් යොදා ගෙන "විදුලිය අරපරිස්සමින් පරිභෝජනය කරමු."  යන්න වචනයට සීමා නොකොට ක්‍රියාවෙන් ද සාක්ෂාත් කිරීමට උත්සුක වෙමු.*

## 03 ප්‍රශ්නය

අපේක්ෂණය :

දෙන ලද ඡේදයක් සංක්ෂේප කොට ලියා දැක්වීම මෙහිදී අපේක්ෂා කෙරේ. අයදුම්කරුවන්ගේ සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියා මෙන්ම භාෂා භාවිතය පිළිබඳ දැනුම ද මෙහිදී පරීක්ෂා කෙරේ. විස්තර වර්ණනා බැහැර කරමින් එහි හරය වටහා ගෙන ඒ ඇසුරින් සමස්ත අර්ථය තම වචනයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාව මෙහිදී ඇගයේ.

අයදුම්කරුවන් තුළ සාරාංශකරණය පිළිබඳ මනා පළපුරුද්දක් තිබිය යුතුය. ඒ සඳහා නිරන්තර අභ්‍යාසවල යෙදීම අනිවාර්ය වේ. මේ සඳහා අපේක්ෂිත සාරාංශය පිළිබඳ පැහැදිලි අදහසක් ලබාදී තිබේ.

**3.** පහත දැක්වෙන ඡේදය වචන **50 - 60** අතර ගණනකින් යුක්ත වන සේ **සාරාංශ කොට ලියන්න.** ඔබේ සාරාංශයේ වචන සංඛ්‍යාව උත්තරය අග ලියන්න.

අපේ පුරෝගාමී ඉතිහාසඥයකු හා පුරා විද්‍යාඥයකු වන මහාචාර්ය පරණවිතාන මහතා කියන්නේ ඉතිහාසය පවා හැඩගැස්වීමට වෘක්ෂලතාදිය හේතුකාරක වන බවයි. මනුෂ්‍යවාසයක් පවා ඇතිව තිබෙන්නේ අනිවාර්යයෙන් ම වෘක්ෂලතාදිය නොඅඩු ව වැවෙන ප්‍රදේශ පාදක කොටගෙන බව එතුමා අපට ඒත්තු ගන්වයි. රටක වෘක්ෂලතාදිය ඇතිවෙන්නේ එහි දේශගුණය, පස ආදි භූගෝලීය සාධකයන් මුල්කරගෙන ය. තව ද ඒ වෘක්ෂලතාදිය අනුව ඒ රටේ ඉතිහාසයත් එක්තරා ප්‍රමාණයකට හැඩ ගැසෙන බව ද කිව යුතුයි. මනුෂ්‍යවාසයක් ඇති වී තිබෙන්නේ මිනිසාගේ පැවැත්ම සඳහා ඉවහල් වන වෘක්ෂලතාදිය පහසුවෙන් වගා කළ හැකි ප්‍රදේශවල ය. පරිසරය ද, වෘක්ෂලතාදිය ද නිසියාකාරව ආරක්ෂාවීම ජන ජීවිතයෙහි පැවැත්මට මහත් ම ආධාරයක් වන බව ඉන් ගම්‍යමාන වේ. එහෙත් වෘක්ෂය පිළිබඳ පුරාණයේ තිබූ සැලකිල්ල අද දින බොහෝ සේ මිය ගොස් ය. වෘක්ෂ විනාශය අද දින ජාතික ප්‍රශ්නයක් බවට පත් ව ඇත.

අවිචාරවත් ලෙස වෘක්ෂ විනාශ කිරීම හේතු කොට ගෙන ලක්දිව ඇතැම් පෙදෙස් කාන්තාර වීමේ ලකුණු පළ කරන බව සඳහන් වේ. කෙළවරක් නොමැති ව කෙරෙන්නාවූ වෘක්ෂ විනාශය තුළින් ජනිත කරන්නාවූ අයහපත් ප්‍රතිඵල අනාගතයේදී අපට භුක්ති විඳීමට සිදුවනු ඇතැයි දේශීය මෙන් ම විදේශීය බුද්ධිමත්තු ද පෙන්වා දී ඇත්තාහ. මෙහිදී සිහිපත් කළ යුතු විදේශීය පඬිවරයකු නම් ආර්.එල්.බ්‍රෝහියර් මහතාය. ලංකාවේ අනතුරට පත් වනාන්තර පිළිබඳ ව ඔහු කතා කොට ඇත්තේ වේදනාබර හදවතකිනි. ආධ්‍යාත්මික වශයෙන් ඉතා ප්‍රබෝධජනක වූ ද, ඇසට ඉතා සංතෘප්තිකර දර්ශනයක් වූ ද, වනාන්තර ඉතා ආසන්න අනාගතයේදී ම පුරාවෘත්තයක් බවට පත් වේයැයි යනුවෙන් බ්‍රෝහියර් මහතා අනතුරු අඟවයි. *(ලකුණු 10 යි)*

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

| | | |
|---|---|---|
| ලකුණු විග්‍රහය | - | මුළු ලකුණු 10 යි. |
| අන්තර්ගතය | - | ප්‍රධාන අදහස් සඳහා ලකුණු 06 යි. |
| වචන ගණන | - | ලකුණු 02 යි. (වචන 50 - 60 අතර තිබීම සෑහේ.) |
| ශිල්පීය දක්ෂතා | - | ලකුණු 02 යි. (ව්‍යාකරණ, අත් අකුරු, විරාම ලක්ෂණ ආදිය) |


අපේක්ෂිත ප්‍රධාන අදහස් :

- මනුෂ්‍ය ජීවිතයේ (මනුෂ්‍යයාගේ) පැවැත්මට වෘක්ෂලතාදිය අවශ්‍ය වන බව
- වෘක්ෂලතාදිය කෙරෙහි සැලකිල්ලක් නොදැක්වීමත් ඒවා විනාශ කිරීමත් කාන්තාර ඇති වීමට හේතු වන බව
- වෘක්ෂලතාදිය ඇසට ප්‍රියජනක දර්ශනයක් බව
- ඒ නිසා වෘක්ෂලතාදිය රැකගත යුතු බව
- වෘක්ෂලතාදිය නිසා රටක ඉතිහාසය හැඩ ගැසෙන බව
- වන විනාශයේ අයහපත් ප්‍රතිඵල අනාගතයේ දී භුක්ති විඳීමට සිදුවන බව බොහෝ උගතුන් පෙන්වා දී ඇති බව

වචන ගණන 65 ඉක්මවන කල්හි සැලකිය යුත්තේ මුල් වචන 60 තුළ ඇති ප්‍රධාන අදහස් පමණි. වචන ගණන 45 ට අඩුවන කල්හි එහි ඇතුළත් අදහස් ගණනය කොට ඊට සුදුසු අනුපාතික ලකුණක් පිරිනමන්න. උත්තරය ඡේදයක් සේ ලියා තිබිය යුතුය. කොටුවක් තුළ පද බෙදා තිබුණ ද පිළිගන්න. එක යට එක අසම්බන්ධිත වාක්‍ය වශයෙන් ලියා ඇත්නම් අන්තර්ගතයට දිය හැකි උපරිම ලකුණු ගණන 02 කි. වචන ගණනයේ දී ලිහිල් පිළිවෙතක් අනුගමනය කරන්න. වචන ගණන දළ වශයෙන් 65 ට වැඩිවන කල්හි හෝ 45 ට අඩුවන කල්හි වචන ගණන සඳහා ලකුණු 01 හෝ 02 හෝ පිරිනමන්න.

3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන

ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය




මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය 63%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 4%ක් ද,
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 22%ක් ද,
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 43%ක් ද,
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 31%ක් ද,

ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා හිමි ලකුණු 10න් හරි අඩකට වැඩියෙන් එනම් ලකුණු 6ක් හෝ වැඩි ප්‍රමාණයක් හිමිකරගෙන ඇති අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය 74%කි. ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලබාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 26%ක් පමණකි.

අනිවාර්යය ප්‍රශ්නයක් වූ සාරාංශකරණය සඳහා ඉදිරිපත් වන ශිෂ්‍ය ප්‍රමාණය ඉහළ මට්ටමක් වුවද ඔවුන්ගෙන් 74%ක බහුතරයක් ප්‍රශ්නය සඳහා ප්‍රදානය කෙරෙන ලකුණුවලින් අඩකට වැඩියෙන් ලබා ගැනීමට සමත් වී ඇත. ඒ අනුව ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 63% තෙක් වර්ධනය වී ඇත.

අයදුම්කරුවන් තුළ සාරාංශකරණය පිළිබඳව මනා පුහුණුවක් තිබිය යුතුය. ඒ සඳහා නිරන්තර අභ්‍යාසවල යෙදීම අනිවාර්ය වේ. මේ සඳහා අපේක්ෂිත සාරාංශකරණය සඳහා ආකෘතියක් පහත දක්වා ඇත.

**සාරාංශකරණය**

රාජ්‍යයක ඉතිහාසය හැඩ ගැස්වීමටත්, මිනිසාගේ ජන ජීවිතයටත්, වෘක්ෂලතාදිය අවශ්‍ය ම ය. පරිසරාත්මකව වැඩෙන වෘක්ෂලතා පිළිබඳව නොසැලකිලිමත් වීමත්, ඒවා විනාශ කිරීමත් නිසා ලාංකේය ප්‍රදේශ කාන්තාර බවට පත්වීමට හේතු වේ. ආධ්‍යාත්මිකවූත් ප්‍රබෝධජනකවූත් සංතෘප්තිකර දර්ශනයක් වූ වනාන්තර විනාශ කිරීම වර්තමානයේ ජාතික ප්‍රශ්නයක් ව ඇත. මෙහි අයහපත් ප්‍රතිඵල ජනතාවට අනාගතයේදී භුක්ති විඳීමට සිදුවේ යැයි බොහෝ උගත්තු පෙන්වා දෙති. (වචන 54)

04 ප්‍රශ්නය

අපේක්ෂණය : අපේක්ෂකයින්ගේ භාෂා ඥානය හා අවබෝධය පරීක්ෂා කෙරෙන්නකි. මේ සඳහා නිර්දිෂ්ට ඡේදයක් ආශ්‍රයෙන් ප්‍රශ්න 5ක් ඉදිරිපත් කෙරේ. මේ ප්‍රශ්න මනාව අවබෝධ කරගෙන නිශ්චිත ව නිවැරදි පිළිතුරු ලිවීම අපේක්ෂා කෙරේ.

**4.** පහත දැක්වෙන **ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට** උත්තර සපයන්න.

දහතුන් වැනි සියවසේ දී සිදු වූයේ රජරටේ බලය අහිමි වූ පාලකයින් මායා රටට යාම නො වේ. රාජධානිය මාඝ විසින් අල්ලාගනු ලැබූ පසු මායා රටේ සහ රෝහණයේ ප්‍රාදේශික අධිපතීන් පිරිසක් ඒ විදේශිකයන්ට පක්ෂපාත නො වී සිටියහ. ඔවුහු ස්වාධීන පාලකයන් හැටියට ක්‍රියා කරන්නට පටන් ගත්හ. නෙරපා දමනු ලැබූ කුලීනයනුත් ඔවුන්ගේ දාසයනුත් රජරටේ දී විඳින්නට සිදු වුණු පීඩාවලින් බේරී ජීවත් වන්නට පැමිණි සෙස්සනුත් නිසා මේ පෙදෙස්වල ජනගහනය වැඩී වී ගියේ ය. ඒ වන විට තෙත් කලාපයේ තිබුණු කුඹුරු ප්‍රමාණය සීමා සහිත වූ හෙයින්, මේ වැඩි වූ ජනසංඛ්‍යාවට එයින් ආහාර සැපයීම උගහට විය. එහෙයින් මෙතෙක් වගා නොකර තිබුණු ලොකු කැලෑ යායවල් එළි කර කුඹුරු බවට හෝ වතු බවට හරවන ලදි. මේ වනාහි I පරාක්‍රමබාහු රජු මායා රටේ පමණක් රජකම කරද්දී පස්දුන් කෝරළේ වගුරු බිම් අස්වැද්දීමෙන් පටන් ගත් වැඩ පිළිවෙළ වඩා පුළුල් ලෙස දිගට ම කර ගෙන යෑමකි. අලුත් ප්‍රදේශයේ ස්වභාවයට හැඩ ගැසෙන්නටත් කෑම් බීම් අතින් අලුත් පුරුදු ඇති කර ගන්නටත් වියළි කලාපයේ සිට තෙත් කලාපයට සංක්‍රමණය කළ අයට සිදු වූයේ ය. රජරට සිටිය දී පුරුදු ව සිටි ගිතෙල් සහ තලතෙල් මෙහි සුලබ නො විය. එහෙයින් පොල්තෙල්වල රස බලන්නට ඔවුන්ට සිදු විය. ලොකු බිම් යායවල පොල් වගා කරන ලදි. II පරාක්‍රමබාහු රජුගේ කාලයේ දී කළුතර සහ බෙන්තොට අතර වෙරළබඩ තීරය එළි කර පොල් වගා කරන ලද බව කියා තිබේ. එකල පොල් වෙළෙඳ බඩුවක් හැටියට පිටරට යවන ලද්දේ දැයි දැන ගන්නට නැත. එහෙත් කුරුඳු ගසත් එහි සුවඳ පොතුත් ගැන සිංහල පොත්පත්වල පළමුවරට සඳහන් වන්නේ දඹදෙණි යුගයේ දීය.

(i) මේ ඡේදයේ සඳහන් පරිදි විදේශීය ආක්‍රමණයෙන් පසුව ස්වාධීන පාලකයන් වශයෙන් කටයුතු කළෝ කවරහු ද?
(ii) වැඩි වූ ජනගහනයට ආහාර සැපයීම සඳහා යෙදූ උපක්‍රමය කුමක් ද?
(iii) මේ ඡේදයේ සඳහන් වන රජරට රාජධානිය අල්ලා ගත් ආක්‍රමණිකයාගේ නම කුමක් ද?
(iv) වියළි කලාපයේ සිට සංක්‍රමණය වූ පිරිසට අලුතින් ආහාරයට ගැනීමට සිදු වූ තෙල් වර්ගය කුමක් ද?
(v) කතුවරයා සඳහන් කරන අන්දමට පළමුවරට කුරුඳු පිළිබඳ සාක්ෂිය හමුවන්නේ කවර යුගයේ ද?

*(ලකුණු 10 යි)*

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(i) මායා රටේ සහ රෝහණයේ ප්‍රාදේශික අධිපතීන් පිරිසක්


(ii) මෙතෙක් වගා නොකර තිබුණු ලොකු කැලෑ යායවල් එළි කර කුඹුරු බවට හෝ වතු බවට හැරවීම/ හරවා වගා කිරීම

(iii) මාඝ/කාලිංග


(iv) පොල්තෙල්

(v) දඹදෙණිය යුගයේ දී/දඹදෙණිය

4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




4 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 95%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 4%ක් ද,
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 6%ක් ද,
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 14%ක් ද,
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 76%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 06ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 65%ක් වන අතර, 14%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 02ක් හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට අයත් කොටස් 5 අතුරෙන් පිළිතුරු සැපයීම වඩාත් සාර්ථක වී ඇත්තේ v වන කොටස සඳහා ය. එහි පහසුතාව 97% ඉක්මවයි. පිළිවෙළින් II වන කොටසේ පහසුතාව 91%ක්ද, III වන කොටසේ පහසුතාව 90%ක්ද, iv වන කොටසේ 88% ලබාගෙන තිබුණ අතර, පහසුතාව අඩුම කොටස වන්නේ 59% ගත් I වන කොටසයි.

ඉදිරිපත් කර ඇති ඡේදය ඇසුරින් අපේක්ෂිත අයදුම්කරුවන්ගෙන් අවබෝධය මැනීම තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා බාහිර පත පොත, මුද්‍රිත සඟරා ආදිය පරිශීලනය සඳහා අයදුම්කරුවන් යොමු කරලීම මෙන්ම අර්ථාවබෝධ අභ්‍යාස සඳහා පන්ති කාමරය තුළ හුරු කිරීම ද කළ යුතුය.

දෙන ලද පාඨය කියවා තේරුම් ගැනීමේ හැකියාව ඉක්මවන තරම්ය. අසන ලද ප්‍රශ්නයට පිළිතුරු උකහා ගැනීමට ඡේදය හෝ වාක්‍යය කීපයක් එකට එකතු කොට දීර්ඝ පිළිතුරු ලිවීමට උත්සාහ ගෙන ඇත. අදාළ පිළිතුර ඍජුව තෝරා ගෙන පිළිතුරු ලිවීම සඳහා අයදුම්කරුවන් යොමු කළ යුතුව ඇත.

මේ ප්‍රශ්නයට පිළිතුරු සැපයීම වඩාත් සාර්ථක මට්ටමක පැවති බව පෙනේ. අවබෝධය පිළිබඳ ව විමසා තිබූ ප්‍රශ්න 5න් මුල් ප්‍රශ්න 4හිම පහසුතා 70% ඉක්මවා තිබිණි. ඒ අනුව මෙම ප්‍රශ්නයෙහි සමස්ත පහසුතාව 74%ක පමණ ඉහළ අගයක් ගන්නා අතර II පත්‍රයෙහි ප්‍රශ්න පහ අතුරෙන් පහසුතාව වැඩිම ප්‍රශ්නය බවට මෙම ප්‍රශ්නය පත්ව තිබේ.

මේ තත්ත්වය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා බාහිර පොත් පත් පරිශීලනයට සිසුන් උනන්දු කරවීම ගුරුභවතුන්ගේ කාර්යයකි. එහිලා දුරවබෝධ වචනවල අර්ථාවබෝධයට ද සිසුන් යොමු කළ යුතු වෙයි.

### 05 ප්‍රශ්නය

අපේක්ෂණය : මෙහි එක් ප්‍රශ්නයක් වන්නේ රාජකාරි ලිපියක් ලිවීමයි. එහිම අනෙක් ප්‍රශ්නය වනුයේ පුවත්පත් වාර්තාවක් සකස් කිරීමයි. මෙබඳු ප්‍රශ්න මගින් නූතන සමාජයෙහි විවිධ ප්‍රායෝගික ලේඛන පිළිබඳ අධ්‍යයනය හා ඒවා සිත් ගන්නා පරිදි නිර්මාණාත්මකව ලියා දැක්වීමත් පිළිබඳ අපේක්ෂකයින්ගේ කුසලතාව විමර්ශනය කෙරේ.

**5.** උතුරු සත්සිරිපුර ප්‍රදේශයට විදුලි බලය ලබා දීම සඳහා අදාළ විදුලි රැහැන් ඇදීම ආදි මූලික කටයුතු නිම කොට මාස දහයක් පමණ ගත වී ඇතත් තවමත් විදුලිබල සැපයුම ලබා දී නොමැත. පවුල් 200කට අධික පිරිසක් ප්‍රදේශයේ ජීවත් වන අතර, ඉන් බහුතරයක් මේ වන විටත් විවිධ ස්වයං රැකියා කටයුතුවල නිරත වෙමින් සිටිති. ඔවුන්ට මෙන් ම පාසල් සිසුනට ද විදුලිය ලැබීමෙන් ස්වකීය කාර්යයන් පහසු වනු ඇත. මේ කරුණු සැලකිල්ලට ගනිමින් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වන සපුමල් බණ්ඩාර ඔබ යයි සිතා සත්සිරිපුර විදුලිබල මණ්ඩලයේ අධිකාරී වෙත, කඩිනමින් විදුලිබල සැපයුම ලබා දෙන ලෙස කෙරෙන ඉල්ලීම සහිත රාජකාරි ලිපියක් සකස් කරන්න.
(මේ සඳහා වචන **100**ක් පමණ ප්‍රමාණවත් ය.)

**නැතහොත්**

ශාකවල විවිධ කොටස් වැනි දේශීය අමුද්‍රව්‍ය භාවිතයෙන් දර්ශනීය සුබපැතුම්පත් හා බිත්ති සැරසිලි ආදි විසිතුරු නිර්මාණ සකස් කිරීමට පුහුණු කිරීමේ වැඩමුළුවක් පසුගිය දා සමගිපුර සංස්කෘතික මධ්‍යස්ථානයේ දී පැවැත්විණි. වැඩමුළුව අවසානයේ නිර්මාණ ප්‍රදර්ශනයක් ද සංවිධානය කෙරිණි. ප්‍රදර්ශනය නැරඹීමට ප්‍රදේශවාසීහු සහභාගී වූහ. දිස්ත්‍රික් සංස්කෘතික නිලධාරිතුමා ප්‍රධාන අමුත්තා විය. එතුමා ප්‍රදර්ශනය විවෘත කරමින් කළ කතාව හැමදෙනාගේම ප්‍රසංශාවට භාජනය විය. සමගිපුර මාණ්ඩලික වාර්තාකරු ඔබ යයි සිතා ඉහත කරුණු ආශ්‍රයෙන් පුවත්පත් වාර්තාවක් සකස් කරන්න. යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.
(මේ සඳහා වචන **100**ක් පමණ ප්‍රමාණවත් ය.)

*(ලකුණු 15 යි)*

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

රාජකාරි ලිපිය

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 15 යි.

| | | |
|---|---|---|
| 1. | ආකෘතිය සඳහා ලකුණු | 04 |
| 2. | අන්තර්ගතය සඳහා ලකුණු | 08 |
| 3. | ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු | 03 |

01. ආකෘතිය සඳහා ලකුණු 04 :

| | | |
|---|---|---|
| යවන්නාගේ නම, තනතුර, ලිපිනය සහ දිනය | - | ලකුණු 01 |
| ලබන්නාගේ ලිපිනය | - | ලකුණු 01 |
| ආමන්ත්‍රණය (මාතෘකාවට පෙර යොදා තිබිය යුතුය) | - | ලකුණු 01 |
| මාතෘකාව සහ අත්සන | - | ලකුණු 01 |

(යවන්නාගේ තනතුර, යවන්නාගේ ලිපිනය තුළ හෝ ලිපිය අවසානයේ හෝ සඳහන් වී තිබිය යුතු යි. රාජකාරි ලිපි සඳහා නිර්දේශිත ආකෘති 2 ම නිවැරදි සේ පිළිගැනේ.)

02. අන්තර්ගතය සඳහා ලකුණු 08 :

- සත්සිරිපුර ප්‍රදේශයට විදුලිය රැහැන් ඇදීමේ මූලික කටයුතු නිමවී මාස දහයක් ගතවී ඇතත් තවම විදුලිය නොමැති බව

**ලකුණු 02 (එක් කරුණකට ලකුණු 01 බැගින්)**

- පවුල් සංඛ්‍යාව 200 කට අධික පිසක් ප්‍රදේශයේ ඝීවත්වීම හා බහුතරයක් ස්වයං රැකියාවල නියැලීම

**ලකුණු 02 (එක් කරුණකට ලකුණු 01 බැගින්)**

- විදුලිය ලැබීමෙන් පාසල් සිසුන්ගේ කාර්යයන් පහසු වීම

**ලකුණු 02 (එක් කරුණකට ලකුණු 01 බැගින්)**

- සත්සිරිපුර ප්‍රදේශයට විදුලිය ලබාදෙන ලෙස ඉල්ලීම

**ලකුණු 02**

03. ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 03 :

නිවැරදි අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ, විරාම ලක්ෂණ, පැහැදිලි අත් අකුරු, උක්ත ආඛ්‍යාත සම්බන්ධය, ඡේද වෙන් කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනැමේ. නියමිත වචන ගණන අඩුවන කල්හි හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි හෝ අනුපාතික ලකුණක් පිරිනැමේ.

**අත් පත්‍රිකාව**

ලකුණු 15 යි. 1, 2, 3 යන අංශ සඳහා වෙන් වෙන්ව ලකුණු දී එම ලකුණුවල එකතුව ලබාගැනේ.

1. ආකෘතිය - ලකුණු 04
2. අන්තර්ගතය - ලකුණු 08
3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03

1. ආකෘතිය
- මාතෘකාව - ලකුණු 02 යි
- වාර්තාකරු - ලකුණු 01 යි
- නිර්මාණශීලිබව - ලකුණු 01 ය

2. අන්තර්ගතය
1. දේශීය අමුද්‍රව්‍ය භාවිතය - ලකුණු 01 යි
2. දර්ශනීය සුභ පැතුම් පත් - ලකුණු 01 යි
3. බිත්ති සැරසිලි - ලකුණු 01 යි
4. පුහුණු කිරීමේ වැඩ මුළුව - ලකුණු 01 යි
5. ස්ථානය (සමගිපුර සංස්කෘතික මධ්‍යස්ථානය) - ලකුණු 01 යි
6. නිර්මාණ ප්‍රදර්ශනය - ලකුණු 01 යි
7. ප්‍රදේශවාසින් සහභාගී වීම - ලකුණු 01 යි
8. ප්‍රධාන අමුත්තා (දිස්ත්‍රික් සංස්කෘතික නිලධාරී තුමා) - ලකුණු 01 යි

3. ශිල්පීය දක්ෂතා (ලකුණු 03 යි)

නිවැරදි අක්ෂර වින්‍යාසය, පැහැදිලි අත් අකුරු, නිවැරදි පද බෙදීම, ව්‍යාකරණ, විරාම ලක්ෂණ, ඡේද වෙන් කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනැමේ.

- නියමිත වචන ගණන අඩුවන කල්හි හෝ අදාළ කරුණු ප්‍රමාණවත් ව අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි හෝ අනුපාතික ලකුණක් පිරිනැමේ. (ලකුණු 15 යි)

ලියන්නාගේ නම/තනතුර
ලියන්නාගේ ලිපිනය
දිනය :

ලබන්නා
ලිපිනය

ආමන්ත්‍රණය

ලිපි ශීර්ෂය

* ලිපිය ලිවීමේ අරමුණ
* සම්බන්ධතාව
* අදාළත්වය/විස්තරය
* වර්තමාන ස්වභාවය/තත්ත්වය
* ඉල්ලීම/අවධානය

යොමුව
අත්සන
(නම)

මාතෘකාව

* ................................... “...................................”
....................................... .......................................
....................................... .......................................

* ................................... * ...................................
....................................... .......................................
....................................... .......................................

* ................................... * ...................................
....................................... .......................................
....................................... .......................................


* ................................... වාර්තාකරු ................
....................................... ඡායාරූපකරු .............
.......................................

රාජකාරි ලිපි කවරය

| ලියාපදිංචි තැපැල | |
|---|---|
| යවන්නාගේ නම | ලබන්නාගේ නිලය |
| යවන්නාගේ ලිපිනය | ලබන්නාගේ නිල කාර්යාලය |
| ලිපි බෙදන කන්තෝරුව | ලබන්නාගේ ලිපිනය |


**5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය




5 ප්‍රශ්නය සඳහා තෝරාගෙන ඇති අපේක්ෂකයින් සංඛ්‍යාව .......%කි. ලකුණු 15ක් හිමිවන මෙම ප්‍රශ්නය සඳහා
ඉන් ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 4%ක් ද,
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 9%ක් ද,
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 31%ක් ද,
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 56%ක් ද,
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය යටතේ සිසුන්ගේ පහසුව සඳහා (අ) සහ (ආ) යටතේ තෝරාගෙන පිළිතුරු ලිවීමේ අවස්ථාව සලසා දී ඇත. පහසුතා පිළිතුරු සැපයීම වෙනුවට අපේක්ෂකයින් නිරවුල් අවබෝධයෙන් මෙම ප්‍රශ්නය තෝරාගත යුතු වුවද පිළිතුරු පත්‍ර පරීක්ෂා කිරීමේදී (ආ) කොටස තෝරාගෙන පිළිතුරු අඩක් ලියා යළි එය කපා හැර (ආ) කොටස ලියා තිබුණි.




5 ප්‍රශ්නයේ (අ) කොටස සඳහා අපේක්ෂකයින් පහසුතාව 73%ක්ද, (ආ) කොටසෙහි අපේක්ෂකයින් පහසුතාව 73%ක්ද, පිළිතුරු සපයා තිබුණි.

ප්‍රායෝගික ලේඛන යටතේ සැකසුණු රාජකාරි ලිපිය ආකෘතිය සඳහා ලකුණු 04ක්ද, අන්තර්ගතය සඳහා ලකුණු 08ක්ද සහ ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 03ක්ද වෙන් කර ඇත.

මෙහිදී අන්තර්ගතයේ ඇති ප්‍රධාන කරුණු හඳුනා ගැනීමට සිසුන් හුරුකළ යුතුය. එසේ වූ කල්හි අන්තර්ගතයට හිමි ලකුණු හිමි කර ගැනීමට අපේක්ෂකයින්ට පහසුවේ.

පුවත්පත් වාර්තාවේදී ලකුණු ප්‍රදානය අනුව අන්තර්ගතයට ලකුණු 08කි. එහිදීද අදාළ කරුණු අන්තර්ගත කොට ඇති විටෙක ඉහළ ලකුණු හිමිවේ.

මෙම ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම සතුටුදායකය. රාජකාරි ලිපි මෙන්ම පුවත්පත් වාර්තා නිවැරදි ආකෘතියකට අනුව ලිවීම හුරු කළ යුතුය. පහසුතා මට්ටම ඉහළ මෙබඳු ප්‍රශ්න සඳහා සතුටු දායක පිළිතුරු ලිවීමට නිරවුල් අවබෝධයක් ලබාගැනීම පිණිස ආදර්ශ ලිපියක් හා පුවත් පත් වාර්තාවක ආදර්ශ පහත දක්වා ඇත.

## 2.3 III ප්‍රශ්න පත්‍රය

### 2.3.1 III ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

**කාලය පැය 02 යි. මුළු ලකුණු** 80 කි.


සිංහල භාෂාව හා සාහිත්‍යය III ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 7කින් සමන්විතය.
මෙහි 1, 2, 3, 4 ප්‍රශ්න අනිවාර්ය වේ.

නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳව අපේක්ෂකයින්ගේ අවබෝධය විචාරාත්මක හා තර්කානුකූල දැනුම, භාෂා ඥානය, සාහිත්‍යාවබෝධය හා රසවින්දන හැකියාව පරීක්ෂා කෙරෙන පළමු ප්‍රශ්නය සඳහා අනුකොටස් දහයක් ඇතුළත් වේ. එක් අනු ප්‍රශ්නයක එක් කොටසකට ලකුණු 1 බැගින් මුළු ලකුණු 20කි.

නිර්දිෂ්ට සාහිත්‍ය ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම කෙරෙයි.

### 2.3.2 III ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන

III පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, ප්‍රස්තාර 5, 6 හා 7 ඇසුරෙන් සකස් කර ඇත. එක් එක් ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර, ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමග දක්වා ඇත.




(RD/16/04/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

දෙවන ප්‍රශ්නය යොමු වන්නේ නිර්දිෂ්ට ග්‍රන්ථවල යෙදූ භාෂාවේ අර්ථාවබෝධය පිළිබඳ අයදුම්කරුවන් සතු දැනුම පරීක්ෂා කිරීමට ය. මෙහිදී නිර්දිෂ්ට පාඨ හතරක් ලබාදෙන අතර ඒ පාඨ හතරෙහි සඳහන් තද කළු අකුරින් සඳහන් වචන අට සඳහා අරුත් ලියා අනතුරුව සමස්ත පාඨවල අර්ථය සරල බසින් ලියා දැක්වීම කළ යුතු ය. මේ සඳහා එක් කොටසකට ලකුණු 5 බැගින් ලකුණු විස්සකි.

3-4 ප්‍රශ්න නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ අපේක්ෂකයින්ගේ විශ්ලේෂණාත්මක දැනුම ඇගයීම මූලික අපේක්ෂාවයි. මෙහිදී “නැතහොත්” යන්නෙන් අයදුම්කරුවන්ට විකල්ප ප්‍රශ්නයක් තෝරා ගැනීමට ද හැකියාව ඇත.

3, 4 ප්‍රශ්න දෙකේම මේ ලෙසින් විකල්ප ප්‍රශ්න තෝරා ගත හැකිය මේ සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් හිමි වේ.

සිංහල භාෂාව හා සාහිත්‍යය III පත්‍රයේ 2, 3, 4 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම අනිවාර්ය වූ අතර එහි 2 වන ප්‍රශ්නය සඳහා පහසුතාව 49%කි.

3 වන ප්‍රශ්නය කොටස් 2කින් සමන්විත වූ අතර වැඩිම පහසුතාව 76%ක් ලබාගෙන ඇත්තේ 3 වන ප්‍රශ්නයේ II කොටසට වේ. එහි I කොටසට පහසුතාව 63%කි. එය 3, 4 ප්‍රශ්නවල අඩුම පහසුතාවය වේ.

4 වන ප්‍රශ්නය ද කොටස් දෙකකින් යුක්ත වන අතර II කොටසේ පහසුතාව 68%ක් වන විට I කොටසේ පහසුතාව 64%කි.

5, 6, 7 ප්‍රශ්නවලින් අපේක්ෂකයින්ගේ පිළිතුරු සැපයිය යුත්තේ එක් ප්‍රශ්නයකට පමණි. මෙහි අභිමතාර්ථය වනුයේ නිර්දිෂ්ට ග්‍රන්ථ ආශ්‍රිතව අපේක්ෂකයින් තුළ පවත්නා විශ්ලේෂණාත්මක, විචාරාත්මක, තර්කානුකූල දැනුම හා රසඥතාව මැන බැලීමයි. මේ සඳහා ලකුණු 10ක් වෙන් කර ඇත. මෙකී ප්‍රශ්න අපේක්ෂක තෝරා ගැනීම මත සැකසුණකි. මෙහිදී වැඩිම පහසුතාව 68% ලබාගෙන ඇත්තේ 6 වන ප්‍රශ්නයට වේ. දුෂ්කරම පහසුතාව 48%ක් වූ අතර එය 5 වන ප්‍රශ්නය සඳහා ලබා ගෙන තිබුණි.

01. ප්‍රශ්නය

අපේක්ෂණය : නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම

ව්‍යුහය හා ලකුණු විග්‍රහය : මුළු ලකුණු 20යි.
මෙම ප්‍රශ්නයට කෙටි පිළිතුරු අපේක්ෂිත අනුකොටස් දෙක බැගින් යුත් කෙටි ප්‍රශ්න දහයක් ඇතුළත් වේ. එක් අනුකොටසකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 20 කි.

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) "ලේනා ගැන පූසා ගැන කවි කියලා සමත් වෙලා
ගමේ ඉඳන් ආවේ මම දෙකෙන් තුනට සමත් වෙලා."
(අ) ඉහත සඳහන් ප්‍රකාශය කරනු ලබන්නේ කවුරුන් විසින් ද?
(ආ) මොනිකා රුවන්පතිරණ කිවිඳිය විසින් රචනා කරන ලද කාව්‍ය සංග්‍රහයක් නම් කරන්න.

(ii) "රුපියලක් දෙකක් විතර. වැස්සොත් එහෙම කීයක් වත් නෑ."
(අ) මෙය පවසන්නේ කාට ද?
(ආ) මෙම පිළිතුර ලබා දෙන්නේ කුමක් විමසූ විට ද?

(iii) "මගේ පපුව ගිඩි ගිඩි ගාලා ගැහෙනවා"
(අ) මෙසේ පවසන්නේ කවරෙක් ද?
(ආ) කෙබඳු අවස්ථාවක දී ද?

(iv) "මම දෙදෙනා ම දිටිමි. එහෙයින් සත් දවසක් නොවෙයි."
(අ) මෙහි දෙදෙනා ම යනුවෙන් හඳුන්වා ඇත්තේ කවුරුන් ගැන ද?
(ආ) ඒ දෙදෙනා ම දුටු තැනැත්තා කවරෙක් ද?

(v) (අ) එච්.එම්. කුඩලිගම සිය කාව්‍ය නිර්මාණ මුලින් ම යොමු කළේ කිනම් පුවත්පතකට ද?
(ආ) වැහි වළාකුළු දකින විට සතුටට පත්වන කුරුල්ලකු ගැන 'වැස්ස' කවිපෙළේ දැක් වේ. එම කුරුල්ලා නම් කරන්න.

(vi) (අ) හත්ත හත්තික සිටාණන්ගේ වස්තුවෙහි දැක්වෙන ගන්ධක සිටාණන්ගේ භාර්යාවගේ නම කුමක් ද?
(ආ) බත් බැළයා තුන් අවුරුද්දක් මෙහෙ කොට ලද බත් තලිය පූජා කළේ කාට ද?

(vii) (අ) කාව්‍යශේඛරයේ කියැවෙන ආකාරයට එය රචනා කර ඇත්තේ කාගේ ආරාධනයෙන් ද?
(ආ) කාව්‍යශේඛරයේ දැක්වෙන බමුණා සිය මිතුරා වෙත තබා ගිය මුදල කොපමණ ද?

(viii) "අතක් බෝසතුගෙ **ළෙයි** තබමින් විමසා
මදක් සැලි සැලී පණ නල තිබෙන නිසා"
(අ) මෙම පද්‍යයේ ඉතිරි පේළි **දෙක** ලියා දක්වන්න.
(ආ) තද කළු අකුරෙන් දැක්වෙන වචනයේ අර්ථය ලියන්න.

(ix) (අ) රහතන් වහන්සේ නමකට පිළිණි කටු අලයක් දන් දීමේ පිනින් ඊළඟ ආත්ම භාවයේ දී නිධානයක් ලද අයකු ගැන කියැවෙන කථා වස්තුව නම් කරන්න.
(ආ) එම කතාව උපුටා ගෙන ඇත්තේ කිනම් ග්‍රන්ථයකින් ද?

(x) (අ) 'රන් තැටියක කඳුළු' සහ 'නොවඳිමි සිදුහත්' යන කාව්‍ය සංග්‍රහ රචනා කළ කවියා නම් කරන්න.
(ආ) 'අපටත් දවසක ඉර පායාදෝ' කෙටි කතාව කාගේ නිර්මාණයක් ද?

*(ලකුණු 02 × 10 = 20 යි)*

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

1. (i) (අ) පියසේන
   (ආ) අංගුලිමාලගේ සිහින, ඔබ යෙහෙළිය ඇය ගැහැනිය, විසි වසක ශේෂ පත්‍රය, අසන් පත්තිනි දේවතාවි, තහනම් දේශයකින්, හිපොක්‍රටීස් සහ රොගිනිය, අපි දෙන්නා සහ තවත් කිහිප දෙනෙක්, ඇගේ ලෝකය, අලුත්ම සිහිනය

   (ii) (අ) බාබු සහීබ්ට, බාබුජීට
   (ආ) "ඔහේ දවසට කීයක් විතර හම්බ කරනවද" යනුවෙන් බාබු සහීබ් රාසුල්ජුගෙන් ඇසූ විට

   (iii) (අ) ලව්නේරිස්
   (ආ) ගෝනහේන ඔහේගේ යැයි ප්‍රකාශ කරන විට

   (iv) (අ) පණ්ඩුවන් දෙදෙනා / මත්ස්‍යලුංගභෝජක පණුවන්
   (ආ) ජීවක/ ජීවක වෛද්‍යවරයා

   (v) (අ) සිංහල බලය
   (ආ) මොනරා/ මයුරා

   (vi) (අ) චින්තාමණී
   (ආ) පසේ බුදුකෙනෙකුන් වහන්සේට


   (vii) (අ) උලකුඩය දේවියගේ, 6 වන පරාක්‍රමබාහු රජුගේ දියණියගේ, ලෝකනාථා දේවියගේ
   (ආ) (කහවණු/ මසුරන්) දහසක්

   (viii) (අ) පසක් තෙදැති දෙවියන් යදිමින් නොලසා
   නැතක් කන්නලවු බස් තෙපලයි මෙලෙසා
   (ආ) ළයෙහි, හදවතෙහි, පපුවෙහි


   (ix) (අ) උත්තරෝලිය වස්තුව
   (ආ) සද්ධර්මාලංකාරය

   (x) (අ) දයාසේන ගුණසිංහ
   (ආ) ඒ.වී. සුරවීර, මහචාර්යය ඒ.වී. සුරවීර

**1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**




1 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 98%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.
ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 20%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 25%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 32%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 23%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 23%ක් වන අතර, 20%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 10කි. ඒ අතුරෙන් x අනුකොටස (ආ) සඳහා පහසුතාව 92%ක්ද I (අ) හා ix අනුකොටසෙහි (අ) සඳහා පහසුතාව 91%ක්ද වේ. vi අනුකොටසෙහි (අ) සඳහා පහසුතාව 40% වන අතර viii අනුකොටසෙහි (අ) සඳහා පහසුතාව 39%කි.

සෙසු ප්‍රශ්න සඳහා පොදුවේ ගත් කළ පහසුතා 50% සිට 75% දක්වා ලබාගෙන ඇති බව පෙනේ.

එහෙත් පහසුතාව අඩුම කොටස් වන්නේ III අනුකොටසෙහි (ආ) හා (අ) සඳහා වන අතර එහි පහසුතා පිළිවෙළින් 7% හා 22%කි.

මෙසේ වීමට මූලික හේතුවක් වන්නට ඇත්තේ "මගේ පපුව ගිඩි ගිඩි ගාලා ගැහෙනවා" යන උද්ධෘත පාඨයයි. එය මගුල් ප්‍රස්තාව නාට්‍යයේ ලව්නේරිස්ගේ ප්‍රකාශයක් වුවද "අපටත් දවසක ඉරපායාදෝ" කෙටි කතාවේ "මගේ පපුව ගිඩි ගිඩි ගාලා ගැහුණා" යනුවෙන් ද සඳහන්ව තිබීම නිසා බොහෝ අයදුම්කරුවන් වැරදි වටහා ගැනීම නිසා III අනුකොටස්වල ලකුණු අපේක්ෂකයින්ගෙන් ගිලිහී ගිය බව පෙනේ. මෙම ග්‍රන්ථ පරිශීලනය කිරීමේදී රසවින්දනය පමණක් නොව පුරාතන ගද්‍ය පද්‍ය නූතන ගද්‍ය පද්‍ය නාට්‍ය යනාදී සෑම අංශයක්ම ආවරණය වන පරිදි අවබෝධ කරවීමට අයදුම්කරුවන් පුරුදු පුහුණු කළ යුතුය. චරිත නිරූපණය, අවස්ථා නිරූපණය, සිද්ධි ගැළපීම් පිළිබඳව අවධානයත්, මතකයත් තබා ගැනීමෙන් මෙම ප්‍රශ්නය සඳහා උපරිම ලකුණු ලබාගැනීමට හැකි බව අනාවරණය විය.

## 02 ප්‍රශ්නය

**අපේක්ෂණය :** දෙවන ප්‍රශ්නය ද අනිවාර්යය. මෙහිදී නිර්දිෂ්ට පාඨ පිළිබඳ අවබෝධය ඇතිව පාඨයෙහි අදහස දෙනු ලබන තද කළු අකුරෙන් මුද්‍රිත කොටස්වල අර්ථය වෙන් වෙන්ව නිසි ලෙස ලියා ඉන්පසු මුළු කොටසේම අර්ථය ලිහිල් බසින් ලිවීමේ කුසලතාව මැන බැලීම මෙහිදී මූලික අපේක්ෂාව විය.

**2.** පහත දක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටස්වල අර්ථය වෙන් වෙන් ව ලියන්න. ඉන් පසු මුළු කොටසේ ම අර්ථය ලිහිල් බසින් ලියන්න.

(i) "නැගෙන සැණකෙළි හඬින් සිව්දෙස
**පිරී අබ්සෙස්** ලැබී සොම්නස
විදුලි එළියෙන් පුරය **එකලු ව**
අසිරිමත් සුර ලොවක් බිහිවිය"

(ii) "මෙවන් **දරිද්‍රතාවකින්** මතු වූ මිනිහකුගේ **උදාරත්වයට** මගේ මිත්‍ර කවියා හිස නමා සිටිය යුතු ය."

(iii) "කීයෙන් ඔහු මෙසේ
**අඳුගළ** නකත් දවසේ
පාවා දෙන ලෙසේ
පටන් ගෙන පියබමුණු **නොලසේ**"

(iv) "මෙතෙක් දවසේ **බැළ මේ** කරන ගමනේ එක දවසක්වත් අඩුවක් නොපෑ මෙහෙ කළ **නියාව** යහපත් ම යයි කිවූ ය."

*(ලකුණු 05 × 04 = 20 යි)*

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(i) අබිසෙස් — අභිෂේක/ උච්ච අවස්ථාවට පත් වී/ උසස් ම අවස්ථාවට පැමිණ/ උපරිම අවස්ථාවට පත් වී/ කිරුළු පැලඳ/ ඔටුනු පැලඳ/ සතුටේ කිරුළ පැලඳ

එකලූව — ඒකාලෝක වී/ මහත් ආලෝකයට පත් වී/ එකම ආලෝකයක් බවට පත්වී

සතර දිශාවෙන් මතු වී එන්නා වූ සැණකෙළි නාදයෙන් පිරි මහත් සතුට උපරිම අවස්ථාට පත් විය. විදුලි ආලෝකයෙන් පුරය ඒකාලෝක වී ආශ්චර්යයෙන් පිරි දෙව් ලොවක් ඇති විය.

(ii) දරිද්‍රතාවකින් — දිළිඳුකමකින්/ දුප්පත්කමකින්/ අගහිඟකමකින්/ දුගී බවකින්

උදාරත්වයට — උසස් බවට/ ශ්‍රේෂ්ඨ බවට/ උතුම් බවට/ උදාර බවට

මෙබඳු දිළිඳුකමකින් මතු වූ මිනිසෙකුගේ උසස් ස්වභාවයට මගේ යහළු කවියා ගරු කළ යුතුය/ හිස පහත් කොට සිටිය යුතු ය.

(iii) අදහළ — අදාළ/ යෝග්‍ය/ නියමිත/ සුදුසු/ නියම කරගත් පරිදි

නොලසේ — අලස නොවී/ ප්‍රමාද නොවී/ අප්‍රමාදව/ කල් නොයවා/ අනලස්/ වහා/ යුහුසුලුව


ඔහු මෙසේ කී නිසා අදාළ නැකැත් දවසේ සරණ පවා දීමට පිය බමුණා නොපමාව කටයුතු පටන් ගෙන

(iv) බැළමේ — බැළ මෙහෙවර/ වැඩකාරකම්/ දාසකම්/ මෙහෙකාරකම්/ සේවාකම්/ සේවය කුලී වැඩ

නියාව — අයුරු/ ආකාරය/ විදිය/ හැටි

මෙපමණ කාලයක් බැළමෙහෙවර කරද්දී එක දවසක්වත් අඩු පාඩුවක් නොපෙන්වා සේවය කළ ආකාරය හොඳ යැයි කිවූහ.


**2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**




අයදුම්කරුවන්ගේ ප්‍රතිචාරයන් දෙස බැලීමේදී මෙම ප්‍රශ්නය තෝරා ගැනීමේ ප්‍රතිචාරය 95%ක ප්‍රතිශතයක් ගත්ත ද නිවැරදි පිළිතුරු ඉදිරිපත් කිරීමේදී අඩු ප්‍රතිශතයක් ගෙන ඇත. ඒ අනුව

ඉන් ලකුණු 00-05 ප්‍රාන්තරයෙහි 30%ක් ද
ලකුණු 06-10 ප්‍රාන්තරයෙහි 27%ක් ද
ලකුණු 11-15 ප්‍රාන්තරයෙහි 25%ක් ද
ලකුණු 16-20 ප්‍රාන්තරයෙහි 18%ක් ද
ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය කොටස් හතරකින් (i, ii, iii, iv) යුක්ත වේ. මෙහිදී ඒ ඒ කොටසෙහි එන වචන දෙක සඳහා ලකුණු දෙක බැගින් ද සමස්තාර්ථය සඳහා ලකුණු 03 බැගින් ද ලකුණු 20ක් ලැබෙන පරිදි ගද්‍ය හා පද්‍ය පාඨවල අර්ථ පැහැදිලි කිරීමට ඉඩ සලසා තිබුණි. එහි තොරතුරු විශ්ලේෂණය 2 ප්‍රශ්නයේ පහසුතා වගුවෙන් පැහැදිලි වේ.




මෙම ප්‍රශ්නයේ අනු කොටස් iv, ii, i, iii සඳහා පහසුතා පිළිවෙළින් 55%, 54%, 48%, 37% වේ. මෙහිදී iv, ii අනු කොටස්වල පහසුතාව වැඩිවීමට හේතුවූයේ iv හත්ත හත්තික සිටාණෝ කථා වස්තුව" සඳහන් ගද්‍ය සාහිත්‍යයේ පාඨය සරලත්වයත්, II "පොළෝ කුහරයෙන් පැමිණි මිනිසා" නූතන ගද්‍ය සාහිත්‍ය පාඨයේ සරල බවත් විය හැකිය.

අඩුම පහසුතාවය 37% ලබා ඇති III අනු කොටස සඳහා බලපාන ලද්දේ කාව්‍යශේඛරයෙන් උපුටාගත් "සිඳුවූ සෙයින් අදහස යන පාඨමයි.

එහි සඳහන් වන වදන් පැරණි පද්‍ය සාහිත්‍යය තුළින් උපුටා ගැනුණු හෙයින් ඊට අවධානය යොමු නොකිරීම නිසා පහසුතාව අඩු වී ඇති බව පෙනේ.

සමස්තයක් වශයෙන් ගත් කළ ගද්‍ය, පද්‍ය. නාට්‍ය කොටස්වල දුරවබෝධ වදන්හි අර්ථ පැහැදිලි කරලීමත්, අර්ථාවබෝධය වර්ධනය කරලීමට පන්ති කාමරය තුළ අපේක්ෂකයින් යොමු කරලීම වැදගත් වේ. විශේෂයෙන්ම කළු අකුරින් දක්වා ඇති වචනවල පමණක් නොව සමස්ත කොටසේම අර්ථ ලිවීම වැදගත් බව අයදුම්කරුවන්ට අවධාරණය කළ යුතුවේ.

සිංහල ගද්‍ය පද්‍ය පාඨවල දුරවබෝධ වචනවල තේරුම් කටපාඩම් කරවීම, නිරන්තර අභ්‍යාසවල යෙදවීම තුළින් සාර්ථක පිළිතුරු අපේක්ෂා කළ හැකිය.

## 03 ප්‍රශ්නය

**3.** "අපටත් දවසක ඉර පායාදෝ "කෙටි කතාවේ සාර්ථකත්වය සඳහා මනා චරිත නිරූපණය ඉවහල් වී ඇති ආකාරය

**(i)** සිරියාවතීගේ චරිතය හා

**(ii)** සිරියාවතීගේ මවගේ චරිතය ඇසුරෙන් නිදසුන් **දෙක** බැගින් දක්වමින් විමසන්න.

*(ලකුණු 15 යි)*

## අපේක්ෂිත පිළිතුර

(i) සිරියාවතීගේ චරිතය නිරූපණය වන අවස්ථා

- දුප්පත්කමෙන් පීඩා විඳීම හා අගහිඟකම්වලට මුහුණ දීම
- ඉගෙනීම කෙරෙහි පැවති සහජ දක්ෂතාව හා උනන්දුව
- කටුක ජීවන අත්දැකීම් හා අධිෂ්ඨානශීලීභාවය
- ගුරු දෙගුරුන් කෙරෙහි භක්තිය හා සංවේදීභාවය
- ගැමි දැරියක ලෙස ලැජ්ජාව, භය ආදී ගුණාංග ඇගේ චරිතය තුළින් ඉස්මතු වීම

(ii) සිරියාවතීගේ මවගේ චරිතය නිරූපණය වන අවස්ථා
- ධෛර්ය සම්පන්නව ජීවිතයට මුහුණ දීම
- ගැමි මවකගේ වගකීම නිසියාකාරව ඉටු කිරීම
- දිළිඳුකමෙන් පීඩා විඳීම හා අරපිරිමැස්මෙන් ක්‍රියා කිරීම
- ජීවිතය ඇසුරෙන් ලද පරිණතභාවය
- ගැමි ගැහැනියක කෙරෙහි දැකිය හැකි දරු සෙනෙහස, උපේක්ෂාසහගත බව, ආවේගශීලීභාවය, දුක්බර බව ආදී සංකීර්ණ ලක්ෂණ ඇගේ චරිතය තුළින් ඉස්මතු වීම

(ගැළපෙන වෙනත් උදාහරණ ද නිවැරදි සේ පිළිගන්න. එක් කොටසකට උදාහරණ 2 ක් බැගින් දක්වා තිබීම ප්‍රමාණවත්ය.)

**උදාහරණ සඳහා ලකුණු 04 යි**
**සමස්ත විස්තරයට ලකුණු 11 යි**
**මුළු ලකුණු 15 යි**

**නැතහොත්**

**(i) උපමා භාවිතය හා**

**(ii) අජීවී වස්තූන්ට සජීවී බව ආරෝපණය කිරීම, 'වැස්ස' කවි පෙළේ සාර්ථකත්වයට හේතු වී ඇත. එක් කරුණකට නිදසුන් දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.**

*(ලකුණු 15 යි)*

අපේක්ෂිත උත්තර


(i) උපමා භාවිතය
- පිඹුරන් සේ ඇදෙයි ගුරු පැහැ දිය ධාරා
- දියවැල් වමාරන්නා මෙනි පියසි තල
- ගැබ්වුණු සිසිල එයි, ඊතල පරිදි මෙහේ
- ගී දේවියට කැප කළ දෙවොලකට සම
- කුටියක සුවඳ දෙයි කළුවැල් කපුරු දුම

(ii) අජීවී වස්තූන්ට සජීවී බව ආරෝපණය කිරීම
- ගස්වැල් තිගැස්සෙයි මේ කුළු ගැටෙන හඬින්
- පදමට වෙරළු මිණි කැට සුණු විසුළ හැඩ ජෝතිය ලැගුම් ගත් ළා තණ පිටිය උඩ
- වැසි බිඳු ඇද වැටී කුර ගැටෙන හඬ දිදී
- ළා අතු රිකිලි, රුක්ගොමු, ලියමඬුලු ඉහේ ඇඩි වේදනාවෙන් මිරිකී හඬනු ඇහේ
- ගන වැහි වලා ඉගිලී එන විට දි අඬා
- හදවත පියාඹා යයි වෙල් කුඹුරු උඩින්

(මෙම උදාහරණ හෝ වෙනත් ගැළපෙන උදාහරණ ද නිවැරදි සේ පිළිගන්න. එක් කොටසකට උදාහරණ දෙකක් දක්වා තිබීම ප්‍රමාණවත්ය.)

**උදාහරණ සඳහා ලකුණු 04 යි**
**සමස්ත විස්තරයට ලකුණු 11 යි**
**මුළු ලකුණු 15 යි**

## 3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන





තුන්වන ප්‍රශ්නය ද අනිවාර්ය ප්‍රශ්නයකි. අයදුම්කරුවන්ගෙන් මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා ඇත්තේ 95%ක පමණ ඉහළ ප්‍රතිශතයකි. ශිෂ්‍ය ප්‍රතිචාරය ඉහළින් ම ලබාගත් මෙම ප්‍රශ්නයට ලකුණු 15ක් හිමිවෙයි.

ප්‍රශ්නය සඳහා ලකුණු ප්‍රාන්තරයන් බලන කල

ඉන් ලකුණු 00-03 ප්‍රාන්තරයෙහි 20%ක් ද
ලකුණු 04-07 ප්‍රාන්තරයෙහි 21%ක් ද
ලකුණු 08-11 ප්‍රාන්තරයෙහි 33%ක් ද
ලකුණු 12-15 ප්‍රාන්තරයෙහි 26%ක් ද

ලකුණු ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නය විකල්ප ප්‍රශ්න දෙකකින් යුක්ත වන අතර ඉන් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතුය. එම ප්‍රශ්න දෙක අතුරෙන්, පළමුවන ප්‍රශ්නයෙහි,

(i) කොටසෙහි පහසුතාව 86%ක් ද
(ii) කොටසෙහි පහසුතාව 55%ක් ද වන අතර

නැතහොත්

(i) කොටසෙහි පහසුතාව 83%ක් ද
(ii) කොටසෙහි පහසුතාව 74%ක් ද වේ.

තුන්වන ප්‍රශ්නයෙහි පළමු කොටසට අයත් වන උදාහරණ සඳහා ලකුණු 04ක් ලබාදී ඇත. ඒ අනුව සිරියාවතීගේ සහ සිරියාවතීගේ මවගේ චරිත පිළිබඳ උදාහරණ සඳහා වැඩිම පහසුතාව ලබාගෙන ඇති අතර එහි පහසුතාව 86%කි.

එමෙන්ම එම ප්‍රශ්නයේ ම දෙවන කොටසට අයත් වන උදාහරණ සඳහා පහසුතාව 83%කි. ඒ අනුව පළමු කොටස ද දෙවන කොටස ද සසඳන කල ගද්‍ය කොටස්වල උදාහරණ කෙරේ අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර වැඩිවේ. විස්තරාත්මක කොටස්වලට උදාහරණ දීමේ දී යෝග්‍ය නිදසුන් ඉදිරිපත් කිරීමේ දුර්වලතාවක් ඇති බව පෙනේ.

සිරියාවතීගේ සහ සිරියාවතීගේ මවගේ චරිත නිරූපණය වන අවස්ථා විමර්ශනාත්මකව ඉදිරිපත් කිරීමේ දුර්වලතාව හේතුවෙන් ප්‍රශ්නයේ පළමු කොටස සඳහා පහසුතාව 55%කි.

එහෙත් එම ප්‍රශ්නයේ ම දෙවන කොටස එනම් නැතහොත් කොටසට අයත් වන ප්‍රශ්නයේ සමස්ත විස්තරය ලිවීමේ දී සතුටුදායක මට්ටමක් පෙන්නුම් කරයි. එනම් එහි පහසුතාව 74%ක් වන හෙයිනි. මේ අනුව ගද්‍ය ප්‍රශ්නයට වඩා පද්‍ය ප්‍රශ්නයේ සාර්ථක පිළිතුරු ලිවීමේ හැකියාව අයදුම්කරුවන් තුළින් ඉස්මතු වී තිබීම දැකිය හැකිය.

සමස්තයක් වශයෙන් ගත් කළ මෙකී ප්‍රශ්න පිළිබඳ පන්ති කාමරයේදී සාකච්ඡා කිරීම, ප්‍රායෝගික ජීවිතයට සම්බන්ධ කිරීමේ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම තුළින් නිර්දිෂ්ට කෘති කෙරේ අයදුම්කරුවන් ප්‍රතිචාර වර්ධනය කර පිළිතුරු සැපයීමේ හැකියාව සතුටුදායක මට්ටමකට ළඟා කරගත හැකි වනු ඇත.

04 ප්‍රශ්නය

**4.** **(i)** **සරල භාෂා භාවිතයට සහ**

**(ii)** **මනා අවස්ථා නිරූපණයට,**

**තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් දැක් වූ දක්ෂතාව කාව්‍යශේඛරයෙන් පිළිබිඹු වෙයි. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.**

*(ලකුණු 15 යි)*

(i) සරල භාෂා භාවිතයට

- එකලෙක් තරා එක්
  දුක්පත් මහලූ බමුණෙක් ......

- තිබූ දන එ දවස
  පෙර අප දැන ඇඳින........

- දක්වාලා ඔහුට
  අත්පා මෙමෙහෙ කිරීමට ..........

(ii) අවස්ථා නිරූපණය

මෙම කවි පන්තියේ ප්‍රධාන අවස්ථා හතරක් පෙන්වා දිය හැකිය. එනම්,

- බමුණා තම හිතවත් බමුණා ළඟ මුදල් තබා යෑමේ අවස්ථාව
- බමුණා නැවත පැමිණ මුදල් ඉල්ලූ අවස්ථාව
- මුදල් තබා ගත් බමුණා එම මුදල් දීම සඳහා උපාය යෙදූ අවස්ථාව
- මුදල් තබා ගිය බමුණාගේ උපාය සාර්ථක වූ අවස්ථාව

මෙම අවස්ථා හතරෙන් අවස්ථා දෙකක්වත් නිරූපණය වන සේ නිදසුන් සැපයීම ප්‍රමාණවත් ය.

උදාහරණ

- බමුණු එදහස ලත්
  බමුණු කුලයක පෙර දත් ........

- ඇවිදින් දද මහ ලූ
  දැක ඒ කුලන් නිවහ ලූ .........

- නුවෙන් අප අයැ ති
  පසු පෙය දෙන්ට මං නැති .......
  ණය කවුරු දන් දෙති
  සිලව් කොට ඒ යළි එකෙක් ඇති .......

- වතින් සොමි සඳ වූ ........

- දක්වාලා ඔහු ට .......

- නොලදත් ඒ දහස
  සිදුවූ සෙයින් අදහස .......

- ඉත පුරුදු පෙර කල
  දැන් තොප මෙසේ කී කල .......

(මෙම උදාහරණ හෝ වෙනත් ගැළපෙන උදාහරණ ද නිවැරදි සේ පිළිගන්න.
එක් කොටසකට උදාහරණ දෙකක් දක්වා තීබීම ප්‍රමාණවත්ය.)

**උදාහරණ සඳහා ලකුණු 04 යි**

**සමස්ත විස්තරයට ලකුණු 11 යි**

**මුළු ලකුණු 15 යි**

**නැතහොත්**

'සද්ධර්මාලංකාරය,

**(i) ශ්‍රව්‍ය ගෝචර රචනා ශෛලියක් යොදා ගනිමින්**

**(ii) චිත්තාකර්ෂණීය ලෙස වර්ණනා ඉදිරිපත් කරන කෘතියකි.**

**උත්තරෝලිය වස්තුවෙන් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.**

*(ලකුණු 15 යි)*

අපේක්ෂිත පිළිතුර

(i) ශ්‍රව්‍ය ගෝචර රචනා ශෛලිය

කතුවරයා විසින් වර්ණිත වස්තු, අවස්ථා, සිදුවීම් හා චරිත නිරූපණයට, උපදෙස් දීම් ආදියට යෝග්‍ය අයුරින් ශ්‍රව්‍ය ගෝචර ශෛලිය යොදා ඇත.

- සරල වැකි භාවිත කරමින් සිද්ධි නිරූපණය
  උදා : ඒ නිධානය සියල්ලවුනට පෙනෙන සේ උතුරාලු වැව් දිය පිට පෙරළි පෙරළි
  ඔබැ මොබැ දිවෙයි. සමහර විටෙකැ දියෙහි ගිලෙයි ඉපිලෙයි.
- කුමාරයාගේ ශික්ෂාග්‍රහණ කාලය ගැන කරන විස්තරයේ" තත්සම වචන මිශ්‍ර භාෂාවක් යොදා ගැනීම
  උදා : පසුව ඒ කුමාරයන් මවු කුසින් බිහිව ක්‍රමයෙන් වැඩි ශික්ෂාග්‍රහණය කාලය සම්ප්‍රාප්ත විය. එකලැ මේ ලංකාද්වීපයෙහි මනුෂ්‍යයෝ ......
- උපදෙස් දෙන අවස්ථාවට යෝග්‍ය වන සේ භාෂාව යොදා ගැනීම
  උදා : එම්බා, මේ ලෝකවාසී වූ අඥාන සත්ත්වයෝ විෂ නොවන දෙය විෂ යයි කියති. සැබෑ ......
- ධර්මය දේශනා කරන අවස්ථාවට ගැළපෙන ගැඹුරු වචන යොදා ගැනීම
  උදා : යමෙක් ශීලාදි ගුණ ධර්මයන්ට පරම ප්‍රතිෂ්ඨාධාර වූ .....
  මාතුගාම නැමැති උදකරාක්ෂසීන්ව වාසස්ථාන වූ ........

(ii) චිත්තාකර්ෂණීය ලෙස වර්ණනා කිරීම

උදා :

- ගොපලු මව පිළිණි වූ කටු අලය පුතාට දෙන අවස්ථාව
- කටු අලය රහතන් වහන්සේට පිළිගන්වන අවස්ථාව
- කාන්තාවක විසින් නිධානය ගැනීමට උත්සාහ කරන අවස්ථාව
- වැව අසලට රැස්වූ ගැමියන් නිධානය අයිති කර ගැනීමට උත්සාහ කරන අවස්ථාව
- වස්ත්‍රය පිළිබඳව අරගල විසඳීමට යාමේ දී
  රාජ පුරුෂයන් හා රජු ඉදිරියෙහි නිධානයේ හැසිරීම දක්වා ඇති ආකාරය


(මෙම උදාහරණ හෝ වෙනත් ගැළපෙන උදාහරණ ද නිවැරදි සේ පිළිගන්න.
එක් කොටසකට උදාහරණ දෙකක් දක්වා තීබීම ප්‍රමාණවත්ය.)

**උදාහරණ සඳහා ලකුණු 04 යි**

**සමස්ත විස්තරයට ලකුණු 11 යි**

**මුළු ලකුණු 15 යි**


4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




අනිවාර්ය ප්‍රශ්නයකි. එය ද අයදුම්කරුවන්ගේ පහසුව සඳහා තෝරා ගැනීමක් සහිත ව කොටස් දෙකකින් යුක්තය. පළමු කොටසේ සඳහන් වී ඇත්තේ කාව්‍යශේඛරයෙන් උපුටා ගැනුණු ප්‍රශ්නයකි. දෙවැන්න එනම් නැතහොත් ප්‍රශ්නය වූයේ සද්ධර්මාලංකාරයෙනි. මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇත්තේ 79%කි. ලකුණු 15කින් සමන්විත මෙම ප්‍රශ්නය සඳහා

ලකුණු 00-03 ප්‍රාන්තරයෙන් 23%ක් ද
ලකුණු 04-07 ප්‍රාන්තරයෙන් 24%ක් ද
ලකුණු 08-11 ප්‍රාන්තරයෙන් 28%ක් ද
ලකුණු 12-15 ප්‍රාන්තරයෙන් 26%ක් ද

ලකුණු ලබා ගෙන ඇත.




4 ප්‍රශ්නය විකල්ප ප්‍රශ්න දෙකකින් යුක්ත වූ අතර ඉන් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතුවේ.
මෙහිදී ද කාව්‍යශේඛරයේ සහ සද්ධර්මාලංකාරයේ උදාහරණ ලබා දීමේ දී අයදුම්කරුවන් කාව්‍ය ශේඛරය ප්‍රශ්නයේ දී පහසුතාව 95%ක් ලබාගත් අතර දෙවන ප්‍රශ්නය වූ සද්ධර්මාලංකාරයේදී ලබාගත් පහසුතාව 61%කි. ඒ අනුව උදාහරණ සැපයීමේදී "සිදුවූ සෙයින් අදහස" කාව්‍යය අයදුම්කරුවන්ට සරල වීමත්, සද්ධර්මාලංකාරය සඳහා උදාහරණ දීමේදී සංකීර්ණ වීමත් දැකිය හැකිය.

පොදුවේ හතරවන ප්‍රශ්නයට අයත් පළමු කොටසේ හා දෙවන කොටසේ ප්‍රශ්නවල සමස්තාර්ථය ලිවීමේ දුර්වලතාවය පැහැදිලි වන අතර කාව්‍යශේඛර ප්‍රශ්නයේදී පහසුතාව 53%ක් වූ අතර, සද්ධර්මාලංකාර ප්‍රශ්නයේදී පහසුතාව 40%කි.

ඉතා සරල අර්ථයන් ඇතුළත් "සිදුවූ සෙයින් අදහස" පාඩමේ උදාහරණ සඳහා අයදුම්කරුවන් තම හැකියාව ඉදිරිපත් කළ ද සමස්තාර්ථය ලිවීමේ දී දුර්වලතා දැකිය හැකිය. ඒ අනුව මෙම පාඩම් කෙරේ අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර දුර්වල මට්ටමක පවතින බව අනාවරණය වේ.

එමෙන්ම සද්ධර්මාලංකාර ප්‍රශ්නය ලිවීම ඉතා අඩු ම මට්ටමක පැවතීමෙන් උත්තරෝලිය වස්තුවේ වර්ණනාත්මක අවස්ථාවන් තුළින් විස්තරාත්මකව කරුණු ඉදිරිපත් කිරීමට උත්සාහ නොගෙන ඇති බවක් පෙනේ.

අවස්ථාවෝචිත සිද්ධි ගැළපීම, ගොපලු මව, නිධානය අහිමි කාන්තාව, නිධානය හිමි කාන්තාව, රජු යන චරිත කෙරේ අවධානය යොමු කළ යුතුය. විශේෂයෙන් උත්තරෝලිය වස්තුවේ කතාසාරය, දුරවබෝධ වචන, අවස්ථා හා සිද්ධි ගත හැකි ආදර්ශ, ධර්මෝපදේශ ආදිය පිළිබඳව පන්ති කාමරයේ දී අවධානය යොමු කිරීමට ගුරුභවතුන් කටයුතු කළ යුතු බව අවධාරණය කෙරේ.

05 ප්‍රශ්නය

- 5,6,7 ප්‍රශ්නවලින් එකකට පිළිතුරු ලිවීම සඳහා වෙන්වුණු අතර අයදුම්කරුවන්ගේ අභිමතය පරිදි තෝරා ගැනීමට අවස්ථාව හිමි වී තිබුණි.

**5. මිනිසුන් දුප්පත්කමින් පීඩාවට පත් වීම නිරූපණය කිරීමේ දී කතුවරයා දක්වා ඇති සංවේදිතාව කෙබඳු වූවක් දැයි 'පොළෝ කුහරයෙන් පැමිණි මිනිසා' කෙටිකතාවෙන් උදාහරණ තුනක් දක්වමින් පැහැදිලි කරන්න.** *(ලකුණු 10 යි)*

අපේක්ෂිත උත්තරය

රාසුල්ප්පු බාබුජී අතර ඇතිවන සංවාදවලදී දුප්පත්කමින් පීඩාවට පත්වන මිනිස්සු නිරූපණය වෙති. එබඳු අවස්ථා තුනක් දක්වා තිබීම ප්‍රමාණවත්ය. යෝග්‍ය අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

- දුප්පත් මිනිසෙකුට මේ ලෝකේ කිසිම හච්චරණත් නෑ බාබුජී
- ඒ කියන්නේ එදාට අපේ ගෙදර සේරම බඩගින්නේ කියන එකයි.
- මලානික කම්මුල් මත තැවරී තිබුණ කුණු තට්ටුව වුව ....
- තමුසෙගේ බඩගෙඩිය ඇතුළෙ තියෙන ගින්දරට කන්ඩ දෙන්ඩ දවසකට කොච්චර ඉන්ධන එකතු කරනවද?
- මගේ සිත රිදවන්නේ සූරාකනු ලබන නිර්ධන පන්තියේ එකකු විසින්ම ....
- ඇයි තමුසෙට ඒක මදිද? මීට වඩා පයිසයක්වත් තමුසෙට දෙන්න බෑ.


දුප්පත්කමින් පීඩාවට පත්වී ඇති මෙබඳු මිනිසුන් අනුන්ගේ කරුණාවට පාත්‍රවිය යුතු බව ද ලේඛකයා හඟවයි. එමගින් දුප්පත් අසරණයින්ගේ මානසික තත්ත්වය හෙළි කරයි.

(මෙම උදාහරණ හෝ වෙනත් ගැළපෙන උදාහරණ ද නිවැරදි සේ පිළිගන්න.)

**උදාහරණ සඳහා ලකුණු 03 යි**
**සමස්ත විස්තරයට ලකුණු 07 යි**
**මුළු ලකුණු 10 යි**

5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන

ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය




මෙම ප්‍රශ්නය පොළෝ කුහරයෙන් පැමිණි මිනිසා කෙටි කතාව ඇසුරින් සැකසී ඇත.
අයදුම්කරුවන්ගෙන් 15% පමණ අඩු ප්‍රතිශතයක් ඊට පිළිතුරු සපයා තිබිණ. එමෙන්ම අඩු පහසුතාවයකින් යුක්ත ප්‍රශ්නය ද වී ඇත්තේ මෙම ප්‍රශ්නයයි. මෙහි සමස්ත පහසුතාව 48%කි.
ලකුණු 10ක් හිමිවන මෙම ප්‍රශ්නය සඳහා ලබා ඇති ලකුණු ගණනය කිරීමේදී
ඉන් ලකුණු 00-02 අතර ප්‍රාන්තරය 20%ක් ද
ලකුණු 03-05 අතර ප්‍රාන්තරය 29%ක් ද
ලකුණු 06-07 අතර ප්‍රාන්තරය 25%ක් ද
ලකුණු 08-10 අතර ප්‍රාන්තරය 24%ක් ද
ලකුණු ලබා ගෙන ඇත.

නූතන ගද්‍ය සාහිත්‍යය ඇසුරින් දෙන ලද මෙකී පරිවර්තන කෘතියට අඩු ප්‍රතිචාරයක් දක්වන්නටත් සමස්ත පහසුතාව 48%ක් වීමටත් හේතුවන්නට ඇත්තේ ප්‍රධාන චරිත පිළිබඳ ව එතරම් සැලකිල්ලක් නොදැක්වීමයි. පරිවර්තන කෘතියක් වුවද සරල බස් වහරකින් යුක්ත මෙහි කථාව තුළින් සංකීර්ණ සමාජ ගැටලු පිළිබඳව අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරවීමත්, විමර්ශනය හා රසාස්වාදය සඳහා යොමු කරවීමත් චරිත කෙරෙහි අවධානය යොමු කිරීමෙනුත් මෙම ප්‍රශ්නයට පහසුවෙන් පිළිතුරු සැපයිය හැකිව තිබුණි. නිරන්තර පොත පත පරිශීලනයට අයදුම්කරුවන් යොමු කරවීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුව ඇත.

ප්‍රශ්න අංකය - 06

**6.** අවුරුදු සමයේ දක්නට ලැබෙන පරිසරය විචිත්‍ර ලෙස වර්ණනා කිරීම, 'වසන්ත සමය' කවිපන්තියේ සාර්ථකත්වයට හේතු වී ඇති ආකාරය උදාහරණ **තුනක්** දක්වමින් විමසන්න. *(ලකුණු 10 යි)*

අපේක්ෂිත උත්තරය

අවුරුදු සමය විචිත්‍ර ලෙස වර්ණනා කිරීමට කවියා පරිසරයේ විවිධ අංශ ගැන අවධානය යොමු කරයි.

i. ස්වභාව සෞන්දර්යය

- මල් ගොමු ගුමු ගුමු ගන්වන්නී
  මී වදවල පැණි පුරවන්නී ....

- ජම්බු ගහට රත පොරවන්නී
  බක් මී ගහ කහ අන්දන්නී

- එරබදු පැහැයෙන් දුලවන්නී
  නා ගස් සුවඳින් බැඳලන්නී .....

- ගමේ මැ පුහුලන් ඉදවන්නී
  සොරුන් බවට වවුලන් ලන්නී .......

ii. සමාජ පරිසරය

- මල්සර හට හී සපයන්නී
  යොවුනන් සිත් ඉන් බැඳලන්නී ........

- වෙන් වූවන් සිත කලඹන්නී
  පැරණි තරහ හැම යට ලන්නී.......

- දස දෙස සුවඳින් බැඳැලන්නී
  ගතට සිතට නව පණ දෙන්නී

iii. ගෙදර දොර පරිසරය


- කොල්ලන් කෙල්ලන් පොබයන්නී
  මහලු සිතෙත් කෙළි රිසි ලන්නී .....

(පොදුවේ උදාහරණ තුනක් සහිතව පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.)

උදාහරණ සඳහා ලකුණු 03 යි
සමස්ත විස්තරයට ලකුණු 07 යි
මුළු ලකුණු 10 යි

### 6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන

**ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය**




මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු ලියූ අයදුම්කරුවන් ගණන 43%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමිවන අතර ලකුණු ලබාගෙන ඇති ආකාරය අනුව බලන කල
ඉන් ලකුණු 00-02 අතර ප්‍රාන්තරය 8%ක් ද
ලකුණු 03-05 අතර ප්‍රාන්තරය 13%ක් ද
ලකුණු 06-07 අතර ප්‍රාන්තරය 30%ක් ද
ලකුණු 08-10 අතර ප්‍රාන්තරය 49%ක් ද
ලකුණු ලබා ගෙන ඇත.

වසන්ත සමය පද්‍ය පන්තිය මුල් කරගෙන පෙළ ගැස්වුණු මෙම ප්‍රශ්නයෙහි මධ්‍යක පහසුතාව වූයේ 68%කි. අයදුම්කරුවන්ගෙන් 50%ක්ම 8, 10 අතර ප්‍රමාණයකින් ලකුණු ලබාගැනීම අනෙක් ප්‍රශ්නවලට වඩා සාපේක්ෂව ඉහළ ප්‍රතිශතයකි. 5, 6, 7 ප්‍රශ්නවලින් වැඩිම පහසුතාව ඇති ප්‍රශ්නය මෙය වූ අතර තවදුරටත් විමර්ශනය සහ රසාස්වාදනයට යොමු කිරීමෙන් ඉහළ අගයක් ගන්නා සාර්ථක පිළිතුරකට යොමු කළ හැකිය. විශේෂයෙන්ම ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරක මගින් රසවින්දනයට යොමු කිරීමෙන් සාර්ථක ප්‍රතිඵල ළඟා කරගත හැකි වෙයි.

### 07 ප්‍රශ්නය

**7.** **'ජීවක කථා වස්තුව, යහපත් වෛද්‍යවරයකුගේ ගුණාංග ඉස්මතු කර දක්වන නිර්මාණයකි.' උදාහරණ තුනක් දක්වමින් පහදන්න.** *(ලකුණු 10 යි)*


### අපේක්ෂිත පිළිතුර

- වෛද්‍ය ශාස්ත්‍රයෙහි කිසි අඩුවක් නැතිව කෝටි ප්‍රාප්ත වීම
  යහපත් වෛද්‍යවරයෙකුගේ ගුණාංග ඉස්මතු වන ආකාරය දැක්වෙන අවස්ථා
  "මේ මිනිස් ලොව නම් පූර්වයෙහි ඖෂධයෙන්ම මවන ලද වන. ඖෂධ සටිකාවක් වැන්න. ඖෂධයකට නොගත හැකි වස්තුවක් නොලද්දෙමි."
- රෝගියා තුළ විශ්වාසය ඇති කිරීම. හිස රුජාවෙන් පෙළුණු සිටාණන් සුවකළ හැකි බව තරයේ ම කීම
- නිවැරදි ලෙස රෝග නිශ්චය කිරීම
  සිටාණ කෙනෙකුන්ගේ ශීර්ෂාබාධය - මත්ථලුංගභෝජක පණුවන් දෙදෙනා දැකීම.
  "නුඹ ඉස මත්ථලුංගභෝජක නම් පණුවෝ දෙදෙනෙක් අටගත්හ ..." බාරාණසෙය්‍යක සිටාණන්ගේ පුතාගේ අන්තර්ගණ්ඨ ආබාධය
  "නුඹ වහන්සේ බඩ ගැට ගෙන තිබෙන ගුණයෙක් ඇද්දැයි ..."
- රෝගීන්ට ධන හානි නොකිරීම
  සිටු දේවියගේ ශිර්ෂාබාධ අවස්ථාව
  "තෙල රුජාව සංසිඳුවා මිස නොයමි. වැලිදු ධන හානියකුත් නොකරමි."
- මුදලට සම්පත්වලට වඩා මිනිස් ගුණාංගවලට ගරු කිරීම.
  "නුඹ වහන්සේගෙන් කරුණා සම්පත් දෙවා වදාළ මැනව"

(නිදසුන් 3 ක් ඉදිරිපත් කරමින් කරුණු දැක්වීම ප්‍රමාණවත් ය.
ගැළපෙන වෙනත් නිදසුන් ද පිළිගන්න.)

**උදාහරණ සඳහා ලකුණු 03 යි**
**සමස්ත විස්තරයට ලකුණු 07 යි**
**මුළු ලකුණු 10 යි**

7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




ජීවක කථා වස්තුව මුල්කරගෙන සැකසුණු ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 34%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමිවන අතර අයදුම්කරුවන් ලකුණු ලබා ඇති ආකාරය බලන කල,

ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයෙන් 23%ක් ද,
ලකුණු 03 - 05 ප්‍රාන්තරයෙන් 30%ක් ද,
ලකුණු 06 - 07 ප්‍රාන්තරයෙන් 24%ක් ද,
ලකුණු 08 - 10 ප්‍රාන්තරයෙන් 23%ක් ද,
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නයෙහි මධ්‍යක පහසුතාව 49%කි. පුරාතන ගද්‍ය සාහිත්‍යයට අයත් ජීවක කථා වස්තුවෙන් පිළිතුරු ලිවීමට අයදුම්කරුවන් යොමු නොවීම හේතුවෙන් ලකුණු 03-05 අතර ප්‍රමාණයෙන් ලකුණු ලබාගත් අයදුම්කරුවන් 30%ක් වීමට හේතු වී ඇත.

චරිත නිරූපණය, කතා සාරය, දුරවබෝධය වචන කෙරේ අවධානය යොමු නොකිරීම නිසා පිළිතුරුවල අසාර්ථකත්වයට හේතු වී තිබේ.

මෙම කතා වස්තුවේ දුරවබෝධ වචන රාශියකි. තේරුම් ගැනීමට අපහසු තැන් බොහෝය. එහෙයින් මෙම පුරාතන ගද්‍ය කථා වස්තු පැහැදිලි කිරීමේදී අයදුම්කරුවන්ගේ විශේෂ අවධානය යොමු කරලීමේ වැඩ සටහන් පන්ති කාමරය තුළ සංවිධානාත්මකව ක්‍රියාත්මක කළ යුතු වේ.

* පිළිතුරු සැපයීමේදී III ප්‍රශ්න පත්‍රය පිළිබඳව පොදුවේ බලන කල 1 ප්‍රශ්නය 2 ප්‍රශ්නය 3 හා 4 ප්‍රශ්නය මෙන්ම 5,6,7 යන ප්‍රශ්නවලදී වැඩිම පහසුතාව ලබාගත් ප්‍රශ්නය වූයේ 3 වන ප්‍රශ්නයේ දෙවන කොටස වූ වැස්ස කාව්‍ය පන්තියයි. එහි පහසුතාව 76%කි.

4 වන ප්‍රශ්නයේ දෙවන කොටස සහ 6 ප්‍රශ්නය සඳහා පහසුතාව 68%ක් ලබාගෙන තිබූ අතර 4 වන ප්‍රශ්නයේ පළමු කොටස සඳහා වූ කාව්‍යශේඛරය සඳහා පහසුතාව 64%කි. එමෙන්ම 3 වන ප්‍රශ්නයේ පළමු කොටස වූ සිරියාවතී චරිතය සඳහා 63%ක පහසුතාව ලබාගැනීම කැපී පෙනෙයි.

එහෙත් 2 වන ප්‍රශ්නය හා 07 වන ප්‍රශ්නය සඳහා පහසුතාව 49%ක් ලබාගැනීමෙන් ද 5 වන ප්‍රශ්නය සඳහා පහසුතාව 48% ලබාගැනීම තුළින් අනිකුත් ප්‍රශ්න පත්‍ර හා සසඳන කළ III ප්‍රශ්න පත්‍රයේ මධ්‍යක සමස්ත පහසුතාව 57.5%ක් III ප්‍රශ්න පත්‍රයට ඉහළ ලකුණු මට්ටමක් ලබාගැනීමට අයදුම්කරුවන්ට හැකි වී තිබේ.

සිංහල භාෂාව හා සාහිත්‍යය ප්‍රශ්න පත්‍රය දෙස සමස්තයක් වශයෙන් ගත් කල්හි ප්‍රශ්න පත්‍ර තුනෙහි සමස්ත පහසුතාව බලන කල

I ප්‍රශ්න පත්‍රයෙන් සමස්ත පහසුතාව 49%කි.
II ප්‍රශ්න පත්‍රයෙහි සමස්ත පහසුතාව 51%කි.
III ප්‍රශ්න පත්‍රයෙහි සමස්ත පහසුතාව 58%කි.

## III කොටස

## 3. පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

### 3.1 පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු

**පොදු උපදෙස්**

* ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතුය. එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද, කුමන ප්‍රශ්න අනිවාර්යය ද, කොපමණ කාලයක් ලැබේ ද, කොපමණ ලකුණු ලැබේ ද, යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කරගෙන ප්‍රශ්න තෝරා ගත යුතුය.

* I වන පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී වඩාත් නිවැරදි **එක්** පිළිතුරක් පමණක් තෝරා ගත යුතුය. තවද එක් කතිර ලකුණක් පමණක් යෙදිය යුතුය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයූවා දැයි සුපරීක්ෂාකාරී විය යුතුය.

* II පත්‍රයේ හා III පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී සෑම ප්‍රධාන ප්‍රශ්නයක්ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.

* නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතුය.

* අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවකම අදාළ ස්ථානයේ ලිවිය යුතුය.

* නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවලදී දීර්ඝ විස්තර ඇතුළත් නොකිරීම මෙන්ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවලදී කෙටි පිළිතුරු සැපයීම ද නොකළ යුතුය. අදාළ අවස්ථාවලදී සුදුසු නිදසුන් ඉදිරිපත් කළ යුතුය.

* පිළිතුරු සමන්විත විය යුතු වචන සංඛ්‍යාව දී ඇති විට, එම වචන සංඛ්‍යාවට හැකි තරම් ආසන්න වචන සංඛ්‍යාවකින් යුතු වන සේ පිළිතුරු සංවිධානය කර ගත යුතුය. එසේ නොවීම ලකුණු අඩුවෙන් ලැබීමට හේතු විය හැකි බැවිනි.

**විශේෂ උපදෙස් :**

* අත් අකුරු සහ අක්ෂර වින්‍යාසය පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.

* ශිල්පීය දක්ෂතා (පද බෙදීම, විරාම ලක්ෂණ, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම යන අංග) පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.

## 3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් පිළිබඳ අදහස් හා යෝජනා

- ★ සිංහල අක්ෂර මාලාව පිළිබඳ ව පෙළපොත්වල ඇති පාඩම් දෘශ්‍යාධාර භාවිත කරමින් හා ගුරු මාර්ගෝපදේශ ග්‍රන්ථ පරිශීලනය කරමින් නිවැරදි ව ලිවීමේ හැකියාව ප්‍රගුණ කළ යුතුය.

- ★ උක්තාඛ්‍යාත පද සම්බන්ධය පිළිබඳව 10 වන ශ්‍රේණියේ පෙළපොතෙහි අදාළ පාඩම් දෙක අභ්‍යාසවල යොදවමින් 10, 11 ශ්‍රේණි දෙකේදී ම ක්‍රියාකාරකම්වල නිරත කළ යුතුය.

- ★ පැරණි ගද්‍ය සාහිත්‍ය පාඩම් සිසුන් ලවා කියවීම හා කියවීමෙන් අවබෝධය ලබා ගැනීමට අවස්ථාව ලැබෙන පරිදි අභ්‍යාස සැලසුම් කළ යුතුය.

- ★ රචනා ලිවීමේදී ව්‍යුහගත රචනාවක් යනු කුමක් දැයි පැහැදිලි කර, අ.පො.ස.(සා.පෙළ) විභාගයේදී එවන් රචනාවකට ලකුණු ලැබෙන පිළිවෙළ හා ලකුණු ලබා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රමවේදය පිළිබඳව 10 වන ශ්‍රේණියේදී ම මඟ පෙන්වීම කළ යුතුය.

- ★ ප්‍රායෝගික ලේඛන ලිවීමේදී ඒ ඒ ලේඛනවල වෙනස හඳුන්වා දී ආකෘතියේ වෙනස්කම් සිසුන්ට පැහැදිලි කර දිය යුතුය.

- ★ සාහිත්‍ය පෙළපොතෙහි ඇතුළත් පාඩම් රසාස්වාදය සඳහා ඉඩප්‍රස්ථා ලැබෙන පරිදි හැකි සෑම විට ම නාට්‍යානුසාරයෙන් ඉගැන්වීමට සුදුසු ඉගෙනුම්-ඉගැන්වීම් අවස්ථා සංවිධානය කරගත යුතුය.

- ★ ව්‍යාකරණ ඉගැන්වීමේදී, කවිය, ගීතය හා ප්‍රායෝගික ජීවිතය ඇසුරින් නිදර්ශන සපයමින් රසවත් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම ගුරුවරුන් විසින් නිර්මාණය කරගත යුතුය.

- ★ කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය පිළිබඳ සිසුන්ගේ අවබෝධය සතුටුදායක නොවන බැවින් සරු ඉගැන්වීම් ක්‍රම මගින් භාවිත හැකියාව නැංවීමට පියවර ගත යුතුය.

- ★ සමානාර්ථ, විරුද්ධාර්ථ හා බහුඅර්ථ පද ඇතුළු වාක් කෝෂය සංවර්ධනය සඳහා උපකාර වන සරල අභ්‍යාසවල නිතර යෙදීමට අවස්ථා සම්පාදනය කළ යුතුය.

- ★ අක්ෂර වින්‍යාසය බොහෝ විට වැරදි ලෙස භාවිත කෙරෙන වචන තෝරා ගෙන ඒවා නිවැරදිව භාවිත කිරීම සඳහා සතතාභ්‍යාස කළ යුතුය.

- ★ බාහිර පොත් පත් කියවීමට පෙලඹෙන පරිදි විෂය සමගාමී කටයුතු සංවිධානය කළ යුතුය.

- ★ පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට අමතර ව සිසුන් නිර්මාණකරණයෙහි යෙදවීමට ද උනන්දු විය යුතුය.

- ★ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමේදී අඩු සාධන මට්ටමක් සහිත සිසුන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය.

- ★ අත් පත්‍රිකා, රාජකාරි ලිපි ඇතුළු ලේඛන කුසලතා ප්‍රවර්ධනය සඳහා ප්‍රායෝගික ලේඛන අත්දැකීම් සිසුනට ලබාදීමට ක්‍රියා කළ යුතුය.

- ★ වාර විභාග ලකුණු පදනම් කර ගනිමින් සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයය සමත් වීමේ ලකුණු සීමාවට ආසන්න වී ඇති සිසුන් සඳහා කෙටි කාලීන ප්‍රතිකාරක වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතුය.

- ★ සංවේදී භාවයෙන් හා රසඥතාවෙන් පිරිපුන් රසිකයකු බිහි කිරීමෙහිලා සාහිත්‍යයෙන් සිදුවනුයේ අපමණ මෙහෙයකි. එවන් පුද්ගලයින් සමාජයට මහඟු සම්පතකි. සමාජය මිනිස්කමින් පුරවන්නට නම් සාහිත්‍යය කෙරෙහි වඩාත් හොඳින් සිසුන් යොමු කරවීම කාලීන අවශ්‍යතාවකි. මේ පිළිබඳ ගුරු භවතුන් ඇතුළු අදාළ බලධාරීන්ගේ අවධානය යොමු විය යුතුය.

## III ප්‍රශ්න පත්‍රය

2.3.1 III ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 02 යි. මුළු ලකුණු 80 කි.

සිංහල භාෂාව හා සාහිත්‍යය III ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 7කින් සමන්විතය.
මෙහි 1, 2, 3, 4 ප්‍රශ්න අනිවාර්ය වේ.

නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳව අපේක්ෂකයින්ගේ අවබෝධය විචාරාත්මක හා තර්කානුකූල දැනුම, භාෂා ඥානය, සාහිත්‍යාවබෝධය හා රසවින්දන හැකියාව පරීක්ෂා කෙරෙන පළමු ප්‍රශ්නය සඳහා අනුකොටස් දහයක් ඇතුළත් වේ. එක් අනු ප්‍රශ්නයක එක් කොටසකට ලකුණු 1 බැගින් මුළු ලකුණු 20කි.

නිර්දිෂ්ට සාහිත්‍යය ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම කෙරෙයි.

දෙවන ප්‍රශ්නය යොමු වන්නේ නිර්දිෂ්ට ග්‍රන්ථවල යෙදූ භාෂාවේ අර්ථාවබෝධය පිළිබඳ අපේක්ෂකයින් සතු දැනුම පරීක්ෂා කිරීමටයි. මෙහිදී නිර්දිෂ්ට පාඨ හතරක් ලබාදෙන අතර ඒ පාඨ හතරෙහි තද කළු වචන අට සඳහා වචන වල අරුත් ලියා අනතුරුව සමස්ත පාඨවල අර්ථය තම බසින් ලියා දැක්වීම කළ යුතුය. මේ සඳහා එක් කොටසකට ලකුණු 5 බැගින් ලකුණු විස්සකි.

3-4 ප්‍රශ්න නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ අපේක්ෂකයින්ගේ විශ්ලේෂණාත්මක දැනුම පරීක්ෂා කිරීම අපේක්ෂාවයි. මෙහිදී "නැතහොත්" යන්නෙන් දරුවාට විකල්ප ප්‍රශ්නයක් තෝරා ගැනීමට හැකියාව ඇත.

3, 4 ප්‍රශ්න දෙකේම මේ ලෙසින් විකල්ප ප්‍රශ්න තෝරා ගත හැකිය මේ සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් ලබාදේ.

5, 6, 7 ප්‍රශ්නවලින් අපේක්ෂකයින්ගේ පිළිතුරු සැපයිය යුත්තේ එකකට පමණි. මෙම අභිමතාර්ථය වනුයේ නිර්දිෂ්ට ග්‍රන්ථ ආශ්‍රිතව අපේක්ෂකයින් තුළ පවත්නා විශ්ලේෂණාත්මක, විචාරාත්මක, තර්කානුකූල දැනුම හා රසඥතාව මැන බැලීමයි. මේ සඳහා ලකුණු 10ක් වෙන් කර ඇත.

සිංහල භාෂාව හා සාහිත්‍යය
III පත්‍රයේ 2, 3, 4 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම අනිවාර්ය වූ අතර එහි 2 වන ප්‍රශ්නය සඳහා පහසුතාව 49%කි.

3 වන ප්‍රශ්නය කොටස් 2කින් සමන්විත වූ අතර වැඩිම පහසුතාව 76%ක් ලබාගෙන ඇත්තේ 3 වන ප්‍රශ්නයේ II කොටසට වේ. එහි I කොටසට පහසුතාව 63%කි. එය 3, 4 ප්‍රශ්නවල අඩුම පහසුතාවය වේ.

4 වන ප්‍රශ්නය ද කොටස් දෙකකින් යුක්ත වන අතර II කොටසේ පහසුත්ව 68%ක් වන විට I කොටසේ පහසුතාව 64%කි.

5, 6, 7 ප්‍රශ්න අපේක්ෂක තෝරා ගැනීමේ මත සැකසුණකි. මෙහිදී වැඩිම පහසුතාව 68% ලබාගෙන ඇත්තේ 6 වන ප්‍රශ්නයට වේ. දුෂ්කරම පහසුතාව 48%ක් වූ අතර එය 5 වන ප්‍රශ්නය සඳහා ලබා ගෙන තිබුණි.

සමස්තයක් ලෙස බැලූ විට බොහෝ අපේක්ෂකයින්ගේ සිත්ගත් ප්‍රශ්නය බවට පත්ව ඇත්තේ "වැස්ස" පද්‍ය නිර්මාණය වූ බව පැහැදිලි වන අතර අඩුම පහසුතාව ලබාගත් "අපටත් දවසක ඉර පායාදෝ" කෙටි කතාව ආශ්‍රිත ශිෂ්‍ය රුචිකත්වය හා රස වින්දනය කෙරේ ඇති මට්ටම පැහැදිලි වේ.